ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2014 ක් වූ නොවැම්බර් 23 ඉරිදා 149 වෙළුම 26 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය



## 2015 නත්තල් කලාපය පිළිබඳවයි

ඥානාර්ථ ප්‍රදීපය මෙවර නත්තල් කලාපය දෙසැ. 21 ඉරුදින නිකුත් වන බැවින් ඔබේ නිර්මාණ දෙසැ. මස 08 වන දිනට පෙර "ඥානාර්ථ ප්‍රදීපය" වෙත යොමු කරන්න.

නත්තල් නිර්මාණ කරණයේදී මෙවර වැඩි ඉඩක් ආධ්‍යාත්මිකව ගොඩනංවන කිතුනු පවුල කෙරෙහි හා පැවිදි දිවිය කෙරෙහි බැඳුනු ගුණාත්මක ලිපිවලට ලැබෙන බවද කරුණාවෙන් සලකන්න.

- සංස්කාරක පියතුමා -

## ගරු ජෝශප් පෙරේරා පියතුමා සගසුව දිනයි

එච්. ඒ. කල්දේරා විසිනි



අගරදගුරු පදවියේ මීසම් ගණනාවක සේවය කළ ගරු ජෝශප් පෙරේරා පියතුමා ඉකුත් සිකුරාදා දින ස්වර්ගස්ථ විය.

ජා-ඇල කනුවන මීසම ගොඩනගා නව දෙව්මැඳුරක් ඉදිකිරීමට ද එතුමන් ගත් අප්‍රතිහත ධෛර්යය පිළිබඳව අදද එම මීසමේ ජනතාව ගෞරවාන්විතව සිහිපත් කරති.

වත්තල, මාබෝල, මීසම් පුත්‍රයකු වන එතුමා ජ්‍යෙෂ්ඨ පියතුමකු සේ මුළු මහත් පදවියට පෙන් වූ හොඳ හිත ද බහුතර පියතුමන්ගේ ප්‍රශංසාවට ඉමහත් සේ ලක් විය. ඉකුත් සෙනසුරාදා සවස ජා-ඇල කණුවන සා. ජෝශප් දෙව්මැඳුරේ පැවති අවමංගල්‍ය මෙහෙයෙන් පසුව දෙව්මැඳුරු පරිශ්‍රයේදීම එතුමන් මිහිදන් කැරිණි.

ගරු ජෝශප් පෙරේරා පියතුමන්ගේ ආත්මයට මොක් සුව පතා දෙවිඳුන් යදින්නැයි ප්‍රදීපය පාඨක ලේඛක සැමගෙන් ඉල්ලා සිටී.

# අති උතුම් ප්‍රැන්සිස් විශ්ව එඬේරාණන්ගේ ශ්‍රී ලංකා ගමන අරබයා චක්‍ර ලේඛයක් නිකුත් වේ

## ගෞරවනීය පූජක හා පැවිදි උතුමන් මඟින් සැදැහැවත් ජනතාව දැනුම්වත් කිරීම එහි මූලික අරමුණ බව කාදිනල් හිමිපාණෝ ප්‍රකාශ කරති

- ගාලු මුවදොර පැවැත්වෙන අති සුවිශේෂ දිව්‍ය යාගයට ලක්ෂ සංඛ්‍යාත අයුරින් සම්බන්ධ වන්නට ආරාධනා!
- දිව්‍ය යාගයට පෙර ජනතාව හමුවට පාප් වහන්සේ පැමිණෙනවා
- මීසම් දහම් සේවා සභා හා අනෙකුත් දයාවේ සංවිධාන මූලිකත්වය ගත යුතු බව අවධාරණය කරයි
- සියලු රථවාහන වලට ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ
- අපෝස්තලික සේවා ගිහි නායකයින් තමන්ගේ ධජ සමඟ පැමිණිය යුතුයි
- වාහන සඳහා අවැසි බලපත්‍ර කලාපීය නාහිමිපාණන් වෙතින් හෝ අති උතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිමි කාර්යාලයෙන් ලබා ගත හැකිය
- පහසුකම් සපයන සියලු කටයුතු දැනටමත් දියත්කොට හමාරයි
- "සුදුතුම් පිය ගමන" සංවිධායක කමිටුවක් සෑම මීසමකම ආරම්භ කෙරුමට මීසම් සේවක පියතුමා මුල් විය යුතුයි
- විශාල ප්‍රමාණයේ රූපවාහිනි තිර තුළින් පාප් තුමන් දැක ගැනීමට විශේෂ අවකාශ
- "සුදුතුම් පිය ගමන" මූල්‍ය කමිටුවට සැමගේ ආධාරය නොමසුරුව ඕනෑ

## අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ශ්‍රී ලංකා අපෝස්තලික සංචාරය 2015 ජනවාරි 12-15

### වැඩසටහන් පෙළගැස්ම

**2015 ජනවාරි 12 වැනි සඳුදා**

| | | |
|---|---|---|
| 19.00 | - | රෝමයේ ෆියුම්චිනෝ ගුවන් තොටුපළින් කොළඹ බලා පිටත්වීම |

**2015 ජනවාරි 13 අඟහරුවාදා**

| | | |
|---|---|---|
| 09.00 | - | කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට ළඟා වීම |
| 13:15 | - | ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ල හමුවීම, කොළඹ අගරදගුරු මැදුරේදී |
| 17:00 | - | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමන් සමඟ විශේෂ හමුව, ජනාධිපති මැදුරේදී |
| 18:15 | - | අන්තර් ආගමික නායක හමුව, කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාවේදී (BMICH) |

**2015 ජනවාරි 14 බදාදා**

| | | |
|---|---|---|
| 08:30 | - | දිව්‍ය පූජා යාගය සහ භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් ශුද්ධවරයට එසැවීම, කොළඹ ගාලු මුවදොර පිටියේදී |
| 14:00 | - | මරදු මඩු සිද්ධස්ථානය කරා පිටත්වීම |
| 15:30 | - | දේව මාතාවන්ට කෙරෙන යාච්ඤා මෙහෙය, මරදු මඩු ජපමාල දේවමාතා සිද්ධස්ථානයේ දී |
| 16:45 | - | කොළඹ බලා පිටත්වීම |

**2015 ජනවාරි 15 බ්‍රහස්පතින්දා**

| | | |
|---|---|---|
| 08:15 | - | බෝලවලාන "සොලොස්වන බෙනඩික්ට් සුදුතුම් පිය සංස්කෘතික ආයතනයේ දෙව්මැදුරට" සැපත් වීම. |
| 08:45 | - | සමුගැනීමේ උත්සවය, කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දී |
| 09.00 | - | කොළඹ සිට මැනිලාව බලා පිටත්වීම |

**ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා**
**අධ්‍යක්ෂ - සුදුතුම්පිය ලංකා ගමනේ තොරතුරු හා මාධ්‍ය කාර්යංශය**



සසුන් පිය ලංකා ගමන 2015

## මඩු දේවස්ථානයේදී වැඩි ඉඩකඩ උතුරු නැගෙනහිර ජනතාවටයි

මඩු සිද්ධස්ථානයේ පැවැත්වෙන මෙහෙයට උතුරු මැද හා උතුරු පළාත්වල ජනතාවට වැඩි ඉඩකඩක් ලබා දිය යුතු නිසා අනෙක් පළාත්වලින් පැමිණ ඒ ඉඩකඩ අවුරා නොදමන ලෙස ගිහි සංවිධාන ආයාචනයක් කරයි.

අනෙක් පළාත් වල සැදැහැවත් ජනතාවට ප්‍රමාණයටත් වඩා ඒ ඉඩ කඩ කොළඹදී උදා කරගත හැකි බැවින් උතුරේ ජනතාවට කල් ඇතිව පැමිණ මඩු කඳවුරේ කඳවුරු බැඳගන්නට ඉඩ ලබා දිය යුතු බවද ඒ සංවිධාන සිහි කැඳවීමක් කරයි.

---

## පමුණුගම - මීගමුව පාරෙන් සුදුතුම් පියතුමා ගුවන් තොටුපල කරා වැඩම කරයි?

දහසය වන බෙනඩික්ට් සංස්කෘතික, අධ්‍යාපනික ආසියා දේව ධර්ම ශාස්ත්‍රාලයේ දෙව්මැඳුර ආසිරි ගැන්වීමේ මොහොත උන්වහන්සේ දිවයිනෙන් බැහැර වීමට පෙර ඉටු කරන අවසන් කටයුත්ත නිසා එය ඉටුකිරීමට කොළඹ - කටුනායක අධිවේගයේ ජා-ඇල පිවිසුම තෙක් ගමන් කොට ඉන්පසුව දැලතුර පාලමෙන් එගොඩ බෝපිටිය - පමුණුගම හරහා මුන්නක්කරයද පසුකොට මීගමුව හරහා බෝලවලාන තෙක් ගමන් කිරීමට ඉඩ ඇති බව ආරංචි මාර්ග සඳහන් කරයි.

එසේ වුවහොත් පමුණුගම, කැපුන්ගොඩ, දුන්ගාල්පිටිය, තලාහේන, පිටිපන හා මුන්නක්කරය දේවස්ථාන එතුමාණන්ගේ ඇස ගැසීමට හසුව ආසිරි ගැන්වෙනු ඇත.

මීගමුව ලෙල්ලමදී එතුමන්ගේ ආශිර්වාදය හිමිවන නිසා ධීවරයනට මෙය අසිරිමත් අවස්ථාවක් වනු ඇත. මීගමුව, පුංචි රෝමය තුළ එතුමාණන් නොමැකෙන සිහිවටනයක් ද තබනු ඇත.

පදවියෙන් පදවියට

# දකුණේ සුනාමි විපත් පත් පවුල් 32 කට කෝටි 7 කට වැඩි මුදලින් සෙඩ්ගෝල් නිවහන්!

**2004 දෙසැම්බර් 26 වන දින සිදුවූ සුනාමි ඛේදවාචකය හේතුවෙන් දකුණු පළාත තුළ අවතැන් ජනතාව නගාසිටුවීම සඳහා දකුණු පළාත් කතෝලික සභාවේ සමාජ හා ආර්ථික අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය වන කරිටාස් සෙඩ්ගෝල් ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද සුනාමි සහන පුනරුත්ථාන හා සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස අහිමිවූ ජනතාවට ස්ථිර නිවාස ලබා දීමේදී ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් කලූපේ නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ලාභින් 32 වෙත නිවාස හිමිකම් ඔප්පු ප්‍රදානය ගාලූ රදගුරු අති උතුම් රේමන්ඩ් කිංස්ලි වික්‍රමසිංහ හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් කලූපේ නිවාස යෝජනා ක්‍රමයේදී සිදු කරන ලදි.**



ඒ අනුව රු. කෝටි 07 ට වැඩි මූල්‍ය ප්‍රතිපාදනයන් වැයකර ඉදිකරන ලද මෙම නිවාස යෝජනා ප්‍රතිලාභින් වෙත හිමිකම් ඔප්පු ලබාදීමේ මෙම චාම් උත්සව සභාව සඳහා කලූපේ බෝධිරුක්ඛාරාම විහාරාධිපති පූජ්‍යපාද රතනධම්ම හිමිපාණන් හික්කඩුව ප්‍රාදේශිය සභාවේ සභාපති මනෝජ් මෙන්ඩිස්, දිස්ත්‍රික් ආපදා කළමණාකරන ඒකකයේ නියෝජිතයන් හා කලූපේ ග්‍රාම නිළධාරි මහතාද සහභාගි විය. මේ අවස්ථාව සංවිධානය කළේ සෙඩ්ගෝල් අධ්‍යක්ෂ ගරු මයිකල් රාජේන්‍ද්‍රම් පියතුමාය.

**එච්.ඩී.ඒ. පෙරේරා**

## මරිය වසර රත්මලානේ සමරයි

මරිය වසර නිමිත්තෙන් රත්මලාන සා. ජෝසප් දේවස්ථානයේදී දේවමාතාවන්ට තුතිපිදීමේ දිව්‍ය පූජා යාගයක් පැවැත්වින.

මීසම් සේවක ගරු රොනි වික්‍රමසිංහ පියතුමාගේ අතින් දේවමාතා ආශිර්වාදය ලබා ගැනීමට ගම්වාසින් පැවිදි සොයුරියන් රැසක් උත්සුක වූහ.

**ප්‍රේමා හීනටිගල**

## සෙත්සරණ කරිටාස් සේවාවට බොදුනු හිමිනම ප්‍රශංසා කරයි



ජාති, ආගම්, කුල, ගෝත්‍ර තුළ මිනිසුන් භේද භින්න වෙලා. දිනෙන් දින සමාජය සෝදා පාළුවකට ගමන් කරනවා. ජාතියද, ආගමද නොවේ වැදගත්වන්නේ ආගමික ශාස්තෘවරු මනුෂ්‍යත්වය ගැනයි උගන්වා ඇත්තේ. මනුෂයා ගමන් කළ යුත්තේ ආලෝකය වෙතටයි. ඒ ආලෝකය තුළ ආලෝකමත් විය යුත්තේ මිනිස් චින්තනයයි. එකී චින්තනය පුබුදු කරවීමට ජාති, ආගම්, කුල භේදයන්ගෙන් තොරව ජනතාවට මඟ පෙන්වන සෙත්සරණ කරිටාස් ආයතනයේ සේවාව සැමදා තමන් වහන්සේගේ ප්‍රශංසාවට භාජනය වන බව මොරටුවැල්ල බෞද්ධ මධ්‍යස්ථානාධිපති පූජ්‍ය පල්ලේවල විමලධජ ස්වාමින් වහන්සේ පැවසූහ.

සෙත්සරණ කරිටාස් ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ සර්ව ආගමික වැඩසටහනට සහභාගි වෙමින් එතුමෝ එසේ පැවසූහ. මේ වැඩ සටහන මොරටුව ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරට අයත් දහම් පාසල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මේ උලෙළ අමතා මොරටුව සහයක සේවක ගරු නිලන්ත එදිරිවික්‍රම පියතුමාද, බ්‍රහක්මක් ශ්‍රී ලක්ෂ්මි කාන්ත ජෙගදීස්වර කුරුක්කල් තුමාද අදහස් දැක්වූහ. සෙත්සරණ ව්‍යාපෘති සම්බන්ධිකාරිකා රසිකා සුරවීර මෙනවිය සෙත්සරණ අරමුණ පැහැදිලි කළාය.

**ප්‍රදීප් සුරවීර**

## කොළඹ අගරදගුරු පදවි ක්‍රි. ප. ව්‍යාපාරයේ 33 වන සංවත්සර උලෙළ



ශ්‍රී ලංකා ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ (කොළඹ අගරදගුරු පදවිය) 33 වන සංවත්සර උලෙළ පසුගියදා කොළඹ 11, 6 වන පාවුළු මධ්‍යස්ථානයේ දී නි.ම.නි දේව කැඳවීම් අධ්‍යක්ෂ ගරු එමාඩ් දල්පතාදු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා කොළඹ පදවි උපාධ්‍ය ගරු නිලන්ත හේෂාන් ප්‍රනාන්දු පියතුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

"සමාව දෙමින් එකමුතු වී පවුල ගොඩනඟමු" යන්න මෙහි තේමාව වූ අතර ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි පියතුමා තේමා දේශනය පැවැත්වීය. සභාපති හෙක්ටර් සහ දයානි පීරිස් යුවල උත්සව සභාව මෙහෙයවූ අතර වැඩබලන ලේකම් ඩික්සන් සහ අයිරාංගනී ඇන්ටනි යුවළ ප්‍රගති වාර්තාව ඉදිරිපත් කළහ.

පදවි නිලවරණය මෙහිදී පැවැති අතර ඉදිරියේ ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පවුල් හා පැවිදි වර්ෂය තුළ ව්‍යාපාරයට විශේෂ වගකීම් පැවරී ඇති හෙයින් ඒකමතික තීරණය මත හෙක්ටර්+දයානි පීරිස්, ඩික්සන්+අයිරාංගනී, ඇන්ටනි හා ජානක+රසිකා සිල්වා යුවළ යළි සභාපති, ලේකම්, භාණ්ඩාගාරික තනතුරු වලට පත් කෙරිණි. උප සභාපති නිමල්+චන්දිමා යුවළ, සම ලේකම් අරෝෂ්+සඳමාලි යුවළ පත්වූහ. බෙනඩික්+ඇනස්ටා, සුසිල්+ශිරාණි, විවියන්+රමණි, ස්ටැන්ලි+ජසින්තා, හෙන්රි+කාමන්, නෙල්සන්+බර්නි යන යුවළ වලින් සමන්විත උපදේශක සභාවක් අභිනවයෙන් පත්කැර ගැණිනි.

**සටහන - සී. ආර්. ඩික්සන් ඇන්ටනි; සේයා - ප්‍රියන්ත මෙන්ඩිස්**

## ගොඩැල්ල තරුණ තරුණියන්ට රදගුරු හිමි හමුවකට ඇරියුම්!

හලාවත පදවියේ තරුණ වසර අර්ථගැන්වීමේ අරමුණින් හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රීත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් මීසම් මට්ටමින් තරුණ තරුණියන් හමුවෙමින් යන ගමනේ ගොඩැල්ල මීසමේ තරුණ තරුණියන් හමුවීම නොවැම්බර් 30 ඉරුදින පෙ.ව. 8.30 ට මෝරුක්කුලිය දෙව්මැඳුරේදී පැවැත්වේ.

එදින ගොඩැල්ල මීසමේ යොවුන් දූ පුතුන්ට රදගුරු හිමිපාණන් අභිවෘද්ධි ආලේපය දානය කිරීමෙන් අනතුරුව මේ හමුව පැවැත්වෙන අතර ගොඩැල්ල මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් සහයක ගරු නුවන් එමල්ක පියතුමන් හා එක්ව මෙය සංවිධානය කර ඇත.

**ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**



**මහනුවර පදවියේ ගරු ප්‍රසන්න වර්ණකුලසූරිය පියතුමාගේ 25 වසරක පූජක රජත ජයන්තිය නිමිත්තෙන් මීගමුව සාන්ත පීතර දෙව්මැඳුර්දී දෙවිඳුන්ට තුති පිදීමේ දිව්‍ය පූජාවක් පැවැත්විණි. මීගමුව සාන්ත පීතර මීසම් සේවක ගරු ලියෝ කැමිලස් හෙට්ටිආරච්චි පියතුමා ඇතුළු පියවරුන් එම පියතුමාව (දකුණේ සිට තුන්වැන්නා) දේවස්ථානය වෙත කැඳවාගෙන ආ අයුරු.**

**රේමන් අපොන්සු**

## පැල්ලන්දෙනියට නව ලූර්දු ගුහාවක්!

පැල්ලන්දෙනිය සා. අන්තෝනි පුදබිමේ අභිනවයෙන් ඉදිකරන ලද ලූර්දු ගුහාව මංගල සන්ධ්‍යා මෙහෙයේදී කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන් විසින් විවෘත කරන ලදි.

සර්ව රාත්‍රික ජපමාල මෙහෙයන් සිදුකෙරිනි. මෙහිදී ගරු ජීවන්ත පිරිස්, ගරු සුමේධ ජානක, ගරු ගෝමි දිවාකර පියතුමන් විසින් මෙහෙයන් පැවැත්විණ. මව, පියා, තරුණ, තරුණියන් තේමා කරගත් 15 පංති ජපමාල මෙහෙය ඉතා අර්ථවත් විය. ඉරුදින දිව්‍ය පූජාවෙන් පසු පැල්ලන්දෙනිය පුද බිමෙන් හමුවූ ඓතිහාසික සත්කෝරලේ දේවමාතා ප්‍රතිමාවෙන් සැදැහැවතුන් ආසිරි ගන්වා මෙහෙය අවසන් කෙරිනි. මීසම් සේවක ගරු චන්දන හපුආරච්චි පියතුමාගේ මෙහෙය වීම මත මීසම් සංඝය විසින් මෙය සංවිධානය කරන ලදි.

**ප්‍රේමලතා ප්‍රනාන්දු**



**සාන්ත වින්සන් ද පාවුලු සමිති ජාතික කවුන්සලයේ සංවත්සර මහා සභාව හා මංගල දිව්‍ය පූජාව පිටකොටුව සවන පාවුලු මධ්‍යස්ථානයේදී ජාතික ගිහි කොමිසමේ සභාපති අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වින. මෙවර ආරාධිත දේශනය සඳහා ජාත්‍යන්තර සාන්ත වින්සන් පාවුලු සංගමය දකුණු ආසියා කලාපීය උප සභාපති පාන්ඩියන් මහතා ශ්‍රී ලංකාවට සැපත්වූ අතර එතුමා දේශනය පැවැත්වූ අයුරු.**

**තියබෝල්ඩ් සමරතුංග**

## පූජාසනයට රැගෙන ආ යුත්තේ අන් අය හා බෙදාහදා ගත හැකිදේ

කිතුනු ජීවිතය අර්ථවත් වන්නේ බෙදාගැනීමෙනි. පූජාසනය වෙත ගෙන ආ යුත්තේ සහෝදරයා සමග එකමුතුව බෙදාගත හැකි දෙයකි. අද දිනයේවත් මතක තබාගන්න පූජාසනය වෙත ඔප්පු කළ යුතු දෙය කුමක් ද කියා. හපුතලේ සා. එමාර්ඩ් දෙව්සත්හලේ අදියුරු ගරු යොහාන් ප්‍රනාන්දු පියතුමා බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුරේ වාර්ෂික මංගල්ල සන්ධ්‍යා මෙහෙයේදී පැවසීය.

ගරු පියතුමා සිංහල සහ දමිළ බසින් තම දේශනය පැවැත්වූ අතර දෙව්මව් උදාන ගී සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවීමෙන් සන්ධ්‍යා මෙහෙය අවසන් විය.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**

## සිරිලකට වැඩි සුදුතුම් පියතුමෝ

### අද පටන් සතිපතා ගුවන් විදුලියෙන්

මෙරටට වැඩම කළ අතිඋතුම් සවැනි පාවුළු හා දෙවන ජුවාම් පාවුළු හිමිපාණන් මෙරටදී සිදුකළ මෙහෙයන් හා චාරිකාවන් අලළා විකාශනය වූ ගුවන් විදුලි වැඩසටහන් ආශ්‍රිතව නව වැඩසටහන් මාලාවක් සතිපතා විකාශනය කිරීමට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය කටයුතු යොදා ඇත. එහි ආරම්භක වැඩසටහන නොවැම්බර් 23 ඉරිදා පෙ.ව. 11.15 සිට 11.30 දක්වා විකාශනය වන අතර ඉන්පසු සතිපතා මෙම වැඩසටහනට සවන්දීමට ශ්‍රාවකයනට අවස්ථාව ලැබේ. නිෂ්පාදනය ජූඩ් අයිවන්.

## උල්හිටියාව මරණාධාර සමිතියෙන් වන්දනා චාරිකාවක්

45 වන සංවත්සරය සැමරූ උල්හිටියාව මීසමේ පැරණිම සමිතිය වන මරණාධාර සමිතියේ සාමාජික සාමාජිකාවෝ මෙවර සිය වාර්ෂික වන්දනා චාරිකාව මාතර අප ස්වාමිදුවගේ සිද්ධස්ථානයට යොදාගත්හ.

උල්හිටියාව මීසම් සේවක ගරු බෙනට් ශාන්ත සහ හලාවත පදවි විසෙන්තිද පාවුලා සමිති අධ්‍යක්ෂ ගරු ක්වින්ටස් ප්‍රනාන්දු පියතුමන්ද චාරිකාවට එක්විය.

**ගොඩ්ප්‍රි ගාල්ලගේ**



**තලංගම මීසමේ කිතුනු ඒකක මට්ටමින් දේව මාතා ප්‍රතිමා වැඩමකර එම ප්‍රතිමා දේවස්ථානය වෙත රැගෙන විත් එතුමිය වෙනුවෙන් මංගල්‍ය දිව්‍ය පූජාවක් තලංගම මීසම් සේවක ගරු සංජීව මෙන්ඩිස් පියතුමා පැවැත් විය. මීසමට පැමිණි නවක තේවාචාර්ය ගරු එරංග ද සිල්වා සහෝදර තුමා ඊට සහාය විය.**

**ධනුෂ්ක ඇන්ජලෝ**

## වෙන්නප්පුවේ නත්තල් කලාපයක්

වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙන්නප්පුව දිසාවේ දේවස්ථාන හතලිහක් සමග සම්බන්ධව සංවිධානය කරන නත්තල් කලාපය දෙසැම්බර් 17,18,19 යන තෙදින තුළ වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථාන භූමියේදී පැවැත්වේ.

නත්තල් කැරොල්, නත්තල් නාට්‍යය, ගවලෙන තරග ආදි විවිධ ඉසව් රැසක් මෙහි පැවැත්වෙන අතර එම තරග සඳහා ඉල්ලුම් පත්‍ර වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

**ප්‍රියන්ත පීටර්ස්**

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com
ක්‍රිස්තු වර්ෂ 2014 නොවැම්බර් 23 ඉරිදා

# වියපත් වන පියතුමන්ලා පිළිබඳවයි මේ...

ඉදිරි වසර පහ තුළ මේ දිවයින තුළ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංඛ්‍යාවේ ශීඝ්‍ර ඉහළ යෑමක් සිදුවිය හැකි බව දැනටමත් විවිධ සංඛ්‍යා ලේඛන පෙන්නුම් කර ඇත. කාලයක් පුරා තම ශ්‍රමය, සේවය, දිවිය කැපකොට දේශය, ජනතාව, සමාජය, පවුල ගොඩනඟන්නට වෙහෙස මහන්සි වූ, ඒ ජනතාව සඳහා - වියපත් වන ඒ ජනතාව සඳහා විධිමත් වැඩ පිළිවෙලක් දැන් දැන් සිටම තිබිය යුතු බවට නැගෙන හඬ ශබ්දයේද අඩුවක් නොමැති තරම්ය. එය එසේම විය යුත්තකි. වියපත් තම මව පියා රැකීම දරුවන්ගේ යුතුකමකි. සෞඛ්‍ය සම්පන්නව ජීවිතය අත් විඳීමට ඔවුනට මඟක් සලසා දීම රජය සතු යුතුකමකි. ආදරය, කරුණාව, දයාව හා පිළිගැනීම දැක්වීම පොදුවේ කාගේත් යුතුකමකි, වගකීමකි.

පුළුල් සමාජ තලයේ එවන් වටපිටාවක් සැකසෙද්දි හා ඒ පිළිබඳව හඬක් නැඟ එද්දි ඒ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ, ඒ වියපත් ජනතාවගේ කිට්ටු ඥාතිවරුන් ඒ පිළිබඳව විමසිලිමත් වන බවටත් අවිශ්වාසයක් නැත. මන්ද ඔවුන් හා බැඳෙන සමීපතම බන්ධු මිත්‍ර ඥාතීන් කොහොමින් කොහොම හෝ ඒ යුතුකම් තවමත් අප රටේ සිදු කරන බව අපටත් පැහැදිලිව පෙනෙන බැවිනි.

මේ හා සමානවම සමාජයේ තවත් කොට්ඨාශයක් වියපත් බවට පත් වෙමින් සංඛ්‍යාත්මකව ඔවුන්ගේ ප්‍රමාණය ඉහළ ගොස් ඇති බවක් ද සමීක්ෂණ වාර්තාවකින් අගරදගුරු පදවියේ දේව කැඳවීම් කාර්යාංශය පසුගියදාවක ඉදිරිපත් කොට තිබුණි.

ඒ වියපත් වන පූජක සංඛ්‍යාව පිළිබඳවයි. ශ්‍රී ලංකාවේ වෙසෙන ජ්‍යෙෂ්ඨ පියතුමන්ලා පිළිබඳවයි. කතෝලික සභාවේ ශාසන නීති සංග්‍රහයට අනුව වයස 75 සපිරුණු පූජක තුමෙක් අනිවාර්යයෙන්ම විශ්‍රාම යා යුතුයි. අදාළ පදවියේ රදගුරු තුමන්ගේ විශේෂ අනුමතියක් ඇතිව ඊට පසුව තමන් නිරෝගි නම් පියතුමකුට ක්‍රියාකාරි සේවාවේ නිරත විය හැකි බවටද යම් මතයක් අප සමාජයේ ගොඩනැගී තිබූ බවද රහසක් නොවේ. එය එසේ සිදුවූයේ මෑත අතීතය තුළ වියපත් පූජක පිරිස සංඛ්‍යාත්මකව එතරම් ඉහළ ගොස් නොතිබූ නිසාවෙන්මයි. නමුත් දැන් තත්ත්වය වෙනස් වෙමින් පවතී.

ඉදිරි වසර දහය ඇතුළත කොළඹ අගරදගුරු පදවිය තුළ පමණක් මේ ජ්‍යෙෂ්ඨ පියතුමන් සංඛ්‍යාව ඉතාමත් ඉහළ අගයක් ගනු ඇත. දැන් දැන් සිටම මෙයට විකල්ප තිබිය යුතු බව කාගේත් මතයයි.

වසර ගණනාවක් තම දිවිය, සේවය, කාලය අන් අය වෙනුවෙන් කැපකර ඇගැයීමකට පවා බොහෝ විට ලක් නොවී පිබිදුනු ආධ්‍යාත්මිකත්වයකින් තම තාරුණ්‍යය හා වැඩිහිටි දිවිය එලෙස පුද කළත්, සේවය ඉටු කළ නොහැකි තත්ත්වයට හෝ විශ්‍රාම දිවියකට පත්වන පියතුමකුගේ මානසික තත්ත්වය කෙබඳු වේද යන්න පොදුවේ ගිහි ජනතාවත් කල්පනාවට ගත යුත්තක් බව මෙහිදි සිහිපත් කරන්නෙමු. තනිකම දැඩිව දැනෙන්නේ ඒ අවධිය තුළ නොවේද? අසනීප තත්ත්වයේ පසුවන පියතුමෙක් නම් තදබල ලෙස මානසික කඩාවැටීමකටද එතුමන් පත්වීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇත. වියපත් භාවයට පත්වන විට තමන්ගේම ඥාතිවරුනට පවා එතුමන්ලාව සමහර විට මඟ හැරෙන්නටද අවකාශ ඇත. එය කාගේවත් වැරැද්දක් නොව සමාජ තලය සකස් වී ඇති රටාව නිසාම බවට අවබෝධ කර ගැනීම වටී.

ඉදින් ඉදිරි වසර කිහිපය තුළ අපේ පදවි වල මේ ජ්‍යෙෂ්ඨ පියතුමන්ලාගේ සංඛ්‍යාව ඉහළ යන්නේ නම් එතුමන්ලා වෙනුවෙන් පැහැදිලිවම වැඩ සටහනක් තිබිය යුතුයි. එය විවිධ පදවි තුළ ඉටුවන බව ප්‍රත්‍යක්ෂයි. නමුත් ඇගැයීමකටද ලක් නොවි තනිකම හා හුදකලාව තුළ අසරණවන පියතුමන් දකින අනිත් පියතුමන්ලා හට තමන් වියපත් වුවහොත් කුමක් සිදුවේද යන අනියත බියද ඇති නොවන්නේ යැයි කෙලෙස පවසනු හැකිද?

දැන් විවිධ යෝජනා ගොඩනැගෙමින් පවතී. ක්‍රියාකාරී පියතුමන් ඉන්නා මීසම් වල මේ වියපත් පියතුමන්ලා නැවතත් සහයක පියතුමන් ලෙස පත්වීම් ලැබිය යුතු බව එක් යෝජනාවකි. විශ්‍රාමික වයස 65 දක්වා අඩුකොට ක්‍රමානුකූලව මේ වියපත් බව පසක් කර ගන්නට එතුමන්ලාට අවකාශ සැලසිය යුතු බව තවත් මතයකි. නිදහස් සැඳෑ සමය ගත කරන්නට පූජක නිවස්නයන් තිබිය යුතු බව තවත් මතයකි.

කෙසේ වෙතත් තව අවුරුදු පහක් ඇතුලත අපේ පදවි තුළ මේ ජ්‍යෙෂ්ඨ පූජක සංඛ්‍යාවේ ඉහළ යාමක් අනිවාර්යයෙන්ම ඇති වන නිසා හා හැට පහේ සීමාව තුළ විශ්‍රාම යෑමට කැමැත්ත පල කරන පියතුමන්ගේ සංඛ්‍යාවද ඉහළ යෑමට ඉඩ ඇති නිසා දැන් දැන් සිටම ක්‍රමවත් වැඩ පිළිවෙලකට ගිහි ජනතා සහයෝගයද අවශ්‍ය බව මතක් කරන්නට කැමැත්තෙමු. ඔවුන් අවලංගු කාසි සේ ඉවත දමා පහසුවෙන් අතීතයක මතක ලෝකය අමතක කර දමන්නට උත්සහ කරනවාද? නැතිනම් ආධ්‍යාත්මිකව ඔවුනට ශක්තියක් වන්නට මීසම් මට්ටමේ යම් වැඩ පිළිවෙලකුත් සකස් කරනවාද යන්න සිතීමට තවමත් කාලය ප්‍රමාද නැත.

මෙය සරලව ගත හැකි කරුණක් බව බොහෝ දෙනෙක් සිතුවද අද වියපත්ව සිටින සමහර පියතුමන්ගේ යම් ශෝකාලාපයක් එහෙන් මෙහෙන් කාගේත් දෙසවන් වලට කොහොමින් හෝ වැටෙන නිසා දැනට වඩා පොදුවේ යම් ප්‍රායෝගික ක්‍රියාදාමයක් තිබිය යුතු බව අපිදු සද්භාවයෙන් අවධාරණය කරන්නෙමු.



# සුදුතුම් පියතුමන්ගේ රාජ්‍යතාන්ත්‍රිකභාවය

## සුදුතුම් පිය ලංකාගමන 2015 නිමිත්තෙනි

**ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා**

**පසුගිය සතියෙන්....**

**නමුත් කලින් කලට මෙය කාලයේ අවැසිතා අනුව හැඩ ගැසෙමින් පාප් නිලය ක්‍රම ක්‍රමයෙන් මධ්‍යගත වෙද්දි, එය ශුද්ධාසනය වශයෙන් හඳුන්වනු ලැබීය. 1870 දී පාප්තුමන් විසින් පාලනය කරන ලද ඉතාලි අර්ධද්වීපයේ භූමිභාගයන් ඉතාලි රජය විසින් අත්පත් කර ගැනීමේදී, පාප්තුමාගේ රාජ්‍ය බලය ක්‍රමයෙන් සීමාවුවත්, ශුද්ධාසනය ජාත්‍යන්තර සමාජය විසින් නිල පිළිගැනීමකට ලක්විය.**

එමගින් සෛවරී ජාත්‍යන්තර ස්වීයත්වය ඇති ආයතනයක් ලෙස ජාත්‍යන්තර නීතිය ඉදිරියේ ශුද්ධාසනය පෙනී සිටිම ආරම්භ විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධාසනයට විවිධ රටවල් හා ජාත්‍යන්තර ආයතන සමග තානාපති සබඳකම් ගොඩනගා ගැනීමේ හැකියා ලැබුණි. අද ශුද්ධාසනය ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 180 ක් සමග තානාපති සබඳකම් පවත්වන්නීය.

එසේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය නිරීක්ෂකයකු ලෙසත්, අරාබි ලීගය යුරෝපීය කවුන්සිලය ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනයන්හි නිරීක්‍ෂකයකු ලෙසත් නොබැඳි ජාතීන්ගේ සම්මේලනයේ විශේෂ ආරාධිතයකු ලෙසත්, ජාත්‍යන්තර පරමාණු බලශක්ති කාර්යංශය. රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වැනි තවත් බොහෝ ජාත්‍යන්තර සංවිධාන වලද සාමාජිකත්වය දරයි. ශුද්ධාසනයට දක්වන මෙම පිළිගැනීම කතෝලික සභාවට දක්වන විශේෂ වරප්‍රසාදයක් ලෙස හැඳින්විය හැක.

වෙනත් කිසිම ආගමික සංවිධානයකට මෙම අවස්ථාව මුළුමනින්ම තවමත් උදාවි නැත. ඒ අනුව පාප්තුමන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ කතෝලික සභාවේ අධ්‍යාත්මික නායකයා මෙන්ම ජාත්‍යන්තර නීතිය ඉදිරියේ පිළිගත් සංවිධානයක නායකයාණෝ ලෙසය.

### 3. වතිකාන රාජ්‍යය

මෙය පාප් නිලයේ එතරම්ම වැදගත් අංගයක් ලෙස සැලකිය නොහැක. ශුද්ධාසනය පිළිබඳව කළ ඉහත කෙටි විග්‍රහයට අනුව, පාප්තුමාගේ දූත සේවාවේ වඩා වැදගත් වන්නේ වතිකාන රාජ්‍යයේ රාජ්‍ය නායකයා වීම නොව, ශුද්ධාසනයේ නායකත්වය දැරීමයි. ශුද්ධාසනය බිහිවූයේ සභාවේ මුල් කාලයේ වූවත්, වතිකාන රාජ්‍යය බිහිවූයේ 1929 දීය.

19 වෙනි සියවසේ මැද භාගය දක්වා ඉතාලි අර්ධද්වීපයේ වැඩි කොටසක් වසර දහසකට අධික කාලයක් පාලනය කළේ පාප්තුමාගේ නායකත්වය යටතේය. නමුත් ඉතාලි රජය ක්‍රම ක්‍රමයෙන් පාප්තුමා යටතේ තිබූ ප්‍රදේශයන් මධ්‍යම රජයට ඈඳා ගැනීමත් සමග පාප්තුමන්ලා හා රාජ්‍ය නායකයින් අතර යම් යම් අර්බුද හටගත්තේය. මේ හේතුව යටතේ අවසානයේ II වෙනි පියුස් පාප්තුමා හා ඉතාලි රජය අතර 1929 දී ලැටරන් ගිවිසුම අත්සන් තබන ලදි.

ඒ අනුව වතිකානය නමැති නිදහස් සෛවරී ලොව කුඩාම රාජ්‍යය බිහිවිය. මෙම රාජ්‍යය බිහිවීමේ මූලික පරමාර්ථය වූයේ, පාප්තුමාට කිසිදු දේශපාලන බලවේග යකට යටත් නොවී. නිදහස්ව තමන්ගේ දූත සේවාව ඉටුකිරීම සඳහාය. වතිකානය වර්ග කි.මී. 44 ක් එනම් අක්කර 108 කින් සමන්විත කුඩා භූමිභාගයකි.

ප්‍රැන්සිස් පාප්තුමා ලංකාවට පැමිණෙන්නේ මූලිකවම වතිකානයේ රාජ්‍ය නායකයා වශයෙන් නොව, කතෝලික සභාවේ විශ්ව නායකයාණන් ලෙසය. එමනිසා කතෝලික රදගුරු මඬුල්ල ප්‍රමුඛ ශ්‍රී ලංකා කතෝලික ජනතාව එතුමාණන්ව සාදරයෙන් පිළිගනු ලබයි.

එලෙසින්ම එතුමා ශුද්ධාසනයේ ප්‍රධානියාය. ශුද්ධාසනය ජාත්‍යන්තර සංවිධානයක් ලෙස ශ්‍රී ලංකාවේ සිටින අපෝස්තලික තානාපති තුමා ලංකාව තුළ නියෝජනය කරන්නේ වතිකාන රාජ්‍යයට පෙර ශුද්ධාසනයයි. අපොස්තලික තානාපති ලෙස එතුමා නම් කරන්නේ ඒ නිසාය.

එමනිසා ශ්‍රී ලංකා රජය ශුද්ධාසනයේ ප්‍රධානියා ලෙස පාප්තුමන්ව රාජ්‍ය ගෞරව සහිතව අප මව්බිමට පිළිග නු ලබයි. එතුමා වතිකානයේ රාජ්‍ය නායකයා නිසාත් එතුමාණන්ට රාජ්‍ය ගෞරව ලැබෙයි.

එබැවින් ප්‍රැන්සිස් පාප්තුමන්ගේ ලංකා සංචාරය කතෝලිකයින්ට වැදගත් වන්නා සේම, සමස්ත ශ්‍රී ලාංකික ජනතාවටත් වැදගත් අවස්ථාවකි.

**කැමිලස්ගේ —— තිත්ත ඇත්ත**



## මීසමෙන් මීසමට

# දේවමාතාවන්ගේ ජීවිතයෙන් ඉගෙන ගන්නට ඔබටත් පුළුවන්

## බදුල්ල රදගුරු හිමිපාණෝ ප්‍රකාශ කරති

ස්වාමින් වහන්සේගේ මංගල භෝජනයට එක්වීමට අවශ්‍යවන්නේ සිත් හැරීමෙන් සමිඳුන් සමග සම්බන්ධ වීමයි. මැවීමේ කාර්යයට සම්බන්ධ දේව පුත්‍රයාගේ මව වීමට තෝරාගත් දේව මැණියන් මෙන් මවක පියකු වීමට වරප්‍රසාද ලත් ඔබ එතුමියගෙන් ඉගෙන ගන්න.

බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුර ජපමාල රාජේශ්වරියගේ මංගල්ලයේදී බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිමිපාණෝ පැවසූහ. පුරා සතියක් ජපමාලය සමග නුවාන පැවැත්වූ අතර දේශන වැලිමඩ සහයක ගරු සමීර පියතුමා පැවැත්විය. පදවියේ පියතුමන් සමගින් හපුතලේ ශා. එමාර්ඩ් දෙව්සත්හලේ අදියුරු ගරු යොහාන් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සන්ධ්‍යා මෙහෙය පැවැත්වුණි.

දේව මෙහෙයෙන් පසු දෙව්මව් ප්‍රතිමාව රැගත් පෙරහර වීදි සංචාරයෙන් පසු පැමිණ සිටි පිරිසට දිවා ආහාරය බෙදා දීමෙන් මංගල කටයුතු අවසන් විය. මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ, සහයක ගරු රොෂාන් ප්‍රනාන්දු පියතුමන්ට ජනතා සහාය නොමඳව ලැබුණි.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**



තංගල්ල අසීසියේ සාන්ත ෆ්‍රැන්සිස් මුනිඳුන්ගේ වාර්ෂික මංගල්‍යය ගාල්ල රදගුරු අතිඋතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මීසම් සේවක ගරු හැරල්ඩ් ලියෝ පීරිස් පියතුමා ද පසෙක සිටී.

**සටහන - නීරූක හේවාමාන්න; ඡායා - තාරුක සමරතුංග**



දාරළුව ශු. රාපායෙල් අග්‍රදූත තුමන්ගේ වාර්ෂික මංගල්‍යය කුරුණෑගල පදවි භාණ්ඩාගාරික අතිගරු බැසිල් රොහාන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් මීසම් සේවක ගරු ජෙරාඩ් ජයවර්ධන පියතුමාගේ සහභාගිත්වයෙන් සිදුකැරිණ.

**සෞම්‍ය නිරෝෂිණී**

### ක්‍රිස්තුස් වහන්සේගේ දහම අර්ථවත් කිරීමට ක්‍රියාකිරීම කිතුනුවාගේ වගකීමක්

ක්‍රිස්තුස් වහන්සේගේ දහම අර්ථවත් කිරීමට ක්‍රියා කිරීම සෑම කිතුනුවකුගේ පරම යුතුකම හා වගකීම බව කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් පියතුමා කොහිලගෙදෙර ශුද්ධ වූ මිබායෙල් අග්‍ර දූත වාර්ෂික මංගල්‍යයට සහභාගී වෙමින් පැවසීය.

මල්පිටිය මීසම් සේවක ගරු මොන්ටි පෙරේරා පිතුමාගේ මඟපෙන්වීම මත මංගල්‍යය ඉතා විශිෂ්ට අන්දමින් පවත්වන ලදි.

**බී. කේ. ටී. රෙජිනෝල්ඩ්**
**ඈන් ප්‍රසංගිකා රොඩ්රිගෝ**

### ඇතුගල්පුර රදගුරු හිමි නාලවලාන බැහැදකී

ඇතුගල්පුර රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ ඉකුත්දා නාලවලාන මීසම බැහැදැකීමට පැමිණියහ. නාලවලාන මීසම් ජනතාවට උදෑසන දිව්‍ය පූජාව පැවැත්වූ අතර සියලු සමිති, දහම් පාසල් දරුවන්, වෙල්කම් ආයතනයේ වැඩිහිටියන්, විලගෙදර ශ්‍රී පුෂ්පාරාමයේ ස්වාමින් වහන්සේ ඇතුළු දහම් පාසල් දරුවන් හෙන්ඩියගල ඉදි කිරීමට නියමිත දේවස්ථානය බැහැදකින්නට උන්වහන්සේ ගියහ. මේ සියලු වැඩ කටයුතු සඳහා මීසම් සේවක ගරු ජෝර්ජ් ඩික්සන් පියතුමාගේ මග පෙන්වීම හා නොමසුරු සහයෝගය ලැබිණි.

**සකුන්තලා**



බෝලවලාන ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය වැඩිහිටි දිනයක් පැවැත්විය. සාමාජික සාමාජිකාවන් ගීත, නැටුම් හා නාට්‍ය ඉදිරිපත් කිරීමෙන් නරඹන්නන් සතුටු කළහ. ආර්ථික අපහසුකම් සහිත සාමාජික සාමාජිකාවන් හට විශාල වියළි ආහාර ද්‍රව්‍ය පාර්සල් ද, ගීත, නැටුම් හා නාට්‍ය ඉදිරිපත් කළවුන් හට තිළිණ ද පිරිනමන ලදි. පැමිණ සිටි සියලුම සාමාජික සාමාජිකාවන් හට දිවා ආහාරයද, පිළිගැන්විණි.

**ඩිලන්ත ෆර්ඩිනැන්ඩො**

## දහම් පාසල පිරිපුන් දිවියකට මඟයි

පිරිපුන් කිතුනු දිවියකට දහම් පාසල මඟ පාදන්නේ යැයි හලාවත පදවි අනුනායක අතිගරු පීටර් චාල්ස් ප්‍රනාන්දු පියතුමන් වෙන්නප්පුව දිසාවේ දහම් පාසල් දැනුම මිනුම තරගයේ සමාප්ති උත්සවයේදී පැවසීය.

කිතු දහම පිළිබඳව නව නැම්මක පිබිදීමකින් අනාගතයට පා නඟන කිතුනු දූ පුතුන්ගේ දහම් දැනුම නංවාලීමේ අරමුණින් කටුනේරිය සා. සෙබස්තියන් ජුබිලි ශාලාවේදී තරගාවලිය සංවිධානය කර තිබිණි.

දිසාවේ සෑම දහම් පාසලක් නියෝජනය වන සේ මීසම් 12 න් කණ්ඩායම් 12 ක් තරගයට පිවිසි අතර මේ වෙනුවෙන් දහම් ගුරු පිරිසගේ කැපවීම හා පරිත්‍යාගයද දූ දරුවන්ගේ උනන්දුව ද ඉතා මැනැවින් කැපී පෙනුණි.

වෙන්නප්පුව දිසානායක ගරු පයස් කෙනඩි කටුනේරිය මීසම් සේවක ගරු සුනිල් විජේසිංහ පියතුමන් මීට එක් වූ අතර වෙන්නප්පුව දිසාවේ දහම් පාසල් කටයුතු සඳහා වාර්ෂිකව මූල්‍ය ආධාර සපයන, රාජ්‍ය කටයුතු හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය දයාශ්‍රිත තිසේරා මහතාගේ පරිත්‍යාගශීලි භාවයට දිසා දහම් අධ්‍යක්ෂ ගරු ජස්ටින් වර්නකුල පියතුමා ස්තූති කළේය.

**චරිත් ජයන්ත පීරිස්**

## හත්බෑවේ සා. ජූඩ් මුනි දෙව්මැඳුර පිළිසකර කරයි

රඹුක්කන මීසමට අයත් හත්බෑව ශු. ජූඩ් මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගල දිව්‍ය පූජාව පැවැත්වූ කුඩාගම සහායක ගරු රොහාන් නිශාන්ත පියතුමා ජුඩ් මුනිඳුන්ගේ පිහිට පතන අයට සිදුවූ ආශ්චර්යවත් හාස්කම් ගැන පහදා දුන්නේය.

රඹුක්කන මීසම් සේවක ගරු රොෂන් තිසේරා (පැ.තු.නි) පියතුමාගේ අප්‍රතිහත ධෛර්ය නිසා ගරා වැටුණු දේවස්ථානය පිළිසකර කර මංගල්‍යය පැවැත්වීමට භාග්‍යය හත්බෑව දේව ජනතාවට හැකිවිය. වතුකරයේ දිළිඳු පවුල් කීපයකින් සැදුන හත්බෑවේ කිතුනු සංඝයා මංගල්‍ය කටයුතු මෙන්ම දේවස්ථානය යළි ගොඩනගා ගැනීමට දරණ වෙහෙස සැමට ආදර්ශයකි.

තවමත් නිමාවී නැති හත්බෑව දේවස්ථානය සාදා නිමකර 2015 වර්ෂයේදී අංගසම්පූර්ණ දෙව්මැඳුරක් ලෙස මංගල්‍යය පැවැත්වීමට ඔවුහු අදිටන් කර සිටිති.

**අසුන්තා බණ්ඩාර**



වසර 18 ක් මග්ගොන මීසම් සේවක පියතුමන් ලෙස අගනා සේවාවක් ඉටුකළ ස්වර්ගස්ථ වූ ගරු කේ. ඩී. ඒ. නානායක්කාර නි.ම.නි පියතුමන්ගේ දේහය මග්ගොන සුසාන බිමේ භූමදාන කළ ස්ථානය නවීකරනය කිරීමෙන් පසු, පසුගිය මළවුන්ගේ මංගල්‍ය දිනයේදී මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන පියතුමන් විසින් ආසිරි ගන්වා මල් කළඹක් තබා උපහාර දැක්වූ අයුරුයි මේ. මේ සඳහා මීසම් ජනතාවගේ නොමසුරු සහය ලැබුණ අතර මීසම් සේවක පියතුමන්ගේ මූලිකත්වයෙන් කිතුනු කැළ සංවිධානය මගින් මෙය ක්‍රියාත්මක කෙරින.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## කලමුල්ලට දහම් සිසිලසක්!

කලමුල්ල මීසම් සේවක ගරු ලෝරන්ස් රාමනායක පියතුමාගේ සංකල්පයක් අනුව කලමුල්ල මීසම් ජනතාවට ධර්ම විවේකයක් දෙසැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇත. නිර්ල මරිය නිකායේ ගරු සරත් පෙරේරා පියතුමාගේ නායකත්වය යටතේ ගරු පියවරුන් කණ්ඩායමක් විසින් පවත්වන ලැබේ.

මීසම් සේවක පියතුමා ධර්ම විවේකයට පැමිණීමට නියමිත ගරු පියතුමන් සමිති සමාගම් වල නියෝජිතයින් සමග ධර්ම විවේකය පිළිබඳ සාකච්ඡාවක් පසුගියදා පැවැත්වූ අතර ධර්ම විවේකය තුළින් කිතුනු ජනතාවට අධ්‍යාත්මික දහම් සිසිලසක් ලබාදීමට ඉලක්ක කර තිබේ.

**ඩබ්. ඒ. ප්‍රනාන්දු**

# හිඟුරක්ගොඩ ක්‍රිස්තුරජාණන්ගේ දෙව්මැඳුර

පුදබිමක අසිරිය



දෙවන ලෝක යුද්ධය සමයේ ප්‍රහාරක යානා සඳහා ගගන යාත්‍රාංගනය ලෙස යොදා ගෙන ඇත්තේ අද පවතින හිඟුරක්ගොඩ ගුවන් තොටුපලයි. විදේශිය හමුදා කඳවුරු බැඳ සිටියේද මෙම ප්‍රදේශයේය. මේ අතර කතෝලික ආගමික හට පිරිස් ද සේවයේ යෙදී ඇත. මොවුන්ගේ ආගමික වතාවත්, අවශ්‍යතාවයන් සඳහා සේවය කර ඇත්තේ 'ලැන් ස්වාමි' නමින් සුදු ජාතික පියතුමෙකි. ඉන් අනතුරුව එම සේවය සඳහා 1943 වසරේදී ගරු සෑම් ඇලෙක්සැන්ඩර් පියතුමා මෙම ප්‍රදේශයට පැමිණ ඇත.

දෙවන ලෝක සංග්‍රාමයේ ගිනිදැල් සෙමෙන් නිවී යද්දී කඳවුරු බැඳගත් විදේශීය හමුදා ක්‍රමයෙන් ප්‍රදේශයෙන් බැහැර වන්නට විය. නමුත් ගරු ඇලෙක්සැන්ඩර් පියතුමා මෙම ප්‍රදේශයෙන් නොයන්නට අදිටන් කර ගනිමින් දුරබැහැර ප්‍රදේශවල කතෝලික ජනයා හිඟුරක්ගොඩ ප්‍රදේශයේ පදිංචි කරවීම කර ඇත. කතෝලිකයන්ට ද රජයේ ඉඩම්වල අයිතිය ගැන රජයේ නිලධාරින් සමග වාද කරමින් ඉඩම් ලබා දුන්නේය. පදිංචි කළ ජනයාට කටුමැටි ගසා පොල්අතු සෙවිලි කරමින් පුංචි දෙව්මැඳුරක් ද තනා දුනි. 1943 වසරේ අගෝ. 15 දා හිඟුරක්ගොඩ මීසමක් ලෙස ස්ථාපිත කරන්නට ගරු පියතුමා උත්සුක විය. 1946 වසරේදී එවකට හලාවත රදගුරු අතිඋතුම් එඩ්මන්ඩ් පීරිස් නි.ම.නි හිමිපාණන් විසින් මෙම කුඩා දෙව්මැඳුර ක්‍රිස්තු රජාණන්ට කැපකර ප්‍රථම මංගල්‍යය පූජාව පවත්වන ලදි. යාබද භූමියේ කතෝලික පාසලක් (අද රජරට විදුහල) ඉදිකර කතෝලික දරුවන් මූලික කර 1946 සැප්. 01 දා ආරම්භ කළේද ගරු ඇලෙක්සැන්ඩර් පියතුමායි.

මෙම කුඩා දෙව්මැඳුර ස්ථිරව ගොඩ නගන්නට මුල්ගල් තැබුවේ එවකට ත්‍රිකුණාමලය මඩකලපුව පදවියේ රදගුරු අතිඋතුම් ඉග්නේෂස් ග්ලෙනි හිමිපාණන් විසිනි. එතැන් සිට ගරු ඇලෙක්සැන්ඩර් පියතුමා ඈත දුර ප්‍රදේශවල කිතුනු බැතිමතුන්ගෙන් ආධාර ලබාගෙන කඩිනමින් ඉදිකළ දෙව්මැඳුර 1953 දී රදගුරු හිමිපාණන් විසින් අභිෂේක කරන ලදි. ශ්‍රී ලංකාවේ මීසම් පුරා පැතිර ඇති ධර්ම දූත ළමා සමාජ ව්‍යාපාරය 1987 වර්ෂයේ ආරම්භ වූයේ මෙම ක්‍රිස්තු රජාණන්ට කැපකළ දෙව්මැඳුරේ වීම විශේෂත්වයකි. ළමා සමාජ 25 වන සංවත්සරය 2010 වසරේදී ජාතික උත්සවයක් ලෙස අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන්නට ද මේ ක්‍රිස්තු රාජ දෙව්මැඳුර පින් බිමක් විය. වත්මන් මීසම් සේවක ගරු එරික් ප්‍රනාන්දු පියතුමාගේ මෙහෙයවීමෙන් මෙවර මංගල්‍යය පැවැත්වේ.

**ඩබ්. ජෝශප් ඇන්ටනි**



මරිය වසරට සමගාමීව නිවෙස් වෙත වැඩම කරවන ලද දේවමාතා ප්‍රතිමාවලට අමතරව පයාගල මීසමේ ඒකාබද්ධ මරිය හමුදාව සංවිධානය කළ ජපමාල රැලිය ඉකුත්දා පවත්වන ලදි. කුඩා පයාගල පරලෝක රාජේශ්වරියගේ දෙව්මැඳුරෙන් ආරම්භ කරන ලද ජපමාල පෙරහර ගාලුපාර ඔස්සේ ඉටිපහන් රැගෙන දකුණු පයාගල සා. ප්‍රැන්සිස් සේවියර් දෙව්මැඳුර දක්වා ගමන් කර එහිදී කටුකුරුන්ද රෝමානු කතෝලික විදුහලේ ආචාර්ය ගරු ප්‍රියනාල් අසන්ත පියතුමා මෙහෙයවූ ඡායාරූප චිත්‍රපට සහිත පහලොස් පන්ති ජපමාල යැදුම හා දිව්‍ය පූජා යාගය පවත්වන ලදි. පයාගල මීසම් සේවක ගරු සිසිර සමරකෝන් පියතුමාගේ පූර්න මැදිහත්කම මැද මීසම් සභාවල සහය නොමඳව ලැබිණ.

**ජී. නිහාල් ප්‍රනාන්දු**



# සමිඳාණෝ මහිමාලංකාරයෙන් සැරසී සිටින රජාණෝය

අද සභා මාතාව ඉතා වැදගත් සුවිශේෂ මංගල උත්සවයක් කෙරෙහි අපගේ අවධානය යොමු කරන්නීය. එනම් සියළු නපුරු අන්ධකාරයන් පාපයන් පරාජය කරමින් අප තුළ, අප අතර වැඩවසන්නා වූ සමිඳාණන් වහන්සේගේ රාජකීයත්වය සිහි කැඳවන මංගල්‍යයයි.

සමස්ත කිතුනු බැතිමත්හු ක්‍රිස්තුස් වහන්සේව තම ජීවිතයේ රජාණන් ලෙස පිළිගනිති. එහෙත් ඔවුන් වහන්සේ හා ඒකාබද්ධ වෙමින් අපගේ ජීවිත තුළින් ඔවුන් වහන්සේට දෙන තැන කොපමණ ද? ඉරුදින දිව්‍ය පූජාවට පමණක් සමහර විට එය සීමා නොවන්නේ ද? ඇතැම් විට එයද සතියකට, මාසයකට පමණක් සීමා වේ. අපගේ ජීවිත ගමන තුළ එදිනෙදා සිදුවන, සිදුවීම්, කැඳවීම් අභියෝග හරහා ගමන් කිරීමේදී ඔවුන් වහන්සේට අපගේ ජීවිතයේ තැනක් තිබේ ද?

බෞතිස්ම ස්නාපනයෙන් රාජකීය, පූජක, දිවැසිවර ජනතාවක් ලෙස අභිෂේක ලැබූ සෑම කෙනෙකුටම ක්‍රිස්තු රජාණන්ගේ මංගල මහෝත්සවය සියලුම සාන්තුවරයන්ගේ මංගල්‍යයට වඩා ජයෝත්සවයෙන් පැවැත්වීමට වගකීමක් ඇත. මන්ද "ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක්නම් අපේ දේශනා කිරීම නිරර්ථකය. ඔබගේ ඇදහීමත් නිරර්ථකය." (1 කොරින්ති 15:14) අපගේ විශ්වාසයේ පදනම ඔවුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානවීමේ සත්‍යතාවය විශ්වාස කරමින් අදහා ගැනීමය.

තවද මේ ලෝකයට අයත් නැති රාජ්‍යයක් පිළිබඳව අනාවරණය මෙලොවෙහි වෙසෙන කිසිදු රජෙකුට තේරුම් ගත නොහැකිය. ලෞකික රාජ්‍ය තාවකාලික වූවකි. එය පාවී යන මීදුමක් වැනිය. එමෙන්ම ලෝකයේ රජකම් කරන රජවරුන් රැජිණියන් වේවා. කොතරම් බලයෙන් උදම් වී සිටියත් ඔවුන්ගේ අවසානය නොසිතන මොහොතක පැමිණෙනු ඇත. කාලය විසින් ඔවුන් අමතක කර දමා ඇති බව ඉතිහාසය අපට සාක්ෂි දරයි. එහෙත් කිසි දිනෙක නැති නොවන රජකමක් ඇති රජතුමකු අප අතර වැඩ වසන සේක. ඔවුන් වහන්සේගේ රාජ්‍යයට අයිති රාජ්‍යය සඳහා ජනතාවක් වෙමු අපි.

අද දින දේව වචනයට අප ගත සිත යොමු කෙරුවොත් අපට පවසන්නේ සැබෑ එඬේරකුගේ භූමිකාවය. තෝරාගත් ජනතාවට දෙවි සමිඳාණෝ ප්‍රේම කරන සේක. ඔවුන් වහන්සේ එදා මෙන් අදත්, බැටළුවන් වන අප හැමදෙනාගේම අවශ්‍යතාවයන් සපුරාලමින් අප රැක බලා ගනිමින් මඟ පෙන්වන සේක. දිව්‍ය රැකවරණය අපට ලබා දෙන දිව්‍ය එඬේරාණෝ බැටළුවන් රැක බලා ගැනීම පමණක් නොව දිනෙක එම බැටළුවන් විනිශ්චය කරන බවත් ප්‍රකාශ කරති. නැති වූ බැටළුවන් සොයා යන බැව් පවසන දෙවිඳාණෝ තුවාල වූ බැටළුවන්ගේ තුවාල බැඳ ඔවුන් සුවපත් කරන්නට ද මැදිහත් වන්නාහ. ඔවුන් වහන්සේ අද අපට දී ඇති කැඳවීම කුමක් ද? නැති වූ බැටළුවන් සොයා යන එඬේරුන් වන්නට ද? සංඝයේ සභාවේ නිල එඬේරුන්ට කීකරු වන බැටළුවකු සේ සාක්ෂි දරන්නකු වන්නට ද?

පිබිදුනු කිතුනුවන් ලෙස ජේසු සමිඳාණන් වහන්සේව අපගේ ජීවිතයේ එකම රජාණන් ලෙස දැනුවත්වම පිළිගත්තද අපිදු තනතුරු, බලය, පිළිගැනීම් හා පුද්ගලයින් පසු පස හඹා නොයන්නෙමු ද? ඒවා අපගේ ජීවිතවල රජ කරනවා නොවේ ද? එබැවින් මනස්ථාපනය වෙමින් හදවතින්ම පෞද්ගලිකවත් පවුලක් ලෙස හා මීසමක්, සංඝයක් ලෙසත් සමිඳාණන් වහන්සේව රජාණන් ලෙස පිළිගනිමින් ඔවුන් වහන්සේ දෙසට හැරෙමු. ඒ සඳහා අවැසි බලය පතමු.

ටී. එච්. අජිත් ශාන්ත
බොරලැස්ස

# එක් පෙණහල්ලකින් දිවි ගෙවනා ධීවරයෙක්




මීගමුවේ වැල්ලවීදියේ උපන් මෙම කතා නායකයා ධීවර කාර්මිකයෙකි. විවාහයෙන් දරු දෙදෙනකුගේ පියකු වු ඔහු, සුනාමි ව්‍යසනයෙන් තරමක් අසීරුතාවයට පත් විය. ඒ වුවද දේව තාත්තාට දැක් වූ දේව ගරු බිය, භක්තිය බිඳකුදු අඩු නොවීය. මේ අතරතුරේදී ඔහුගේ ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ ක්‍රියාවලිය තරමක් දුර්වල විය. ප්‍රතිකාර ගන්නා අතර සුළු ශල්‍යකර්මයක් මඟින් පෙණහල්ලක සුළු කොටසක් ඉවත් කිරීමට සිදු විය. එහෙත් හතිය හා මහන්සි ගතිය නිතර වේදනා ගෙන දෙන සුළු විය. ප්‍රතිකාර ගත්තද සුවය ලද්දේ මද වශයෙනි.

වෛද්‍ය මතය වූයේ වැලිසර රෝහලට ඇතුලු වී මද කාලයක් එහි නතරව බෙහෙත් ගත යුතු බවයි. නමුත් ඔහුගේ රැකියාව අනුව එය කළ නොහැකි වූයේ දෛනික මාළු අලෙවියෙන් ඔහු සිය පවුල නඩත්තු කළ අතර දිනක් හෝ අතපසු වීම බිරිඳ හා දරුවන් කුසගින්නේ තැබීමක් වන බැවිනි.

කෙසේ හෝ යම් යම් ප්‍රතිකාර ගන්නා ලද අතර පසුගියදාක එක් විශේෂ වෛද්‍යවරයකු ඔහු පරික්ෂාවට ලක්කර ඇත. එදින එක්ස්රේ පිංතූරයක් ගන්නා ලදි.

එම පිංතූරය වැඩිදුර පරික්ෂා කර බැලීමේදී එම වෛද්‍යවරයාට එය අදහාගත නොහැකි විය. මන්දයත් පෙනහලු දෙකක් වෙනුවට එහි සටහන්ව තිබුනේ එක් පෙණහල්ලක් පමණ වීමයි. පසුව ඔහු තවත් වෛද්‍යවරුන් කීප දෙනකු කැඳවා පරීක්ෂා කර ඇත. ඒ අය මෙම පිංතූරය අයත් රෝගියා කොහිදැයි විමසූ විට මේ ඉන්නේ එයා තමා යයි පෙන්වා ඇත. "මේක වෙන්න බැරි දෙයක්. මේ එක්ස්රේ පිංතූරය අනුව රෝගියා සිටිය යුත්තේ රෝහලේ ඇඳක තද බල ප්‍රතිකාර මැදයි" යනුවෙන් පවසා අප ධීවර සොයුරා දෙස විශ්මිතව බලා සිට ඇත. එවෙලේත් වෛද්‍යමතය වී ඇත්තේ රෝහලේ නතරව මද කලක් ප්‍රතිකාර ගන්නා ලෙසයි. දරු පවුල රැකගැනීමට මුල් තැන දෙමින් දෙවියන්ට සියල්ල භාර කර එවෙලෙට දුන් බෙහෙත් රැගෙන ඔහු ආපසු පැමිණ ඇත.

ඔහු එදිනම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරිපිට ස්තුති යාච්ඤා කරමින් එක් පෙණහැල්ලක් පමණකින් ජීවිතය ඉදිරියට ගෙන යාමට දෙවි පියාණෝ කාරුණික වීම ගැන වැඳ වැටී යැදුම් පුදා ඇත. භාග්‍යවන්ත අම්මා ඉදිරියේ ද එසේම මොර ගසා ඇත. ඔහු පසුවදාම අපේ සමූහ යැදුමකට සම්බන්ධ වී මේ පුදුමාකාර සිද්ධිය බෙදා ගන්නා ලදි. ඔහුගේ දැඩි විශ්වාසය මෙන්ම ඉදිරි කාලයේ දී තම යාච්ඤා ජීවිතය වර්ධනය කර ගැනීමට දෙවි පියාණන්ගෙන් ලත් පණිවුඩයක් ලෙස ඔහුත් එම පවුලේ අයත් මේ සිද්ධිය සලකනු ලබයි. ඔහු හා එකී පවුලේ අය සමඟ අපද එක්වී දෙවිඳුනට ප්‍රශංසා කළෙමු. පෙණහල්ලක් නැතිව මිනිසකුට ජීවත් විය නොහැකි අතර එය දෘශ්‍යමාන නොවී යහතින් දිවි ගෙවීමට ලැබීම ඇත්තෙන්ම ආශ්චර්යයකි.

කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි - මීගමුව

## ධර්ම සංග්‍රහය

එස්. එම්. තිළිණි ලංකා
13 ශ්‍රේණිය

# දික්ඕවිට සා. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානය ඉදිකර වසරක් සපිරේ...

කොළඹ නගරයට නුදුරින් වත්තල දිසාවේ වැල්ලපල්ලිය මීසමට අයත් දික්ඕවිට නම් කුඩා ධීවර ගම්මානයක් විය. කි. මී. 7 ක් පමණ උතුරින් පිහිටි මෙම ගම්මානය නැගෙනහිරෙන් හැමිල්ටන් ඇලෙන් ද, බටහිරෙන් ඉන්දියන් සාගරයට මධ්‍යස්ථව දික්ඕවිට සා. අන්තෝනි මුනිඳුන්ට කැප කළ නව දේවස්ථානය පිහිටා ඇත.

සොබා සෞන්දර්යයෙන් යුත් මෙම ගම්මානය දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන අතර ඈත අතීතයේ මෙම සභාවට අයත් වී තිබුණේ කතෝලික දහමට නැඹුරු වූ දුගී දුප්පත් අසරණ පවුල් 07 ක් වැනි ස්වල්ප මාත්‍රයකි.

උපතින්ම කතෝලික දහමට ඇලුම්ව දිනෙන් දින කල් යැවූ ධීවරයන් හට දේවස්ථානයක අවශ්‍යතාවය කලක් ගත වන විට ඉතාමත් හොඳින් දැනෙන්නට විය. දුෂ්කරතාවයන්ගෙන් පිරි මෙම අලංකාර ගම්මානයේ ජීවත් වූ ධීවරයන් නව දේවස්ථානයක සිහින දුටුවේ ය. ඔවුන්ගේ සිහිනය සිහිනයකට පමණක් සීමා නොකොට කෙමෙන් කෙමෙන් උත්සුක වූ ධීවරයන් 1958 දී කුඩා යාච්ඤා මඩුවක් ඉදි කරන ලදි. එවකට වැල්ල පල්ලිය මීසම් සේවක ගරු ඇල්බට් පෙරේරා පියතුමා විසින් මෙම යාච්ඤා මඩුවේ ප්‍රථම දිව්‍ය යාගය සිදුකර ආසිරි ගන්වා ඉතිහාසයට එක් කරන ලදි.

1961 සිට 1967 දක්වා කාලය තුළ මීසම් සේවක පියතුමා ලෙස නි.ම.නි. ගරු සොලමන් පියතුමා විසින් 1963 දී ඉතා රමණීය දේවස්ථානයක් සාදා නිමකර දේව ජනතාවට ලබා දෙන ලදි. කෙමෙන් කාලය ගෙවී ගිය අතර මෙම සුන්දර ගම්මානය තරමක් නාගරීකරණයට ලක් විය. ජනගහනය ඉහළ යාමත් සමඟ විශාල දේවස්ථානයක අවශ්‍යතාව හොඳින් දේව ජනතාවට දැනුණි.

එම නිසා 2004 වසරේදි ඉරි තැලී කැඩී බිඳී ගොස් තිබූ පැරැණි දේවස්ථානය එම ස්ථානයෙන් ඉවත් කර නව දේවස්ථානයක් ඉදි කිරීමට එවකට මීසම් සේවකව සිටි ගරු නිහාල් ලියනගේ පියතුමා මුල පිරුවේ ය. නමුත් ගොඩනැගිල්ලේ අත්තිවාරම බලාපොරොත්තු නොවූ ආකාරයට ගිලා බැස විනාශ විණි.

ඉන්පසු ගරු ෆීලික්ස් මල්ලවආරච්චි පියතුමා මීසම් සේවක පියතුමා ලෙස සේවය කිරීමට මෙහි සපැමිණියේ ය. 2012 වසරේ දුරුතු මස 26 වන දා ගරු ෆීලික්ස් පියතුමා විසින් මෙහි ඉදිරි වැඩ කටයුතු කරමින් පෙරමුණ ගෙන කටයුතු කළේ ය.

නොයෙකුත් බාධක මැද නොසැලී කටයුතු කරමින් කතෝලික දහමට නැඹුරුව සිටි දේව ජනතාව හට දේවස්ථානයක් සාදා ආධ්‍යාත්මිකත්වය දියුණු කිරීමට උත්සුක වූ මීසම් සේවක පියතුමාණන් වන ගරු ෆීලික්ස් පියතුමාගේ හා එවට සහයක පියතුමන්ව සිටි ගරු වියාන් පියතුමාගේ ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ 06 මස 09 දින නව

☛ 15 පිටුවට

# ශු. අන්ද්‍රෙ අවෙල්ලීනු මුනිතුමා



නාපොලි දේශයේ නුවරෙහි උපත ලබා
දෙවිඳුන් අතට කීකරු වී ශිල්ප ලබා
පාපෙට බියෙන් ශරීරය පිරිසිදුව තබා
දෙවිඳුට ළං වුනේ පූජකවරය ලබා

මුලු සිතින් නොයෙදි දෙවියන් නැමදීම
දෙවියන් සතුටු කෙරුමට ආශාවීම
දෙවියන් රැවටීමකැයි නිති පැවසීම
ඔබතුම පැවසූවා හැමටම හැමදාම

නොදැනවු වරදට පවා කම්පාවීම
පවුකාරයන් ගලවන්නට කැපවීම
මිනිසුන්ගෙ වෛර ක්‍රෝධෙට අසුවීම
අවියක් උනේ ජයගන්නට ඉවසීම

රෑ දාවල් දෙකෙහි යෙදී භාවනාවට
ඉඩදුන්නෙ නොමැත ඔබේ සිය කැමැත්තට
සනදුරු රැයක මහ වැස්සට තෙමෙන්නට
නොදී රැක ගත්තේ අන් අය රකින්නට

මිනිමරුවන් නිසා සමාව ඉල්ලන්ට
පසුබට උනේ නැහැ විනිසුරු වෙතයන්ට
නීතිය, සාධාරණය, යුක්තිය ඉටුවන්ට
බොරුවක් කීවේ නෑ කිසිවකු ගලවන්ට

අවසන් වරට පූජාසනේ වෙතට ගොහින්
දෙවියන් සමග කථා කර කර සතුටු සිතින්
උකුත් වන්න ලැබුවා අණ දෙවි වරමින්
මොක් පුර දේව සිරිවත සදහට දකිමින්

බෙනඩික් විජේසිංහ
කඩවත

ජන වන්දනාව

## ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ලංකා ගමන හා. ජුසේවාස් මුනි සුදුවරයට එසැවීම

### විශ්වාසිකයන්ගේ යැදුම් 2014 නොවැම්බර් 23 ඉරුදින දේව මෙහෙයට

- ✤ අප සැම දෙනා කාලය දෙව් සමිඳාණන් වහන්සේගේ තිළිණයක් ලෙස පිළිගෙන, එය උන්වහන්සේගේ අසීමිත ආදරයත්, අප ජීවිත ගමන තුළ උන්වහන්සේ වැඩ සිටීමත් අත්දැකීමට ද, ජංගම දුරකථන, පරිගණක ජාලා, රූපවාහිනි ආදියට ඇබ්බැහිවීම තුළින් එම කාලය අපතේ නොහැරීමටද කැපවීමෙන් හා අධිෂ්ඨානයෙන් ක්‍රියා කිරීමට පියවර ගන්නා පිණිස... අපි යාච්ඤා කරමු.
- ✤ දෙවියන් වහන්සේගේ මෘදු බව සහ දයා කරුණාව අපගේ ජීවිත තුළ අත්දැකීමේ ප්‍රතිඵලයක් ලෙස දුගී අසරණ අයට සේවය කිරීම සඳහා කතෝලික සැදැහැවතුන් වන අප හට හෘදයාංගමව ඇප කැප වීමට ඔබගේ වරප්‍රසාද ලැබෙන පිණිස... අපි යාච්ඤා කරමු.
- ✤ දෙවියන් වහන්සේ විවිධ තරාතිරම් වලට අයත් මිනිස් ජනතාවට තමන් වහන්සේගේ ආදරණීය දරුවන් ලෙස සමාන ගරුත්වයෙන් සලකන පියාණන් කෙනෙක් බව අවබෝධ කරගෙන, අප සැම දෙනාට අපගේ ධර්මදූතික වගකීම් ඉටු කිරීමට හැකියාව ලැබෙන පිණිස... අපි යාච්ඤා කරමු.
- ✤ හා. ජුසේ වාස් මුනිඳුන්ගේ ධර්මදූතික ආකල්ප අනුසාර කරමින්, අපද අන් අය වෙත සුපුවත ගෙන යාමේ මෙහෙවරේදී ඔවුන්ගේ භාෂාවන් හා සංස්කෘතික අංගයන් අගයමින්, ඒවා තුළ ඇති කිතුනු වටිනාකම් දකිමින් ක්‍රියා කිරීමට ඔබගේ වරම් ලැබෙන පිණිස... අපි යාච්ඤා කරමු.

## මරිය වසර මගේ ඇසින්

| | |
|---|---|
| වසරක් තුළම සමරන ඔබෙ ගුණ | කරුණා |
| එතැනින් නිමා කළ හැකි දැයි පැණ | නැඟෙනා |
| සැමටම මවක් වී දක්වන පෙම් | ගුණෙනා |
| දෙව් මව් බැතිය සිසිලසමැයි හද | වෙලනා |
| ආදර මවේ ඔබෙ ගුණ ගයනා | අටියෙන් |
| වසරක් පුරාවට ජන හිත බැඳ | බැතියෙන් |
| සෙනෙහස ලබන්නට මව් පෙම පෙර | දැරියෙන් |
| ඔබවයි තබා ගත්තේ මුදු හද | කුටියෙන් |
| මරි මව් වසර තුන් හෙළයම ගොනු | කෙරුවා |
| ජපමාලයෙන් පවුලක් ආසිරි | ලැබුවා |
| දූ දරු සිත් සතන් හරි මඟ යොමු | කෙරුවා |
| මරි මව් වසර තුළ අප සැම ජය | ලැබුවා |
| "නිමල මරිය කුමරිය" ගුණ | හදවතට |
| ලංකර තබනු පිණිසයි වසරක් | අපට |
| වෙන්කර ලබා දුන්නේ සසුනින් | දැයට |
| වෑයම සපිරුණායි කිව හැක යස | රඟට |

**ෆ්‍රීඩා විල්ලවරායන් - ටොරොන්ටෝ, කැනඩාව**

**පසුගිය සතියේ උක්ත කවි පන්තිය මුල්කොට කිවිඳියගේ නම සඳහන් නොවීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමු. - සංස්කාරක පියතුමා -**

---

ආගමන සමයේ පළමු ඉරුදින - 2014. 11. 30

ඉරුදින මෙනෙහි කිරීම

# අවදිව සිට සූදානම් වන්න

පළමු කියවීම : යෙසායා 63:16-17; 64:1,3-8
දෙවන කියවීම : 1 කොරින්ති 1:3-9
පිළිතුරු ගීය : ගීතා 80:2-3,15-16,18-19
සුපුවත : මාක් 13:33-37

**අකීකරුකමේ පාපය නිසා දෙවිඳුන් සමීපයෙන් ඈත්ව ගිය මිනිසා යළිදු එක්කර ගැනීමේ ඒකායන පරමාර්ථය පෙරදැරි කරගෙන අපගේ දෙව් පියාණන් වහන්සේ විසින් කළ සැලැස්මේ උසස්ම හා ගැඹුරුම සිද්ධාන්තය වන දෙවියන් වහන්සේ මාංශගතවීමේ දිනය හෙවත් නත්තලට අපි ලහිලහියේ සූදානම් වන ආගමන කාලයට අපි ප්‍රවිෂ්ඨ වී සිටිමු.**

ආලෝකයෙන් ආලෝකය ද, සැබෑ දෙවියන්ගෙන් සැබෑ දෙවියෝ ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපන් මංගල්‍යය අප සැමට ප්‍රීතිය, සතුට, සාමය, සමගිය පිරුණු ආලෝකයේ හා බලාපොරොත්තුවේ මංගල්‍යයයි.

සමිඳාණන් වහන්සේ අපගේ පියාණන් වන බවත්, ඔවුන් වහන්සේ අපගේ ජීවිතයේ නිර්මාතෘවරයාණන් බවත් අද දින පළමු දේව ප්‍රකාශනය තුළින් යෙසායා දිවැසිවරයා සිහිපත් කරයි.

අප වනාහි ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදයෙන් පරිපූර්ණ ජනතාවක් වන අතර ඔවුන් වහන්සේගේ දෙවන පැමිණීම පිළිබඳ ඉමහත් බලාපොරොත්තුවෙන් ජීවත් වන ජනතාවක් බව අද දින දෙවන දේව ප්‍රකාශනය තුළින් පාවුලු තුමා කොරින්තිවරුනට යැවූ පළමු හසුනෙන් සිහිපත් කරනු ලබයි.

අද සුපුවත තුළින් ස්වාමින් වහන්සේ පවසන්නේ ඔවුන් වහන්සේගේ දෙවන පැමිණීමේ දිනය හෝ ඒ පැය පිළිබඳ කිසිවකු නොදන්නා බවත්, දෙව් පියාණන් වහන්සේ පමණක් එය දන්නා බවත් ය. අප වනාහි තමාගේ ස්වාමියාගේ දෙවන පැමිණීම පිළිබඳ ස්ථිරව හා බලාපොරොත්තුවෙන් ජීවත්වන ජනතාවක් වන අතර ඔවුන් වහන්සේගේ දෙවන පැමිණීම කුමන මොහොතක සිදුවේද යන්න නොදන්නා පිරිසකි.

අද සුපුවත තුළින් ස්වාමින් වහන්සේ කාරණා දෙකක් පිළිබඳව මෙනෙහි කිරීමට ආරාධනා කරනු ලබනවා.

i. ජීවිතයේ ප්‍රශ්න අරගල, දුක් කරදර වලට මුහුණ දෙන විට අපගේ ජීවිතය තුළ අපට පැවරී ඇති වගකීම් ඉටුකිරීමට අමතක නොකිරීමට වග බලා ගත යුතු බව.

ii. ලෞකික සැප සම්පත් වලට ඇබ්බැහි වී දෙවියන්ව අමතක නොකිරීමට වග බලා ගත යුතු බව.

ජීවිතය වෙනස් කරගන්නට කිසිවකු කිසිවිටෙක ප්‍රමාද නැත. නමුත් අවදිව සිටීම ඉතා වැදගත් ය. ඒ මන්දයත් නොදන්නා මොහොතක නොදන්නා ආකාරයෙන් ස්වාමින් වහන්සේ අපට කතා කරනු ඇත. අද සුපුවත තුළ ස්වාමින් වහන්සේ "අවදිව සිටීම හා සූදානම් වීම" ගැන ඉතා බලවත් ලෙස හෙළිදරව් කරයි.

මොකක්ද මේ "අවදිව සිටීම හා සූදානම් වීම"?

අලුත් ආරම්භයකට මුල පුරන මේ නව ජනවන්දනා වසරේදී ස්වාමින් වහන්සේ අපට පවසන්නේ දයාවේ ක්‍රියාවන්වල යෙදෙමින් සූදානම් වන්නටයි. රළු හදවතක් වෙනුවට මානව දයාවෙන් පිරුණු හදවතක් ඇති කරගන්නටයි. සමාවදීමේ ආදරයේ ජීවිත අප තුළ ඇති කර ගනිමින් ඔවුන් වහන්සේගේ මහිමාන්විත පැමිණීමට සූදානම් වීමටයි. හිතේ තදකරගෙන සිටින අසමගියේ කටු සටහන්, වෛරයේ අඳුරු මතක ආදරයේ මෙවලමින් මකා දැමීමටයි.

සාමයේ ක්‍රියා තුළ නිරතවීමයි. අන් අය සමඟ භේදබින්න වෙනවා වෙනුවට සාමයේ ආදරයේ මෙවලමක් වන්නටයි. ජීවිතයේ ප්‍රශ්න, අරගල දුක්කරදර ආදිය කැඳවීමට පක්ෂපාතී වන්නටයි. අවසාන කොට දේව වචනය තුළින් අද දිනයේදී ලෞකික සැප සම්පත් අතහැර යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම තුළින් දෙවියන් වහන්සේට පක්ෂපාතී වන්නට ස්වාමින් වහන්සේ අපට ආරාධනා කරයි. මන්දයත් නොදන්නා මොහොතක පැමිණෙන ස්වාමින් වහන්සේව පිළිගන්නට නිරන්තර යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම අවශ්‍යමය.

✍ **රොස්මන් ප්‍රනාන්දු සහෝදරතුමා**
ගොන්සාල්වෙස් සිංහල ආයතනය
ජාතික දෙව්සත්හල

---

# මරණයේ අඳුරු සෙවනැල්ල

**(මළවුන් සමරන මළවුන්ගේ මාසය වෙනුවෙනි)**

**ජීවිතය මරණින් කෙළවර නොවේ. කිතුනුවන් ලෙස මහත් වූ වරප්‍රසාද සම්භාරයක් දානය කරන දෙව් පියාණන් මරණය නමැති උතුම් වරප්‍රසාදය තුළින් සදාකාලික වූ ජීවිතය අපට දානය කරයි. මරණය මරා ජයග්‍රාහී ලෙස උත්ථාන වූ කිතු සමිඳුන් මරණය නමැති තාවකාලික දුක දෙවිඳුන් අභියස සදාකාලික වූ ජීවිත තත්ත්වයක් බව පෙන්වා දෙයි.**

පසෙහි දූවිල්ලෙන් මෙලොවට ජනිත වූ මිනිසා නැවත පස් යටම තම මුළු ශරීරයම සඟවයි. එහෙත් දෙවිඳුන් අභියස අපගේ මිනිස් ආත්මය සදාකාලිකව දිරා නොයනු ඇත.

සැබවින්ම කිතුනු අපට මරණය දුකක් නොවේ. එහෙත් මෙලොව ජීවත් වන අපි මරණය අභියස වෙව්ලනු ලබන්නේ නැවත කිසිදිනක ගැලවීමක් ලබා ගත නොහැකි අයුරිනි.

මෙලොව අප ගමන් කරන කෙටි ගමන් මඟ තුළ කිසිදා නොමැරෙන මිනිසුන් ලෙස ජීවත් වීම ඉතාමත් ඛේදනීය තත්ත්වයකි. බුද්ධියෙන් අග තැන්පත් වූ අපට ජීවිතය මහ මෙරකි. තම වර්ගයාගේ ලේ සුවඳ පවා නොදන්නා අයුරින් ජීවත් වන අපි අනුවණ ලෙස ක්‍රියා කරමින් ජීවත් වෙමු. ආදරය, සෙනෙහස වෙනුවට වෛරය, ක්‍රෝධය අද අපගේ සැබෑ මිතුරන් බවට පත්වී ඇත.

වසරකට වරක් මරණය ගැන මළාවූ අයවලුන් සිහිපත් කරමින් අප හඬා වැටෙන්නෙමු. අප වෙනුවෙන් ජීවත් වූ අප වෙනුවෙන් මුළු ජීවිතයම කැප කළ අපව හැර ගිය සැබෑ මිනිසුන් අපට සිහිපත් වන්නේ මළවුන්ගේ මාසයේ පමණකි. සොහොන් කොත් සුද්ධ පවිත්‍ර කරමින් සොහොන් ගැබ අලුතින් අලුත්වැඩියා කරමින් අපි ඔවුන් වෙනුවෙන් අපගේ ගෞරවය මහත් වූ හරසරින් පුදන්නෙමු. ඇත්තෙන්ම වර්තමාන සමාජය තුළ එය වටිනා චාරිත්‍රයක් බවට පත් කර ගැනීමට අපි සමත් වී ඇත්තෙමු.

දෙව් පියාණන් අභියස සැබැවින්ම අපට මරණය ජයගත හැක. ගතවන සෑම මොහොතකම මරණය නමැති අඳුරු සෙවනැල්ල පහ කළ හැක්කේ අපටමය. තාවකාලික කෙටි කාලය තුළ සදාකාලික ජීවිතය සඳහා පිං රැස් කිරීම අප සතු වගකීමකි. මෙලොව ජීවිතය තුළ දසපනත අනුසාරය ක්‍රියාවට නැංවීම තුළ අප මරණයට බිය විය යුතු නැත. පාපයේ යදම් වලින් නිදහස් වී දිනෙන් දින මරණය පිළිබඳවත් අප මෙලොව හැරදා ගිය අපගේම ආදරණීයයන් පිළිබඳව සිහිපත් කරමින් ජීවත් වෙමු. එවිට වසරකට වරක් පැමිණෙන මළවුන්ගේ මාසයේ විශේෂ ලෙස ඔවුන් වෙනුවෙන් වෙහෙස විය යුතු නැත. ඔවුන් සැබවින්ම අපගේ හදවත් තුළ සදාකාලිකව ජීවත් වනු ඇත. මේ මළවුන්ගේ මාසයේ අප සිහිතබා ගත යුතු කරුණ වන්නේ මරණය කිතුනු අපට සදාකාලික ජීවිත තත්ත්වයක් බවයි.

මෙලොව උපදින පුංචි කිරිකැටියාත්, මෙලොව හැර යන මනුෂ්‍යයාත් මෙලොවින් සමුගන්නේ තවත් මනුෂ්‍යයකුට මහත් වූ දුකක් වේදනාවක් උරුම කරමින් ය. එයයි ජීවිතයෙත් මරණයෙත් සැබෑ අර්ථය!

✍ **ගරු හෙල්ඩා සුරංගනි සොයුරිය**
දිව්‍ය හෘදයේ අප ස්වාමිදූගේ පැවිදි පන්තිය - ඉරණවිල

---




# අගරදගුරු පදවි මරිය වසරේ ලූර්දු වන්දනා චාරිකාවේ අසිරිමත් අත්දැකීම් ඇසුරෙන්...!

**කොළඹ අගරදගුරු පදවි මරිය වසර නිමිත්තෙන් සංවිධානය කරන ලද ලූර්දු වන්දනා චාරිකාවට සහභාගි වීමේ වාසනා මහිමය අපට හිමිවීම අසිරිමත් එකක් ලෙසින් හැඳින්වීම නිවැරදි යයි හැඟේ.**

අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ප්‍රමුඛ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් හා අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් ද කලාපීය නාහිමිවරුන් ද 50 ක් පමණ පූජාප්‍රසාදිවරුන් ද සහභාගි වූ මෙම දැවැන්ත වන්දනා ගමනට ශ්‍රී ලංකාව ඇතුළු රටවල් කීපයකින් 3000 කට අධික සැදැහැ පිරිසක් සහභාගි වූහ. ඊට අමතරව ලොව නන්දෙසින් පැමිණි අති විශාල ජනකායක් පොදු මෙහෙයන්ට හවුල් වූහ.

මෙයට සහභාගි වූ දමිළ ජාතික සැදැහැවතුන්ට, සිංහල භාෂාවෙන් කෙරුණු දේශන දමිළ භාෂාවට පරිවර්තනය කිරීම අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු සහයක රදගුරු හිමිපාණන් වෙතින් ඉටු වීම ඔවුනට සුවිශේෂ පහසුවක් විය.

සුපර්ලින්ක්, ක්වෙස්ට් ඩෙස්ටිනේෂන්ස්, ජෙට් වින්ග් යන ගුවන් ගමන් සංවිධාන ආයතන මඟින් මෙම චාරිකාවට සහභාගි වූවෝ නිශ්චිත දින හතරක් ලූර්දු සිද්ධස්ථානයේ ගත කිරීම සඳහා එහි සම්ප්‍රාප්ත වූහ. ඉහත කී ආයතන, වන්දනාකරුවන්ට හැකි උපරිම පහසුකම් සැලසීමට කටයුතු කර තිබීම අගය කටයුතුය.

ලූර්දු පුදබිමට පැමිණීමත් සමඟ අප කා තුළත් මහත් සොම්නසක් හා ආධ්‍යාත්මික සුව සහනයක් දැණුනු බව අතිශයෝක්තියෙන් තොරව පැවසිය යුතු වන්නේ ය.

අප වන්දනා කණ්ඩායම මුලින්ම ඒකරාශී වූයේ අසිරිමත් ලූර්දු ගුහාවට දකුණු දෙසින් පිහිටි දෙව්මැඳුරේ දී ය. අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් එය පැවතිණි. මෙම චාරිකාව සංවිධානය කිරීමේ පුරෝගාමී මෙහෙවරක් කර තිබූ බව පැවසුනු සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් හා අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් ඇතුළු පිරිස මීට සහභාගි වී සිටියහ.

මරිය මාතාවන් සභාවේද මාතාවන් ලෙස 1963 දී ප්‍රකාශයට පත් වූ බවද එතුමියට ගෞරව කිරීම කතෝලික සභාවේ යුතුකම බවද සවිස්තරාත්මකව අති උතුම් කාදිනල් හිමිපාණන් විසින් කරන ලද දේශනය නිසා ලූර්දු පුදබිමට පැමිණි කාගේත් සිත් මරිය තුමන් කෙරෙහි වඩ වඩාත් භක්තියෙන් පූර්ණ විය.

☛ ඉදිරියට

✍ **ලිව්සුරු සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
පේරලන්ද

ජනතා හඬ

# කිතුනු හෘදසාක්ෂිය තුළ පිළිගැනීම හා පලිගැනීම

**කතුතුමනි,**

ප්‍රිරිහී ගිය සමාජයක් තුළ සත්‍යය, සාධාරණත්වය අවංකකම බලාපොරොත්තු විය නොහැකි වුවද සත්‍යය වෙනුවෙන් පෙනී සිටීම කිතුනු අපගේ වගකීමය.

අද බොහෝ නිලතල දරන්නන් තමන් වෙනුවෙන් ප්‍රශස්ති ගායනා පමණක් බලාපොරොත්තු වන අතර විනිවිදභාවයකින් තොර යම්ක්‍රියා විමසීම ඔවුන්ගේ උදහසට හේතු වනු ඇත.

ඉහත තත්ත්වය සාමාන්‍ය වුවද දැන් දැන් මේ තත්ත්වය පල්ලිය තුළද දැකීමට ලැබීම කණගාටුවට කරුණකි. යම් කරුණක් කතාකරන්නාගේ අයිතිය වැලැක්වීම හා කතාකරන්නාගෙන් පලිගැනීම් නොකළ යුතුය. තමන් යම් පිරිසකට නායකයකු නම් හෘද සාක්ෂියට එකඟව යම් ප්‍රශ්නයකදී පිළිතුරු දීමේ හැකියාව හා වරදක් ඇතොත් පළිගැනීමේ යහපත් කමක් තිබිය යුතුය. පිළිගැනීම පසෙකලා පිළිගැනීම ඉස්මතුකරලීම කිතුනු හෘද සාක්ෂියට එකඟ නැත. විශේෂයෙන් පල්ලිය තුළ පොදු ප්‍රශ්න නැගීමේ හා කතාකිරීමේ හැකියාව සැමට තිබිය යුතුය.

**මාලන් පෙරේරා**
කොටුගොඩ

# කැඩුණු, බිඳුණු දේව ප්‍රතිමාවන්ට මෙසේ විසඳුමක් දෙමු

**කතුතුමනි,**

කොලොන්නාව ප්‍රදේශයේ ශු. අන්තෝනි මුනිතුමාගේ ප්‍රතිමාවක් ස්ථාපිත කර ඇති ස්ථානයකට, කැඩුණු බිඳුනු ප්‍රතිමාවන් ගෙනත් තැබීමට ප්‍රදේශ වාසින් හුරු පුරුදුව තිබෙන බවත්, එනිසාම වෙනත් ලබ්ධිකයින්ද තම තමන්ගේ විකෘති වන දේව ප්‍රතිමාවන් එම ස්ථානයට ගෙනත් දමා යාමට හුරු පුරුදුව තිබෙන බවත් පසුගිය දිනක ප්‍රදීප ජන හඬ තුළින් දැක මෙය ලියන්නට සිත්විය.

බොහෝ විට අප කිතුනුවන් තමන් වන්දනාමාන කරනට යොදාගත් ප්‍රතිමාවන්, කැඩී බිඳී, පළුදු වූ විට ඒවා ගෙනවිත් තම දේවස්ථානයේ යම් යම් ස්ථානවලත්, එසේත් නැතිනම් එළිමහන් ප්‍රතිමා ස්ථාපිත කර ඇති ස්ථානවල පාමුල තබා යාමටත් හුරුපුරුදුව සිටිති.

ප්‍රතිමා නිර්මානය සඳහා බොහෝවිට යොදා ගනුයේ. මැටි, ප්ලාස්ටර් පැරිස් හෝ ලී වැනි අමු ද්‍රව්‍යයන් බැවින් කල්යත්ම මේවා විවිධ හේතුමත පළුදු වී විකෘති වී භාවිතයට ගත නොහැකි තත්ත්වයනට පත්වේ.

එසේ පළුදු වන ප්‍රතිමාවන් දේවස්ථාන වල හෝ ප්‍රතිමා ස්ථාපිත කර ඇති ප්‍රසිද්ධ ස්ථාන අසල දමා යාමෙන් සිදුවනුයේ ඒ ප්‍රතිමාවෙන්, මූර්තිමත් කරන, ජේසුතුමන්, දේවමෑණියන් හෝ වෙනත් සාන්තුවර චරිතයන් නිගාවට පත් කිරිමකි.

එහෙයින් භාවිතයට නොගත හැකි ලෙස කැඩී බිඳී, පළුදු වන ප්‍රතිමාවන් සම්බන්ධයෙන් අප කළ යුතු හොඳම දේ වන්නේ ඒවා තම ගෙවත්තේ කොහේ හෝ වළදමා ස්වාභාවිකව විනාශ වී යාමට ඉඩ හැරීමයි.

**ජූඩ් සේනාධීර**
මට්ටක්කුලිය

# සමාජශාලා නළඟණෝ අප දෙව් මැඳුරු ආක්‍රමණය කරති

**කතුතුමනි,**

නොවැම්බර් මස 9 වන ඉරුදින ඥනාර්ථ ප්‍රදීපයේ ගරු එම්මානුවෙල් ජාන්ස් පියතුමන් විසින් සැපයු ලිපියට එතුමන්ට අනේක වාරයක් ස්තුති කළ යුත්තේ වැඩිමහල් දරුවන් ඇති දෙමව්පියන් විසිනි.

එතුමා සඳහන් කළ පරිදි දෙව්මැඳුරු වල පැවැත්වෙන විවාහ මංගල දිව්‍ය යාගයන් ශුද්ධ දෙයක් ලෙස නව යුවළේ ජීවිතයට දේවාශිර්වාදය ගෙන දෙන්නක් වුවද, අද එය එක්තරා තරගකාරි විලාසිතා උත්සවයකි. පළමුව මේ වරදට වගකිවයුත්තේ මේ විලාසිතා රඟ දක්වන යුවලගේ දෙමව්පියන්ය. එලෙසම යම් පමණකට මීසම් සේවක හෝ දේවස්ථානයේ පියතුමන් ද, දිව්‍ය යාගය පවත්වන පියතුමාද වග කිව යුතුය. මේ යුවළයන් කලින් මේ ගැන දැනුම්වත් කළ යුතුයි. එමෙන්ම මේ විලාසිතා නිසා මහත් අසීරුතාවයන්ට පත් වන්නේ දිව්‍ය යාගය සිදුකරන පියතුමන්ය.

ඉරුදින දිව්‍ය යාගයන්ට සහභාගිවන මව්වරුන් තම දූවරුන්ට නොදෙවනි ලෙස තම දේහය උලුප්පා, පුම්බවන කරුණකි. අතීතයේදී මෙහි සිටි විදේශික පියවරුන් මෙවැනි විලාසිතාවලින් සැරසී දිව්‍ය භෝජනයට පැමිණි වනිතාවන්ට දිව්‍ය සත්ප්‍රසාද දානය නොකෙරු අවස්ථා, මම දිව්‍ය යාගයට පූජා උදව් ළමයෙකු ලෙස අනේක වාරයක් දැක ඇත්තෙමි. දැනුත් දිව්‍ය යාගය පවත්වන පියතුමන් එලෙස කරන්නේ නම් දිව්‍ය යාගයට සහභාගිවන අය අනවශ්‍ය විලාසිතාවලින් සැරසී පැමිණීම නවතා ගත හැකිය.

මීට වසර කිහිපයකට පෙර දඬුම්ගල නැගීමට කොට කලිසමකින් ගිය මට එලියේ නතර වීමට සිදුවිය. දළඳා මැඳුර නැරඹීමට පැමිණි විදේශිකයන් අමතර රෙද්දක් ඇඳ යනවා මා අනෙකවාරයක් දැක ඇත.

**නවින්ද්‍ර ලෝරන්ස්**
හපුගොඩ

# ඉහළ යන සහල් මිළට කඩිනම් පිළියමක් යොදන්න

**කතුතුමනි,**

වත්මන් වෙළඳ පොලේ සහල් මිළ ඉතා ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. මේ නිසා අසරණ පාරිභෝගික ජනතාව මහත් කරදර හරිහැරවලට මුහුණ පා සිටිති.

එදිනෙදා දිවිගෙවීමට උපයා ගනු ලබන සුලු සොච්චම් වැටුපෙන්, තම තමන්ට අවශ්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩ ගැනීමටත් අනිකුත් අවශ්‍යතාවයනටත් වියදම් කර ගැනීමට බැරි අවස්ථා උදාවී ඇත. කරුණු මෙසේ හෙයින් අධික මිල ගණන්වලට අලෙවි කරනු ලබන සහල් මෙරට වගාකර ගැනීමට මං සැලසිය යුතුය. කළයුතුව ඇත්තේ අප ලක්බිමේ පිහිටා ඇති මඩ ඉඩම් සම්පූර්ණයෙන්ම වගාකර ගැනීමට කටයුතු සැලස් වීමය.



එසේ කළ හැකි වන්නේ රැකියා විරහිත තරුණ / තරුණියන්ව කෘෂිකාර්මික කටයුතු වල නිරත කරවීමෙනි. ඒ සඳහා ඔවුන් සැමටම දිරි දීමනාවක් ලබාදුන හොත්, එක් අතකින් රැකියා ප්‍රශ්නය විසඳීමත් අනිත් අතින් මෙරට පුරන් වී යාමට ඉඩහැර ඇති කුඹුරු ඉඩම් නැවත සශ්‍රික කුඹුරු ඉඩම් බවට පත්කිරීමටත් හැකිවනු ඇත. එවිට මෙරට කෘෂිකර්මාන්තය දියුණුවෙන් දියුණුවට පත්වෙනු ඇති බැව් මම ඉඳුරාම පවසමි. එවිට වෙළඳ පොලේ අධික මිළ ගණන්වලට අලෙවිකරනු ලබන සහල් මිල ක්‍රම ක්‍රමයෙන් පහත වැටෙනු ඇත.

මෙරට පුරන් වී යාමට ඉඩ හැර ඇති සියලුම කුඹුරු ඉඩම් ඉදිරියේදී සශ්‍රික මඩකුඹුරු ඉඩම් බවට පත්වී පොදු ජනතාවට යහපතක් ම වේවායි යන්න පොදුවේ ලක්වාසි සියලු දෙනා වෙනුවෙන්ම කරනු ලබන මගේ හෘදයංගම පැතුමයි!

**වෝල්ටර් නික්ලස් පෙරේරා**
නැගෙනහිර නයිනමඩම

# විපතක් සිදුවු පසු එක්වන නායකයින්ට එම විපත් සිදුවන්නට පෙර එක්වීමට නොහැකි වූයේ මන්ද?

**කතුතුමනි,**

ඌව පළාතේ හල්දුම්මුල්ල, කොස්ලන්ද මීරියබැද්ද වතුයායේ සිදුවු නායයාමෙන් සිදුවු විශාල ඛේදවාචකය ගැන, මාධ්‍යවලින්, රූපවාහිනි හා පුවත්පත්වලින්ද ප්‍රචාරය විය. පුවත් මවති. මෙවන් විපතක්, ඛේදවාචකයක් සිදුවූවිට යුහුසුළුව එම විපතින් මුදාගැනීමට විශාල මෙහෙයුම් දියත් කරති. එහෙත් එම අසරන සුළු ජනතාව, බාල, මහළු, වැඩිහිටි සියලු දෙනාම පස්යට වැළලී ගියාට පසු, එම මිහිදන් වූ සිරුරු ගොඩගැනීමට බැකෝ යන්ත්‍ර, හමුදා සෙබළුන් යොදා කරන මෙහෙයුම්වලින් ඔවුන්ට යහතක් සිදුවේවිද? ඔවුන්ගේ දහඩිය, ශ්‍රමය කැපකරමින් අව්වැසි නොබලා රැස්කරගත් වස්තුව, දේපල ජල රකුසා බිලිගත් පසු ඒවා සොයා නැවත ඔවුන් අතට පත්කිරීමට ඔවුන් ජීවතුන් අතර නැත. මෙය සමච්චලයට කරුණක් නොවේද?

සිදුවිය යුත්තේ කුමක්ද? 2005, 2011 වසරේ ඔවුන්ට ඉවත්වන්න අනතුරු ඇඟවීම් කළබව, ඒ ගැන දැනුම්වත් කළ බව පවසති. ඔවුන් එම අවවාද පිළිනොගත් බවද පවසති. එම ඛේදවාචකය වූ පසු පිළියම් යෙදීමට පෙර, මාර්ගය කාපට් කිරිමට, අසරණ ජනතාවගේ වෙළඳසැල් බලෙන් කඩා බිඳ දමා ජනතාව ඉවත් කළ මහනගර සභා මෙන් මෙම නායයාම්වලින් මිහිදන් වූ ජනතාව සිටි ලැයින් කාමරද බලෙන් ඉවත් කර ඔවුන්ට ආරක්ෂා සහිත ප්‍රදේශවල කුඩා නිවාස සංකීර්ණයක් ගොඩනගා ඔවුන් පදිංචි කළානම් අද විශාල මුදලක් වැයකර කරනා මෙහෙයුම් වලින් එම මුදල්ද ඔවුන් වෙනුවෙන් වැයකරන්න තිබුනා නොවේද? තේ දල්ලෙන් රට ස්වයංපෝෂිත කරන්න තම දහඩිය ශ්‍රමය වැය කරන, කඳුකරයේ අසරණ සුළු ජනතාව මෙසේ පස් යට මිහිදන් වූ පසු ඔවුන්ගේ මළසිරුරු සොයන්න පොලිස් සුනඛයින් පවා යොදාගැනීමෙන් ඇති ඵලය කුමක්ද? හොරුන්, මංකොල්ලකරුවන්, ස්ත්‍රි දූෂකයින්, දරුවන් පැහැරගැනීම මේ සියල්ලට යෙදවිය යුතු සුනඛයින් මිහිදන් වූ මළසිරුර සෙවීමට යොදා ගැනීමෙන්, පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් සුනඛයින්ටද කරනා අගෞරවයකි.

සුනාමි ඛේදවාචකයෙන් තම පසුම්බි පුරවාගත් අය, මෙවන් විපතක් වනතුරු තම වාසිය තකා ක්‍රියා කරන අයද මෙම අනාථ කඳවුරුවලටද ගොඩවනු ඇත. දෙසැම්බර් මස පැවැත්වෙන අ.පො.ස සාමාන්‍ය පෙල විභාගයට සූදානම් වන දූ දරුවන් 40 කගේ පමණ මනස කෙතරම් ව්‍යාකූල වී ඇද්ද? මැතිවරණ සමයේ මනාප ඉල්ලාගෙන පැමිණි නායකයෝ අද මෙම දූ පුතුන්ගේ අනාගතය ගැන වගකිව යුත්තෝ නොවේද? දැන්වත් වගකිව යුත්තෝ දෙනෙත් හැර, මෙම අනාථ කඳවුරුවල සිටිනා තේ දල්ලෙන් රටට මුදල් ගලා ඒමට සලස්වන අසරණ සුළු ජනයා ආරක්ෂා සහිත නිවාසවලට යොමු කරන්නේ නම් මිහිදන් වී ඇති මළසිරුරු ගොඩගන්නවාට වඩා යහපත් නේද? එසේ නොවුනහොත් සිදුවන්නේ මේ අසරණ ජනතාවගේ දූ පුතුන්ද පැහැර ගැනීම්වලට ලක්වී කාගේ හෝ ධනපතියකුගේ නිවසක බැලමෙහෙවරකම් කිරීමටයි. දේශපාලන නායකයිනි, විපතක් වූ පසු සුසුම් හෙලනවාට වඩා විපතක් වන්න පෙර පිළියම් යෙදුවොත් සතුටු කඳුළු හෙලිය හැකියි නේද?

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**
බදුල්ල

# නායයාමෙන් විපතට පත් ජනතාවට පිහිට වෙමු

**කතුතමනි,**

පසුගිය ඔක්තෝබර් 29 වන දින ඇද හැලුණු ධාරානිපාත වර්ෂාවත් සමග කොස්ලන්ද මිරිය බැද්ද වත්ත ප්‍රදේශයේ සිදුවු දරුණු නාය යෑමෙන් නිවාස සියයකට ආසන්න ගණනක් විනාශ වී එසේම ජීවිත ගණනාවක් අතුරුදන් වීමේ ශෝකජනක පුවත අපට අසන්නට ලැබිණ.

මේ ශෝක ජනක අවස්ථාවේ අප සියලු දෙනාගේම යුතුකම වනුයේ පක්ෂ භේද, ජාති, ආගම් භේද පසෙකලා විපතට පත් ජනතාවට පිහිට වීමයි.

එසේම එළඹෙන 2015 ජනාධිපතිවරණයට රජය මෙන්ම විපක්ෂයද ලහි ලහියේ සූදානම් වෙන බව අපට ජනමාධ්‍යයෙන් අසන්නට හැකිව ඇත. මෙම මැතිවරණයට මිලියන බිලියන ගණන් වියදම් කිරීමට සූදානම්ව ඇත. පාරවල් දෙපස හන්දිගානේ කටවුට් සමනල වර්ණ පෝස්ටර් ගැසීමට සූදානමින් සිටිති. මේ සා මුදලක් වියදම් කිරිම ජාතික අපරාධයකි. කළ යුත්තේ ජනාධිපතිවරණයට වියදම් කිරීමට බලාපොරොත්තු වන මුදල් නායයාම් වලින් විපතට පත් ජනතාවගේ සුබ සිද්ධිය සඳහා යෙදවීමයි.

**ඩබ්ලිව් සිරිල් ටයිටස් පෙරේරා**
කටුනායක



# කැපවූ ජීවිතයේ වසර 2015



## 2015 වසර "කැපවූ ජීවිතයේ වසර" ලෙස සසුනිසුරාණන් විසින් ප්‍රකාශයට පත් කර ඇත.

අප සසුන් පියාණන් මෙම නිවේදනය කළේ පසුගිය 2013 වසරේ නොවැම්බර් මස පැවිදි නිකායික ප්‍රධාන පියතුමන් 120 දෙනකුගෙන් සැදුම් ලත් සමුළුවක් අවසානයේ දී ය. මෙම ප්‍රකාශයට විෂය වූ හේතුන් වන්නේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පනස් වසරක් පිරීමේ සංවත්සරය සහ විශේෂයෙන්ම පැවිදි ජීවිතයේ ප්‍රතිසංස්කරණය පිළිබඳ නිල නියෝග ප්‍රකාශනය පළ කිරීමේ පනස් වසරක් සපිරීමය.

තම ප්‍රකාශය පිළිබඳ වැඩිදුරටත් කරුණු දක්වන සුදුතුම් පියතුමෝ "මෙම මන්ත්‍රණ සභාවට පනස් වසරක් සපිරෙන මේ මොහොතේ කැපවූ ජීවිත, දේව වරප්‍රසාදයන්ට සහ ශුද්ධාත්ම ස්ප්‍රීතුවට නතු වූ අවස්ථාවන් කරගනිමින්, අපගේ දුර්වලකම් සහ අපගේ අවිශ්වාසවන්තකම් පවා දේව අනුග්‍රහය සහ දේව දයාව කරා යන අත්දැකීමක් කර ගත යුතුයැ"යි ප්‍රකාශ කළහ.

"මෑත අතීතය 'කෘතඥතා පූර්වකව' සිහිපත් කරන්නට මෙම වසර අවස්ථාවක් කර ගත යුතුය. මෙය කැපවූ ජීවිත වසරේ පළමු අරමුණයි."

"මෙම මන්ත්‍රණ සභාව පැවැත්වූ කාලය හා වර්තමානය අතර වරප්‍රසාදයෙන් පිරි අවධිය දෙස ධනාත්මකව බලමින් "අනාගතය ඇඩි බලාපොරොත්තුවකින් වැළඳ ගැනීම" දෙවන අරමුණ විය යුතු බව එතුමෝ තවදුරටත් සඳහන් කරති.

වර්තමාන සමාජ තලය දෙස බැලීමේදී කතෝලික සභාවට මෙම කැපවූ ජීවිතයේ වැදගත්කම තහවුරු කරමින් එතුමෝ මෙසේ පවසති. "වත්මන් සමාජ විෂමතා සහ සාමාජීය මටසිළුටුබව හමුවේ පැන නගින අර්බුද සමාජයට, සභාවට මෙන්ම කැපවූ ජීවිතයට ද මහත් බලපෑමක් එල්ල කරන බව අපි හොඳාකාරව දනිමු. එහෙත් අප අදාළ අර්බුදකාරිත්වයට මුහුණ දෙන්නේ මරණයේ ද්වාරයට යන ගමනක් සේ සලකා නොවේ. අප එම අර්බුදයට මුහුණ දෙන්නේ ඇතුළාන්ත වර්ධනය කරා යන්නට ලැබෙන අවස්ථාවක් හා කැපවූ ජීවිතය බලාපොරොත්තු ඇති කරවන, සභාව තුළ නොනැසී පවත්නා, ජේසුතුමන් විසින්ම ප්‍රතිස්ථාපනය කර සභාගත කළ දායාදයක් ලෙස සලකමිනි.

ශුද්ධෝත්තම පියතුමන්ගේ ප්‍රකාශයේ තෙවන අරමුණ වන්නේ "වර්තමානයේ දේව ආදරයට සංවේදීව ජීවත්වීමට" මෙම විශේෂ බලාපොරොත්තුව අපව යොමු කළ යුතු බවයි. සසුන් පිය දැක්මට අනුව 2014 නොවැම්බර් 29 වන දින සිට 2016 පෙබරවාරි 02 දක්වා යෙදෙන සංවත්සර වර්ෂය තුළ සෑම සිදුවීමක් සහ සැමරීමක්ම අප පැවිදි කැඳවීම ප්‍රීතියෙන් පතළ කිරීමේ හා අප දිවිය තුළින් නන් අයුරින් ප්‍රකාශ වන ක්‍රිස්තු අනුගාමිකත්වයේ භාග්‍යයට සාක්ෂි දැරීමේ අවස්ථාවක් විය යුතුය.

තවද වර්තමාන ලෝකය තුළ දිවැසිවරයන් ලෙස සාක්ෂි දරමින් "ලොව අවදි කරවීමට" සුදුතුම් පියාණෝ පැවිදි අපට අභියෝග කරති. පෙර නොතිබූ සංකීර්ණ හා එදිරිවාදී වාතාවරණයක් තුළ ජීවත් වන්නන් සඳහා අවශ්‍ය ඇඩි ආධ්‍යාත්මික පිපාසයක් ලොව පුරා ජනතාව අතර පවතී. හුදෙක් බාහිර ක්‍රියාවලියකින් සෑහීමකට පත් නොවී ගැඹුරු, අවංක, හෘදයාංගම, පුළුල් ප්‍රාර්ථනයන් හා ආශාවන් සමුදායක් අප තුළ ගම්‍යමාන කිරීමේ අවශ්‍යතාව මෙයින් පෙන්වා දෙයි.

දේව ධර්මාචාර්ය කාල් රානර්ගේ ප්‍රකාශය මෙහිදී සිතා බැලීම වැදගත් ය. "21 වන ශත වර්ෂයේ කිතුනුවා අනිවාර්යයෙන්ම ගුප්ත මුනිවරයකු හෝ එසේත් නොමැති නම් කිසිසේත් කිතුනුවකු නොවීමයි" මෙයින් මනහරලෙස සනිටුහන් වන්නේ ඉක්මන්, කලබලකාරී පරිසරයක ජීවත් වන සෑම කෙනාම උත්තරීතර දේවෝත්මයාණන් හා සම්බන්ධතාවයෙන් පමණක් ගලා එන ඇතුළාන්ත සිත් සාමයෙන් සැරසී සිටිය යුතු බවයි. මිනිස් බහුතරය මේ පිළිබඳව අවදිවෙමින් සිටින අතර මේ දෙව් මිනිස් සුහදතාවයට ඔවුන් යොමු කළ හැකි ස්ථාන සහ මෙහෙයවන්නන් සොයමින් සිටිති. කිතුනු අනුගාමිකයන් ලෙස සුභාරංචිය අභියෝගාත්මකව ජීවත් වෙමින් ලොව තුළට කිඳා බැසීම අද පැවිදි දිවියට අදාළ වේ. එය හුදකලාව තුළ ස්වාබෝධය වෙත යන මාවතක් නොවන අතර අන්‍යෝන්‍ය සහයෝගිතාවයෙන් බැඳී නිදහස, සුහදබව සහ සාධාරණත්වය රජයන සමාජ ඒකකයන් ගොඩනැගීම සඳහා කරන ඇරියුමකි.

කිතු තුමන් අනුගාමි වීම එම ශ්‍රාවකයන්ව එක්තරා පොදු විවෘත ජීවිත රටාවකට යොමු කරවයි. කිසිවෙක් හුදකලා අනුගාමිකයෙක් නොවේ. සෙසු පැවිදි සංඝය එම පැවිදිවරයාට / වරියට අභියෝගයක් වන අතර සහයෝගයක් ද වේ. සීඝ්‍රයෙන් වෙනස් වන උපයෝගිතා සමාජයන් තුළ "කිරීමට" වඩා "පැවැත්මේ" වටිනාකම සංනිවේදනය කරන සලකුණක් අවශ්‍යය.

වත්මන් අභියෝගයන් ගැන සැලකිලිමත් වන අප සැමව කැඳවනු ලබන්නේ සියලු කිතුනුවන් හා අන්‍යාගමිකයන් සමඟ අත්වැල් බැඳ සහයෝගීව ක්‍රියා කරමින් අපගේ කැපවීම ජීවත් වීමටයි. වෙනස්කම් සමඟ ඇඩි අරගලයක යෙදෙන අප, වත්මන් ලෝකය නව හැඩ ගැස්මක් කරා යොමු කිරීමට "ඇරයුම් කරන" අපේ දිවි පැවැත්ම දෙස අවිශ්වාසයෙන්, දෙගිඩියාවෙන් හෝ අනුමානයෙන් නොබැලිය යුතුය.

එසේ නම් අප සැමගේ වගකීම වන්නේ 21 වන සියවසේ අව්‍යාජ කිතුනු අනුගාමිකයන් වනු සඳහා මෙම කැඳවීමට විශ්වාසවන්ත වීමේ මං සෙවීමයි. ඒ සඳහා ප්‍රබල නිර්මාණශීලිත්වයක් සහ එඩිතර එඬෙරිකත්වයක් අවශ්‍යය.

පැවිදි ශ්‍රේෂ්ඨයන්ගේ සම්මේලනයේ සභාපති
**ගරු ජේයරාජ් රාසයියා ජේ. නි. පියතුමා**

# දෙවන වතිකාන
# පැවිදි ජීවිත

අප අතර ජීවත්වන වයස පනහ ඉක්ම වූවන් තුළ එක්තරා පැවිදි ජීවිත ක්‍රමයක් පිළිබඳ මතකයක් රඳා පවතිනවාට සැකයක් නැත. සාන්තු සේවය, ඉගැන්වීම වැනි සේවාවන්හි ඇප කැප වී පරිත්‍යාග ශීලිව යෙදී සිටි පැවිදිවරුන්ට හා වරියන්ට ඔවුන්ටම විශේෂ වූ එක්තරා ජීවිත රටාවක් විය. ඔවුන්ගේ ඇඳුම් එක්තරා ක්‍රමයකට සැකසී තිබුණි.



අපෝස්තලික සේවාව හැරුණු විට ලෝකය සමඟ වැඩි සම්බන්ධතාවයක් නොමැති විය. තම පවුලේ සාමාජිකයින් සමඟ පවා පැවතියේ ඉතා සීමිත සම්බන්ධතාවයකි. පැවිදි වූවන්ගේ මානුෂික ජීවිතය කෙබඳු එකක් ද යන්න ගැන පිටස්තර පුද්ගලයන්ට කිසිම අවබෝධයක් නොවීය. පැවිදි වූවන්ගේ සෑම ක්‍රියාවක්ම නීතියෙන් පාලනය විය. ඔහු හෝ ඇය කළ යුතු දේ, නොකළ යුතු දේ, කළ යුතු ආකාරය යන සියල්ල ව්‍යවස්ථාවේ දක්වා තිබුණි. සාංඝික ජීවිත රටාවද එක්තරා ක්‍රමයකට සැකසී තිබුණ අතර එය වෙනස් කිරීම එතරම් පහසු නොවීය. පැවිදි වූවන් වචනයක්වත් නොදොඩා ශ්‍රේෂ්ඨයාට කීකරු විය යුතුවිය. පැවිදි ජීවිතයට ඇතුළුවීම සැලකුවේ ලෝකය හැරයාමක් ලෙසය; ලෝකයෙන් සම්පූර්ණයෙන්ම වෙන්වීමක් ලෙසය. නැතහොත් ලෝකයට මිය යාමක් ලෙසය.

එහෙත් අද තත්ත්වය වෙනස්ය. මෙම වෙනසට හේතු වූයේ 1963 - 65 වර්ෂවල පැවැත් වූ දෙවන වතිකාන මන්ත්‍රණ සභාව බව අප කවුරුත් දන්නා කරුණකි. මෙම ලිපියෙන් අප උත්සාහ කරන්නේ දෙවන වතිකාන කතිකාවත, පැවිදි ජීවිතය තුළ ඇති කරන ලද නවෝදය විවිධ අංශවලින් සලකා බැලීමටයි.

මුළු ශුද්ධවූ සභාවම නව පණගැන්වීම අරමුණු කරගත් වතිකාන කතිකාවත සභා ජීවිතයේ සෑම අංශයක් වෙතම අවධානය යොමු කළේ ය. සභා ජීවිතයේ වැදගත් තැනක් හිමි කරගන්නා පැවිදි ජීවිතය ද මේ අනුව සැලකිල්ලට භාජනය කරන ලදි. වතිකාන කතිකාවතෙන් පසුව ප්‍රසිද්ධ කරන ලද එක් සම්පූර්ණ ප්‍රකාශනයකුත් තව ප්‍රකාශනයක එක් පරිච්ඡේදයකුත් මේ සඳහා වෙන් කර ඇත.

1. පැවිදි ජීවිතයේ අවස්ථානුකූල ප්‍රතිසංස්කරණය පිළිබඳ ප්‍රකාශය (Perfectae Caritatis)

2. ශුද්ධවූ සභාව පිළිබඳ ව්‍යවස්ථාව 6 (Lumen Gentium) වන පරිච්ඡේදය

මින් දෙවැන්නෙහි පැවිදි ජීවිතය පිළිබඳ ධර්මානුකූල ඉගැන්වීම් අඩංගු වන අතර පළමුවන ලේඛනය සම්පූර්ණයෙන්ම වෙන්කර ඇත්තේ පැවිදි ජීවිතයේ නවෝදය පිළිබඳ මඟපෙන්වීම සඳහා ය. මේ ලේඛන දෙක පමනක් වෙන වෙනම ගෙන අධ්‍යයනය කිරීම ප්‍රමාණවත් නැත. ඒවා අනිකුත් ලේඛන සමඟ විශේෂයෙන් "නූතන ලෝකයේ ශුද්ධවූ සභාව" පිළිබඳ ලේඛනය සමඟ එකට අධ්‍යයනය කළ යුතුය.

## පැවිදි ජීවිතයට හිමිවන තැන

වතිකාන කතිකාවතට පෙර ජීවිත තත්ත්වය පිළිබඳ පැවැති අවබෝධය අනුව එක ජීවිත තත්ත්වයක් අනිකට වඩා උසස් හෝ පහත් කොට සැලකීමේ පුරුද්දක් පැවතුණි. මේ අදහස වතිකාන කතිකාවත තුළින් වෙනස් වී ඇත. ශුද්ධවූ සභාව පිළිබඳ ප්‍රකාශනයෙහි පැවිදි ජීවිතයට දී ඇති ස්ථානය සලකා බැලීමෙන් මෙය තරමක් දුරට අවබෝධ කර ගත හැකිය. එය පැවිදි වූවන් වෙත අවධානය යොමු කරන්නේ සමස්ත දේව ජනතාව, ගිහියා, ශුද්ධවන්ත භාවය සඳහා මුළු සභාවටම ලැබී ඇති කැඳවීම වැනි කරුණු සලකා බැලීමෙන් පසුවය. ඉන් පෙනී යන්නේ මුළු දේව ජනතාව අතර යම් ස්ථානයක් පැවිදි වූවන්ට හිමිවන බවයි. ශුද්ධවන්තවීම සඳහා පැවිදි වූවන්ට ලැබෙන කැඳවීම ඒ සඳහා මුළු ශුද්ධවූ සභාවටම ලැබෙන කැඳවීම තුළ අන්තර්ගතව ඇත. පැවිදි ජීවිතයට, ගිහි ජීවිතයට වඩා උසස් තැනක් හෝ පහත් තැනක් හිමිවන බව ඉන් ඉඟි නොකෙරේ. එහෙත් දේව ජනතාව අතර, ශුද්ධවූ සභාව තුළ ඊට වැදගත් තැනක් හිමිවේ.

ප්‍රසාද ස්නාපනය මඟින් පුද්ගලයා පාපයට මැරී, දෙවියන් වහන්සේට කැපවී ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රසාද ස්නාපනයේ වරප්‍රසාදයෙන් වැඩි පල, අත්කර ගැනීම සඳහා ඔහු වේදහාර මඟින් සභාව තුළ කැපවීමට අදහස් කරයි. (ශු. ස. 44)

ඔව්හු ප්‍රසාද ස්නාපනයේදී තමන් කළ කැපවීම පදනම් කොට ඇති තවත් විශේෂ කැපවීමකින් තමන්ගේ මුළු ජීවිතයම දෙවියන් වහන්සේගේ සේවාව සඳහා පවරා දෙමින් පෙර කී ප්‍රසාද ස්නාපනයේ දී කළ කැපවීම තවත් දුරට ප්‍රකාශ කරන්නෝ ය.
(පැ. ජී. 5)

මේ අනුව පැවිදි කැපවීම ප්‍රසාද ස්නාපනයේ කැපවීම තුළම මුල් බැස ඇත. එය ප්‍රසාද ස්නාපනයේ කැපවීම වඩා ගැඹුරින්, වඩා විශේෂ ආකාරයකින් ජීවත් වීමකි. මෙහි දී "වඩා" යනුවෙන් අදහස් කරන්නේ "ගිහියාට වඩා ගැඹුරින්" හෝ "ගිහියාට වඩා විශේෂ ආකාරයකින්" යන්න නොව කලින් ජීවත් වූවාට වඩා ගැඹුරින් හා විශේෂාකාරයකින් යන්නය. පැවිදි ජීවිතය ප්‍රසාද ස්නාපනයේ කැපවීම වඩා අර්ථවත්ව ජීවත්වීම සඳහා ඇති විකල්පීය මාර්ගවලින් එකකි. ඒ සමඟම එය ඉතා වැදගත් එකකි. පැවිදි ජීවිතය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන ලෙස "සුවිශේෂක අනුශාසනා වෘත්තියක් කොට ගැනීමෙන් කැප කරනු ලබන ජීවිතයෙහි අත්‍යුත්කෘෂ්ට වටිනාකමක් ඇත්තේ ය." (පැ. ජී. 1) එය සභාවේ ජීවිතයට හා ශුද්ධවන්තභාවයට කෙලින්ම සම්බන්ධ වේ. (ශු. ස. 44)

## නවෝදයට අදාළ ප්‍රධාන සාධක දෙකක්

පැවිදි ජීවිතයේ නවෝදය ගැන කතා කිරීමේදී වතිකාන මන්ත්‍රණ සභාව මූලික මඟ පෙන්වීම් දෙකක් ඉදිරිපත් කරයි.

1. ක්‍රිස්තියානි ජීවිතයේ ප්‍රභවයන් වෙතට හා නිකාය ආරම්භ කළ තැනැත්තාගේ ආරම්භක අදහස වෙතට හැරී යාම.

2. කාලයේ වෙනස්වීම් සලකා බලා ඒ අනුව පැවිදි නිකාය තුළ වෙනස්කම් ඇති කිරීම.

පැවිදි ජීවිතයේ නවෝදය ගැන කතා කිරීමේදී මේ කරුණු දෙක වෙතම අවධානය යොමු කළ යුතුය. පළමු වැන්න වෙත පමණක් අවධානය යොමු කළහොත් එය ආපස්සට හැරී යාමක් බවට පත් වේ. එවිට වෙනස්වන ලෝකයට අදාළ නොවන අවලංගු කාසියක් බවට පැවිදි ජීවිතය පත් වනු ඇත. දෙවැන්න වෙත පමණක් අවධානය යොමු කළ හොත් එය පදනම් විරහිත වෙනස්වීමක් බවට පත් වනු ඇත. ඉන් ක්‍රිස්තියානි අනන්‍යතාවයට හා පැවිදි නිකායට විශේෂිත වූ අනන්‍යතාවයට හානි පැමිණේ. එසේ වුවහොත් ශුද්ධවූ සභාව තුළ පැවිදි නිකායක් වශයෙන් පැවතීමට තරම් හේතුවක් නැතිවී යනු ඇත. ඒ නිසා මූලාරම්භය වෙතට හැරී යාමත් වර්තමාන ලෝකයට විවෘත වීමත් යන දෙක වෙනම අවධානය යොමු කළ යුතුය. මෙම මඟ පෙන්වීම්

# ... කතිකාව සහ ...යේ නවෝදය



...ව පැවිදි ජීවිතයේ නවෝදය ...ති වන්නේ නිකාය ආරම්භ කළ ...නැත්තාගේ ස්ප්‍රීතුව වර්තමානයට ...න ඒමෙන් ය. එය ආරම්භක ...නැත්තා කළ දේ එලෙසින්ම ...මක් නොව, එම තැනැත්තා අද ...යා නම් කුමක් කරාවිදැයි විමසා ...ා එය කිරීමකි. මේ මඟින්ය පදනම් ...ත අර්ථවත් සැබෑ නවෝදයක් ...තිවන්නේ.

## ...විශේෂක ජීවිතය

...ශුද්ධවූ සුවිශේෂය සැම පැවිදි ...කුගේම මූලික ජීවිත රීතිය බව ...කාන කතිකාවත අවධාරණයෙන් ...ා සිටියේ ය. පැවිදි ජීවිතය ...තුන් වහන්සේ සමඟ ඒකාබද්ධවූ ...තයකි.

...සුවිශේෂයෙන් හඳුන්වා දෙනු ...න ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේ ...ගමනය කිරීම පැවිදි ජීවිතයේ ...ක න්‍යාය වන හෙයින් සියළු ...විදි පංති විසින් එම අති ශ්‍රේෂ්ඨ ...මෙය වශයෙන් සැලකිය යුතුය. ...ජී. 2:1) සැම පැවිදි නිකායකම ...ක නීතිය ශුද්ධවූ සුවිශේෂයයි. ...වස්ථාවලින් සුවිශේෂයට කිසිවක් ...තු නොකෙරේ. එසේම එය ...ධවූ ලියවිල්ලට අමතර ලියවිල්ලක් ...නොවේ. එය නිකායේ විශේෂ ...භාවයට හා අවස්ථාවට අදාළ ...ආකාරයෙන් ශුද්ධවූ සුවිශේෂය ...ළු දැක්වීමක් පමණි. ඒ නිසා පැවිදි ...න් තම නිකායේ ව්‍යවස්ථාවට ...වාසවන්ත වන අතර ඊටත් වඩා ...ශේෂයට විශ්වාසවන්ත විය යුතුය. ...විදි පුහුණුව දීමේදී ව්‍යවස්ථාව ...න්වා දීමට පෙර ශුද්ධවූ සුවිශේෂය ...බඳ ගැඹුරු අවබෝධයක් ලබා දිය ...ය.

...පැවිදි ජීවිතය මෙලෙසින් ...ශේෂයට මුල් තැන දිය යුත්තේ ...විදි ජීවිතය ක්‍රිස්තු කේන්ද්‍රීය ...තයක් වන නිසාය. දෙවියන් වහන්සේටම කැපවූ ජීවිතයක් වන නිසා ය. වතිකාන කතිකාවත නැවත නැවතත් මෙම කරුණ අවධාරණය කරයි.

පැවිදි ජීවිතයේ පරමාර්ථය වනුයේ ඒ ජීවිතය වැළඳ ගත්තන් සියල්ලටම පෙර ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේ අනුගමනය කිරීම හා සුවිශේෂක අනුශාසනා මඟින් දෙවියන් වහන්සේට ඒකාබද්ධ වීමය. (පැ. ජී. 2:5)

ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේව අනුගමනය කරනු සඳහා සිය කැමැත්තෙන්ම වැළඳගනු ලබන දිළිඳුකම, විශේෂයෙන් වර්තමාන කාලයෙහි ඉතා අගය කරනු ලබන සාක්ෂියක් වන්නේ ය. (පැ. ජී. 13)

මේ අනුව පැවිදි ජීවිතය ක්‍රිස්තුන් වහන්සේ සමඟ උන්වහන්සේ උදෙසා වැයවන ජීවිතයකි.

## ලෝකය වෙත අවධානය

කැපකිරීම යනු වෙන්කිරීමකි. එහෙත් එය නිකන්ම වෙන්කර තැබීමක් නොව යම්කිසි කාර්යයක් උදෙසා වෙන් කිරීමකි. ඒ අනුව දෙවියන් වහන්සේට කැපවූ ජීවිතය අන් අය උදෙසා වෙන් වූ ජීවිතයකි. සැබෑ පැවිදි ජීවිතය දෙවියන් වහන්සේ වෙතටත් සහෝදරයා වෙතටත් නැඹුරු වූවකි. මෙය අපෝස්තලික පැවිදි ජීවිතය, ධ්‍යානශීලි පැවිදි ජීවිතය යන දෙකටම පොදුය. දෙවියන් වහන්සේව අමතක කර සහෝදරයා සොයා යෑමත් සහෝදරයා අමතක කර දෙවියන් වහන්සේව සොයා යෑමත් යන දෙකම සැබෑ ක්‍රිස්තියානිකමට හා පැවිදි කමට පටහැනිය.

සුවිශේෂක අනුශාසනා අනුව ජීවත්වීම තමන්ගේ වෘත්තිය කොට ගන්නේ අප ප්‍රේම කරන්නට පෙර අපට ප්‍රේම කළ (ජුවාම් 4:10) දෙවියන් වහන්සේව සියලු දේට ඉහළින් සොයා උන්වහන්සේට ප්‍රේම කරමින් සියලු අවස්ථාවලදී ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේ සමඟ දෙවියන් වහන්සේ තුළ සැඟවුණ ජීවිතයක් වර්ධනය කර ගැනීම තමන්ගේ අරමුණ කර ගනිත්වා. මේ කැපවීම හේතුකොට ගෙන ලෝකයේ ගැලවීම සඳහා ද ශුද්ධවූ සභාවේ සංවර්ධනය සඳහා ද අත්‍යවශ්‍ය සහෝදර ප්‍රේමය ප්‍රබෝධ වන්නේ ය. (පැ. ජී. 6)

කැපවීම දූත කාර්යය සඳහාය යන්න අද අපට සැහෙන පමණ හුරුපුරුදු කියමනකි. පැවිදි වූවන්ගේ අපෝස්තලික සේවාවන් මඟින් මේ දූත කාර්යය ක්‍රියාකාරි ලෙස ප්‍රකාශ වේ.

මේ පැවිදි පංතිවල සාමාජිකයන්ගේ පැවිදි ජීවිතයේ ජීවය ධර්මදූත සේවාවට ලැදිකම විය යුතුය. ඔවුන්ගේ මුළු ධර්මදූත ක්‍රියාකාරිත්වය පැවිදි ජීවිතයේ ආධ්‍යාත්මික ගුණයෙන් සාරවත් විය යුතුයි. එහෙයින් පැවිදි පංතිවල සියළුම සාමාජිකයින් ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කිරීමේ කැඳවීමට අනුකූලතාවය දක්වනු සඳහා ද, ක්‍රිස්තුස් වහන්සේගේ අවයවයන් වන මනුෂ්‍යයන් තුළ උන්වහන්සේටම සේවය කරනු සඳහා ද, ඔවුන්ගේ ධර්මදූත ක්‍රියාකාරිත්වය උන්වහන්සේට කිට්ටු ලෙස සම්බන්ධවීමේ ප්‍රතිඵලයක් විය යුතුයි. මේ ආකාරයෙන් දෙවියන් වහන්සේ වෙත ප්‍රේමය ද අසල්වැසියා වෙත ප්‍රේමයද ශේෂය කරනු ලබන්නේ ය. (පැ. ජී. 8)

කෙසේ වෙතත් මෙම දූත කාර්යය හුදු සේවාවකට සීමා කළ නොහැක. පැවිදි වූවන්ගේ මුළු ජීවිතයම ඊට අදාළ විය යුතුය. මහළු බව හෝ රෝගී බව නිසා සේවාවක යෙදිය නොහැකි තත්ත්වයක සිටින පැවිදි වූවන් අන් අය උදෙසා ජීවත්වීම මඟින් එම දූත කාර්යය ඉටු කරයි. ධ්‍යානශීලි ජීවිතයක් ගත කරන්නෝ ද බාහිර සේවාවක නොයෙදුනොත්, අන් අය උදෙසා ජීවත්වීම ඔවුන් වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ යාච්ඤා කිරීම හා ජීවිත සාක්ෂිය මඟින් තම දූත කාර්යය ඉටු කරති. (පැ.ජී. 7)

## සභාව තුළ ජීවිතය

දෙවියන් වහන්සේට කැපවී ජනතාව උදෙසා ජීවත්වන පැවිදි වූවන් යම් නිකායකට අයත් වේ. නිකායේ ජීවිතය කෙළින්ම ශුද්ධවූ සභාවේ ජීවිතයට සම්බන්ධය. සභාව තුළ පැවිදි ජීවිතය, පූජක ජීවිතය හා ගිහි ජීවිතය අතර, අතරමැදි තත්ත්වයක් නොවේ. මේ තත්ත්ව දෙකටම අයත් වූවන්ගෙන් සම හරෙකුට මෙම ජීවිත තත්ත්වයට කැඳවා ඇත. ඔවුන්ට එසේ කැඳවා ඇත්තේ සභා ජීවිතය තුළ විශේෂ දීමනා භුක්ති විඳීමට හා තමන්ට විශේෂිත ආකාරයකින් සභාවේ ජීවිතයට සහභාගි වීම සඳහාය. 6ශු. ස. 43)

පැවිදි ජීවිතය පිළිබඳ ප්‍රකාශනය ද මේ කරුණ ගැන තවදුරටත් සඳහන් කරයි.

"සියළු පැවිදි පංති ශුද්ධවූ සභාවේ ජීවිතයට සහභාගි විය යුතුය. තමන්ට විශේෂ වූ ලක්ෂණයන අනුව ශ්‍රාද්ධ ලියවිලි, දේව ජනතාවගේ පොදු වන්දනාව, ක්‍රිස්තියානි ධර්මය, ආත්මයනට මඟපෙන්වීම, කතෝලිකයන් නොවන අය සමඟ සම්බන්ධකම්, ධර්මදූත සේවා, සමාජ කර්තව්‍යයන් යන මේවා තමන්ගේම කටයුතු ලෙස සලකා ශුද්ධවූ සභාවේ ව්‍යාපාරයන් හා අරමුණු ක්‍රියාත්මක කිරීමට උනන්දු විය යුතුය. (පැ. ජී. 2:3)

මේ අනුව පැවිදි වූවන්ට සභාව තුළ මුළු ගැන්වී සිටිය නොහැකිය. සභාවේ අවශ්‍යතාවයන්ට විවෘතව සිටිමින් ඊට පිළිතුරු දිය යුතුය; සභාවේ ඉගැන්වීම් වලට ඇහුම්කන් දී ඊට අවනත විය යුතුය. සැම පැවිදි පංතියක්ම අන් අය උදෙසා සභාවට ලැබී ඇති දීමනාය. ඒ නිසා එම දීමනාවේ විශේෂත්වය රැක ගනිමින් සභා ජීවිතයට සහභාගි විය යුතුය. තම නිකාය ආරම්භ කළ තැනැත්තාගේ ස්ප්‍රීතුව හා මඟ පෙන්වීම් වර්තමානය තුළ ජීවමාන කිරීම මඟින්, තම විශේෂත්වය රැකගැනීමට පැවිදි නිකාය වලට හැකිවේ. සභා ජීවිතයේ සහ සමාජීය ජීවිතයේ අවශ්‍යතාවයන් අමතක වන තරමට තම නිකාය වෙතටම නැඹුරු වීම සුදුසු නැත. පැවිදි නිකාය සැම විටම අන් අය හා එක්ව දිව්‍ය රාජ්‍යය සඳහා කටයුතු කිරීමට සූදානම්ව සිටිය යුතුය.

## නිගමනය

වතිකාන කතිකාවත අවසන් වී වසර විස්සක් පමණ ගෙවී අවසානය. මේ කාලය තුළ පැවිදි නිකාය ප්‍රතිසංස්කරණය සම්බන්ධ වැඩකටයුතු රාශියක් කෙරී ඇති අතර, සභා මාතාව ද නැවත නැවතත් අදාළ උපදෙස් දීම හා දිරි ගැන්වීම මඟින් පැවිදි ජීවිතය කාලයට හා ස්ථානයට අර්ථවත් කිරීමට වෙහෙසී ඇත. ඒ කරුණු කෙසේ වෙතත් පැවිදි ජීවිතය සැබවින්ම අර්ථවත් වීමට නම් එක එක පැවිදි වූවන් තමන් තුළ මෙම නවෝදය ජීවමාන කළ යුතුය. දෙවියන් වහන්සේටත් අන්‍යයන්ටත් කැපවූ ජීවිතයක් මඟින් එය පිළිබිඹු විය යුතුය. මෙය මුළු ජීවිත කාලයක් මුළුල්ලේ සිදුවන කාර්යයක් වන අතර නවෝදයේ පූර්ණත්වයට පැමිණිය හැක්කේ අවසානය තෙක් නොපසුබට වීර්යයෙන් ඉදිරියට යාමෙන් පමණි.

# ශ්‍රී ලංකාවේ ප්‍රථමයෝ

**දිවයිනේ ප්‍රථමයන් වූ කිහිපදෙනකු ගැන ඉකුත් සතියේ සඳහන් කෙළෙමු. එසේ ම ප්‍රථම තැන හිමිවන තවත් කිහිප දෙනෙකු පිළිබඳව ද මෙවර මෙහි පහත දක්වමු.**

රෝමයේ උර්බානෝ සරසවියේ අධ්‍යාපනය ලබනු සඳහා දිවයිනෙන් එහි යවන ලද ප්‍රථම ශිෂ්‍යයා වූයේ කොර්නීලියස් ජස්ටස් බ්‍රෑන්ට් ප්‍රනාන්දු සහෝදරතුමා ය. පදවි පූජක පුහුණුව සඳහා එතුමා 1843 සිට 1851 දක්වා එහි ඉගෙනීම ලැබුවේ ය.

දිවයිනට ප්‍රථමයෙන් පැමිණි පැවිදි කාන්තා නිකාය ශුද්ධවූ පවුලේ පැවිදි නිකාය යි. එම නිකායේ සහෝදරියන් හය දෙනෙක් ප්‍රථම වරට යාපනයට පැමිණියේ ක්‍රි.ව. 1862 දී ය.

නිමල මරිය නිකායට බැඳුණු ප්‍රථම ලාංකිකයා වූයේ ගරු පෝල් ස්ටීවන් පූරේ සහෝදරතුමා ය. එතුමා 1861 දී පරලෝ සැපත් විය.

ජේසු නිකායට දිවයිනෙන් ප්‍රථම වරට ඇතුළු වී ඇත්තේ කොළඹ උපත ලද පෘතුගීසි ජාතික එම්මානුවෙල් ද කොස්තා නමැත්තෙකි. එතුමන් ක්‍රි.ව. 1608 දී එම නිකායට ඇතුළු වී 1620 දී පූජාත්වරය ලබා ඇත.



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු අති උතුම් **ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**189**

ඉනික්බිති ප්‍රථම වර එම නිකායට බැඳී ක්‍රි.ව. 1905 දී පූජකවරය ලබා ඇත්තේ වියත් ඉතිහාසඥයකු වූ ගරු එස්. ජී. පෙරේරා පියතුමා ය.

කොළඹ ප්‍රථම අගරදගුරු පදවි ප්‍රාප්ත වූ උත්තමයාණන් වූවෝ අති උතුම් ක්‍රිස්ටෝෆර් බොන්ජීන් අගරදගුරු හිමිපාණන් වහන්සේ ය. එතුමාණන් අගරදගුරු වශයෙන් පත්වීම් ලැබුවේ ක්‍රි.ව. 1887 දී ය.

රදගුරු තනතුරට ඔසවන ලද ප්‍රථම ලාංකිකයා වූයේ අති උතුම් බීඩ්. බෙක්මියර් හිමිපාණන් ය. බර්ගර් ජාතික එතුමන් ක්‍රි.ව. 1911 දී නුවර රදගුරු ලෙස පත් කරන ලදි. එතුමන් අයත් වූයේ සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායටයි.

ප්‍රථම වර රදගුරු අභිෂේක ලැබූ සිංහල උත්තමයා වූයේ හලාවත අති උතුම් එඩ්මන් පීරිස් හිමිපාණෝ ය. නව හලාවත රදගුරු වසමේ රදගුරු හිමිපාණන් වශයෙන් එතුමන් පත් වූයේ ක්‍රි.ව. 1940 දී ය.

හලාවත රදගුරු වසම ආදියේ දී කොළඹ අගරදගුරු වසමේ කොටසක් විය. වයඹ පළාත වෙන් කැර නව හලාවත රදගුරු වසම ලෙස පිහිටුවන ලද්දේ 1939 දී ය. එහි ප්‍රථම රදගුරු වශයෙන් පත්කරන ලද්දේ මාහිමි ඇලෝසියුස් පියතුමාණන්ව යි. එහෙත් රදගුරු අභිෂේක ලබන්නට පෙර එතුමෝ ස්වර්ගස්ථ වූහ.

දිවයිනේ රදගුරු අබිසෙස් ලද ප්‍රථම දෙමළ ජාතිකයාණන් වූයේ අති උතුම් එමිලියානුස් පිල්ලේ හිමිපාණන් ය.

ක්‍රි.ව. 1949 දී යාපනයේ යුව රදගුරු වශයෙන් පත් කරන ලද එතුමන් යාපනයේ ප්‍රථම දේශීය රදගුරු හිමිපාණන් ලෙස වැඩ භාර ගත්තේ ක්‍රි.ව. 1950 දී ය.

අති උතුම් තෝමස් කුරේ හිමිපාණන් ප්‍රථමයා වීම අතින් අති විශිෂ්ට යි. කුඩා පූජක සිසුහලේ සිට ප්‍රථමයා වීමේ වාර්තා රැසක් එතුමන් සතු අතර දිවයිනේ ප්‍රථම අගරදගුරු, ප්‍රථම සිංහල අගරදගුරු සහ ප්‍රථම කාදිනල් හිමිපාණන් වීමේ වාර්තාව ද එතුමා අයත් කැර ගත්තේ ය. එතුමන් කොළඹ යුව අගරදගුරු වශයෙන් පත්කරනු ලැබුවේ ක්‍රි.ව. 1945 දෙසැම්බර මස 14 වැනි දා ය. රදගුරු අබිසෙස් ලැබීම 1946 මාර්තු 7 වැනි දා පැවැත්වුණු අතර 1947 ජූලි මස 28 වැනි දා අගරදගුරු පදවි කටයුතු භාරව පත්විය.

එතුමනට කාදිනල් තනතුර 1965 පෙබරවාරි මස 22 දා පිරිනමන ලද අතර ප්‍රථම වරට ශුද්ධෝත්තම පියතුමකු පත් කිරීම සඳහා (දෙවරක්) ඡන්දය පාවිච්චි කිරීමේ භාග්‍ය හිමි වූ ලාංකිකයා එතුමාණෝ ය.

දිවයිනේ රදගුරු වරම් ලද ප්‍රථම පදවි පූජකතුමා අති උතුම් ඇන්තනි ද සේරම් රදගුරු හිමිපාණන්ය. ක්‍රි.ව. 1963 මාර්තු 25 වැනි දා එතුමන් කොළඹ සහායක වශයෙන් රදගුරු අබිසෙස් ලද අතර 1965 දී එතුමෝ ගාල්ල රදගුරු හිමිපාණන් වශයෙන් පත්වීම් ලදහ.

ප්‍රථම වරට ශුද්ධාසනයේ නියෝජිතයකු ලෙස වතිකාන තානාපති ධුරය ලබා ගත් ලාංකිකයා අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ය. එතුමන් ඉන්දුනීසියාවේ අපෝස්තලික තානාපති වශයෙන් පත් කරන ලදි.

කොළඹ අගරදගුරු වසම දිගු කලක් නිමල මරිය නිකායේ භාරකාරත්වයේ පැවැති හෙයින් 1887 සිට ම කොළඹ අගරදගුරු තනතුරු හෙබවූවෝ නිමල මරිය නිකායේ පියවරුම ය. එහෙත් ක්‍රි.ව. 1977 එම තත්ත්වය වෙනස් විය. මේ අනුව ප්‍රථම වරට කොළඹ අගරදගුරු තනතුරට පත් වූ පදවි පූජක අගරදගුරු හිමිපාණන් වූයේ අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් ය.

කොළඹ පදිංචිව සිට ලංකාව සඳහා ම විශේෂ අපෝස්තලික නියෝජිතයකු වශයෙන් ප්‍රථම වරට පත්වීම් ලබා සිටියේ මාහිමි (පසුව අගරදගුරු) ලුචියානෝ ස්ටොරේරෝ හිමිපාණන් ය. ක්‍රි.ව. 1969 පත්කරන ලද එතුමා කොළඹ පදිංචිව සිටියේ නො. 1, ගවර් වීදියේ තම නිල නිවසේ ය.

ප්‍රථම අපෝස්තලික තානාපති වශයෙන් පත්වීම් ලබා දිවයිනේ පදිංචිව සිටියේ අති උතුම් කාර්ලෝ කුරිස් අගරදගුරු හිමිපාණන් ය. ශ්‍රී ලංකාව හා වතිකානය හා අතර තානාපති සම්බන්ධතා ආරම්භ කරන ලද්දේ 1976 දී ය. මේ අනුව දෙරට අතර තානාපතිවරුන් පත්කැර ගන්නා ලදි.

දිවයිනේ ම ආරම්භ කරන ලද ප්‍රථම පැවිදි නිකාය ශුද්ධවූ ජුසේ මුනිඳුන් ගේ සහෝදර නිකාය යි. ක්‍රි.ව. 1864 අප්‍රේල් මස 17 වැනි දින එය යාපනයේ දී ආරම්භ කරන ලද්දේ ගරු ක්‍රිස්ටෝෆර් බොන්ජීන් පියතුමන් (එවකට) විසිනි.

මෙවැනි ප්‍රථම ස්ථාන හිමිවන තවත් රැසෙකි. ඒ සියල්ල මෙහි සඳහන් නො වන්නේ ය. මෙහි සඳහන් කරන ලද්දේ අප පාඨකයන්ට වැදගත් වනු ඇතැයි සිතූ ස්වල්පයක් පමණි.

(මෙම ලිපිය සඳහා දත්ත ප්‍රධාන කොට මාහිමි ඩබ්. එල්. ඒ. දොන් පීටර් හිමිපාණන් ගේ ග්‍රන්ථයන් ඇසුරෙන් ලබා ගත් බව ගුණවත්ව සඳහන් කරනු කැමැත්තෙමි.)

# 'කිතු ගී ස්වර අභිමන්'




රත්නපුර පදවි කතෝලික තරුණ සංගමය සංවිධානය කළ 'කිතු ගී ස්වර අභිමන්' සාහිත්‍ය දිනය පසුගිය දා අවිස්සාවේල්ල නගර ශාලාවේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි සා.බෙ.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

කිතුනු ගීත සාහිත්‍ය වෙනුවෙන් ඉමහත් මෙහෙවරක් කළ අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි රදගුරු හිමිපාණන්, ගරු පෝල් ප්‍රනාන්දු සහ ගරු සර්ජියස් ප්‍රනාන්දු පියතුමන්ගේ මෙහෙවර අගයමින් උපහාර පිදීම මෙහිදී සිදුවිය. රත්නපුර පදවියේ හිටපු තරුණ කටයුතු අධ්‍යක්ෂ පියවරුන් සහ තරුණ නායකයන් අගයමින් සමරු තිළින පිරිනැමීමක්ද සිදු කෙරුණු අතර රත්නපුර පදවි අනුනායක අතිගරු ඩේමියන් ප්‍රනාන්දු, ජාතික කතෝලික තරුණ කටයුතු අධ්‍යක්ෂ ගරු ගිහාන් ගුණතිලක ඇතුළු ගරු පියවරුන් රැසක් උත්සවයට සහභාගි වූහ. රත්නපුර පදවි තරුණ කටයුතු අධ්‍යක්ෂ ගරු ජීවන්ත පීරිස් පියතුමාගේ මඟ පෙන්වීම මත මෙය සංවිධානය විය.

**නිමේෂ් සමීර පෙරේරා**

# කිතුනු සිනමා නළුවාට ගමෙන් උපහාර



1960 දශකයේ සිංහල සිනමා අඹරේ අග්‍රගන්‍ය සිනමා නළුවකු වශයෙන් සිය දස්කම් විදහා දැක්වූ බොනිෆස් ප්‍රනාන්දු මහතාට කටාන, මඩම්පැල්ලේ කටුලන්ද ග්‍රාමයේ ප්‍රදේශ වාසීන් විසින් උපහාර උලෙළක් පවත්වන ලදි.

මේ උත්සවයට බෝලගල විහාරාධිපති පූජ්‍ය බදුල්ලේ නන්දාරාම හිමියන් සමග ගරු ලක්නාත් කුරේ පියතුමා සහ ආරාධිත අමුත්තන් රැසක් එක්වූහ.

එදින ඔහු රඟපාන සිරිමලි සුදු සදේ කළු වලා, සුහද දිවි පිදුම යනාදි චිත්‍රපටවල ජවනිකා රැගත් කෙටි සිනමා දැක්මක් ද තිරගත කරන ලදි. දැනට 80 වැනි වියේ පසුවන බොනිෆස් සිනමා රංගධරයන් රෝගාතුරව සිටියත් රැස්ව සිටි මහජන හමුව අබියස දී කලා කුසලතාවයෙන් සමාජයට ඉටුකළ හැකි සේවය පිළිබඳව උත්සව සභාව දැනුම්වත් කළේය. ප්‍රදේශවාසීන් සමග ආර්ථික සංවර්ධන නිලධාරි චන්දිමාල් ෆොන්සේකා මහතා උත්සව කටයුතු සංවිධානය කිරීමට නොමසුරු සහයෝගය දුනි.

**සටහන - සුභාෂිණී මදුරාවල**
**ඡායා - එච්. ඒ. කල්දේරා**



පැරණි නාඩගම් ගීතයන්ට පණපොවමින් වත්තල වැඩිහිටි දිනයේදි නාඩගම් ගීයෙන් සැමදෙනාම අමන්දානන්දයට පත්කරමින් වත්තල නගර සභා ශාලාවේදී තම සහජ දක්ෂකම් පෙන්වූ පමුණුගම වැඩිහිටි සංවිධානයේසාමාජිකයෙකුවන ජෝශප් ගම්ලත් මහතා අකීකරු පුත්‍රයා නාඩගම් ගීතයක් මෙසේ ඉදිරිපත් කරන ලදි.

**- බෙන්ජමින් කිරිහෙට්ටි**



කතෝලික කලාකරුවන් සඳහා ධර්ම විවේකයක් හංවැල්ල හල්ගස්හේන එමාඩ් කැම්ප්බෙල් ධර්ම විවේකාගාරයේදී ගරු සිසිල් ජෝයි පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙම ධර්ම විවේකය දේව ප්‍රේමයේ ගැඹුර තුළ දෙවිඳුන්ගේ හඬ ශබ්දයට අවදි වීමේ අවස්ථාවක් ලෙසට පියතුමා හැඳින්විය. වීනා ජයකොඩි, නීටා ප්‍රනාන්දු, ග්‍රේස් ආරියවිමල්, ලියෝනි කොතලාවල, රිචඩ් වීරකොඩි, මර්වින් ප්‍රියන්ත, රිචඩ් මානමුදලි, දයා ශාන්ත. සෑම් පෙරේරා, ලකිදේව, දොන් ගයි ඇතුලු කලාකරුවන් රැසක් සහභාගිවු අතර ගරු ඇන්ටන් දිනේෂ් හා විවේකාගාරය පාලක පියතුමාගේ නොමඳ සහය ලැබුණි.

**- ඇන්තනි හෙට්ටිආරච්චි**

# මර්සලීන් හීන්කෙන්දට තවත් සම්මානයක්



මාතර සංස්කෘතික මධ්‍යස්ථාන ශාලාවේදී මාතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද 'සාහිත්‍ය කලා මහෝත්සවය පසුගියදා පැවැත්විනි. මෙහිදී චිත්‍ර කලාවට සිදුකරන ලද මෙහෙවර වෙනුවෙන් වූ සම්මානය මර්සලීන් හීන්කෙන්ද ශිල්පියාට හිමිවිය.

බස්නාහිර මහර හීන්කෙන්ද ගමේ ඉපිද දකුනු පළාතේ පදිංචිව දකුණෙන් සම්මාන රැසක් හිමිකර ගත් එකම කතෝලික ශිල්පියා මොහු වෙයි. 2012 මාතර දිස්ත්‍රික් සංස්කෘතික උත්සවයේදී ද සම්මානයක් හිමි විය.

කලක් ප්‍රදීපය චිත්‍ර ශිල්පියෙකු වශයෙන් සේවය කළ හීන්කෙන්ද රසාංජලී රන්සළු උඳුවප් මිහිර, කලා භූෂන රාජ්‍ය සම්මානය, ලංකා කලා සංගමය ආදී සම්මාන ලබා ඇති ළමුන් දහස් ගණනකට චිත්‍ර කලාව ප්‍රගුණ කිරීමට උපදේශකත්වය ලබාදුන් කතෝලික ශිල්පියෙකි.

ෆිලීෂන් අබයකෝන්ගේ
# සුබස 285

## නායක කන්ද

නාය, ගංවතුර, ගිලාබැසීම, මූදු කෑම පාරිභාෂිත වචන නොවේ. ජනතාව සොබා විපත් දුටු සැටිය. බදුලු පදවියේ නායබැද්ද මීසමයි, වත්තයි, ගමයි අද කතාබහට ලක්වූ මීරියබැද්දට නුදුරුය. මේ රටේ නාය උවදුරු හිඟ නැති බව ගම්වල නම්වලින් පෙනේ. නා ගස නිසා ගම් රැසක් ඇත ද නා කැටිය නම් නායක හේතුවෙනි. මතුගම, මතුරට මත්තෙගොඩ, මත්තුමගල, ඕපනායක, අරනායක, කටුනායක, නායවල, ප්‍රතිඵල විය හැකිය. ගමක නමක් අත්වැරදීමක් නොවේ. ආදි කාලේ කන්දක නායකින් (නාය යෑමකින්) පොළොව සමතලාවී කටුනායක නම පැන නැගීමට ඇත.

නාය නිසා මතුවු නායක නායබැද්දේ මෙන් නායකකන්දේ ඉදිරියෙනි. මීසමක නම ගත් නායකකන්ද නම් ඇත්ත වශයෙන් යහපත් එඬේරා නිකායේ මූලස්ථානය පිහිටි විශාල ඉඩමේ නමය. නායකකන්ද සාන්ත මරියා දෙව්මැඳුරු ඉඩමේ නම නුගගහවත්තය. ඉස්සර ඉදිරිපිට ජයසිංහ පෙදෙස පාළුවට ගොස් තිබු කාලේ, මහමඩමේ සිට උතුර බලන්නකුට නායකකන්ද නම් ඉඩම මහකන්දක් කඩාවැටී දකුණට බැස ගොඩවූ බිමක් බව පැහැදිලිව පෙනෙන්නට තිබිණ. මීට දකුණට ඇති යෝදයාකනත්ත නම පවා මීට දෙස් දේ. වගා නොකොට අත්හල වෙල් හේන් කනත්ත යනුයි. නාය නිසා යෝධයා වගාව අත්හැර යන්නට ඇති

අනුරාධපුර, රත්නපුර, තිස්සමහාරාම ලෙස මිශ්‍ර සිංහල බසින් ගම් ටිකකි. නායක යන සකු වදනේ අරුත ඉදිරියට ගෙනයන්නාය. ප්‍රධානයාය. මෙකඳු තුනට නායක සමනල කන්ද යයි කරත්ත කවියක දකින නායක යන්න නායක කන්දට අදාළ නැත. මහ නුවර, මහගම, මහඔය මෙන් මහකන්ද වන්නට තිබිණ.

එවේලෙහි නායක් සැලුවා සේ පර්වතය ගලින්ගල ගැස ගල්ලැහැලි උපුර උපුරා බුදුන් කරා දිවෙත්. (පූජාවලිය) වැස්සට ගල්පස් තට්ටු කඩාගෙන ගොස් සැදුණ බෑවුමත් නායකි. කුඹුරක නියර කැඩී සැදුණු කපොල්ලත් නායකි. නායට හේතුව මහවැස්සයි. මහවැසි නාකපන වැසි වන්නේ එහෙයිනි. ගංවතුර ගලනවා මෙන් නාය යනවා වහරට ගතයුතුය. ඔක්තෝබර් 30 එක පුවත්පතක පමණක් ලොකු අකුරින් කොස්ලන්දේ නායේ මහ විපත යයි සේයාරූ රැසක් මැද තිබිණ. නාය ඉරි ව්‍යසනයක ලකුණුය.

කඳුවල පදනම් දෙදරා සෙලවිණ. මම මඩගොහොරුවේ කිඳා සිටිමි (ගීතා 18 හා 69)

ගරු සාර්ටෝ නෝනිස් පියතුමා විසින් රචිත ශු. දසවන පියුස් තුමාගේ ජීවන චරිතය අඩංගු පොත් පිංච රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි රදගුරු හිමිපාණන් වෙත පිළිගැන්වූ අවස්ථාව.



# දසවන ශුද්ධ වූ පියුස් තුමා




**කර්තෘ - ගරු සාර්ටෝ නෝනිස් පියතුමා**
**මිළ රුපියල් 50/=**

ශුද්ධවූ දසවන පියුස් (ජෝශප් මෙල්කියෝර් සාර්ටෝ) සුදොතුම් පියතුමා ස්වර්ගස්ථ වීමේ ශත සංවත්සරය නිමිත්තෙන් ගරු සාර්ටෝ නෝනිස් පියතුමාගේ නාම සාන්තුවරයා වෙනුවෙන් එතුමාගේ ජීවන තොරතුරු බිඳක් ගොනුකොට පොත් පිංචක් පසුගියදා එළිදක්වන ලදි.

දිළිඳුන්ගේ පියා ලෙසින් විරුදාවලි ලත් ශුද්ධ වු දසවන පියුස් සුදොතුම් පියා වෙනුවෙන් එතුමාගේ ළමාකාලයේ සිට ස්වර්ගස්ථ වීම දක්වා සිදුවීම් සාරාංශයක් ලෙසින් ගොනුකොටැති මෙම පොත් පිංච එතුමාගේ පිහිට පතා ලියැවුන ප්‍රාර්ථනාවකින්, යාච්ඤාවකින් සහ ගීතිකාවකින්ද සමන්විත හෙයින් යාච්ඤා පොතක් වශයෙන්ද භාවිතකළ හැකිය. එතුමාගේ නමින් ශ්‍රී ලංකාවේ ඇති එකම දේවස්ථානය මාරවිල මීසමේ හොරගොල්ල ග්‍රාමයේ පිහිටා ඇති බැවිද සඳහන්ය. දැන් දැන් දරු දැරියනට නම් තැබීමේදී එදා මෙන් ශුද්ධවන්තයින් ගේ නම් අමතක කොට ජනප්‍රිය චරිතවල නම් යෙදීමද විවේචනයට ලක්කරන කර්තෘ පියතුමා සිය දරුවනට ශුද්ධවන්තයින්ගේ නමක් තැබීමේ වැදගත් කමද මෙම පොත් පිංචෙන් අපූරුවට පෙන්වාදී ඇත.

# මඟුල් මුද්ද




**කර්තෘ - සැම්සන් පෙරේරා**
**මිල රු. 180/=**

දැලතුර සැම්සන් පෙරේරා විසින් රචිත 'මගුල් මුද්ද' නමැති කෙටිකතා සංග්‍රහය ඩිස්කවරිය, වසන්තය තව දුරයි. සොරෙකුගේ හැරවුම් ලක්ෂ්‍යය, ගෙඩියක් හැටයි වැනි කෙටිකතා කිහිපයක එකතුවකි. ප්‍රවීන ලේඛක/ ගත් කතුවරයකු වන මයිකල් ආන්ජලෝ ප්‍රනාන්දු ශූරීන් මගුල් මුද්ද ග්‍රන්ථය ගැන දරන්නේ මෙවන් අදහසකි. 'විවාහය අවතක්සේරුවට ලක්වී ඇති සේයාවක් දිස්වෙන බවද, ආදරයේ සුන්දරත්වය. විශ්වාසනීයත්වය.

අන්‍යොන්‍ය අවබෝධය වැනි උතුම් සංකල්ප කඩතොලුවී ඇති මෙවන් අවධියක 'මගුල් මුද්ද' කෙටිකතා සංග්‍රහය යුග දිවියක තිබිය යුතු වටිනාකම් ඉතා මැනවින් සමාජගත කරන පොත් පිංචක් බවද පෙන්වා දෙයි.

සැම්සන් පෙරේරා ශූරීන් ගේ කුළුදුල් ප්‍රයත්නය සාර්ථක නිර්මාණයක් බැවිද, විවාහපේක්ෂිත සියල්ලන් අනිවාර්යයෙන්ම කියවා වටහාගත යුතු පොත් පිංචකි. මෙවන් වටිනා නිර්මාණ තව තවත් එළිදක්වන්නට සැම්සන් පෙරේරා ශූරීන්ට තව තවත් දිරිය ශක්තිය දෙව්මව් වෙතින් ලැබේවායැයි පතමි.

**මුදලිගේ**

විශ්ව සභාව

# සසුන් පියා දිළින්දන් ද, සාමය ද වෙනුවෙන් ජී 20 නායකයන් අමතයි



ජී 20 නායකයන්ගේ හමුව, නොවැම්බර් මස 15-16 දිනයන් හී ඔස්ත්‍රේලියාවේ බ්‍රිස්බන් හිදී පැවැත්වේ. ප්‍රැන්සිස් සසුන් පියා විසින් ජී 20 හමුව වෙතැ, ඔස්ත්‍රේලියාවේ අගමැති තෝයි ඇබට් මගින් පණිවුඩයක් යවනු ලැබීය. සසුන් පියා එම පණිවුඩය මගින්, ජී 20 නායකයන්ගේ අවධානය දිළින්දන් ද ලෝක සාමය කෙරෙහි යොමු කරන ලදි.

සසුන් පියාගේ පණිවුඩයෙහි සසුන් පියා මෙලෙසින් ද දක්වා තිබිණි. "ඔබ සැමදෙනා ලෝකයේ බලවත්මැ රටවලැ නායකයෝ බැව් අප කවුරුත් හොඳින් දනිමු. ලෝකය පුරා අති විශාල ජන පිරිස් දුගී භාවයෙන් පෙළෙති. ඔවුහු ආහාර පානාදිය හරි හැටි නොමැති වීමෙන් පමණක් නොව, ලෙඩ දුක් නිසාවෙන් ද දරුණු අන්දමින් පීඩා විඳිති. එම නිසාවෙන්, ඔබ සැම කාලීනව රැස්වීමෙන් පමණක්, ඒ ඒ ප්‍රශ්න වලට පිළිතුරු නොලැබේ. තවද ජාතීන් අතර පවත්නා යුද කෝලහල සහ ක්‍රොධයන් හේතු කොට ගෙන ලෝක සාමය බිඳී ගොස්, සාමය පිළිබඳ ක්‍රියාවලියක් නොමැති වචනයට පමණක් සීමා වූ හමුවීම් පමණක් දක්නට ලැබේ."

සසුන් පියා විසින් තව දුරටත් පෙන්වා දී ඇත්තේ, දරිද්‍රතාවය හා ආනුශංගික හේතූන් නිසාවෙන්, විශේෂයෙන් තරුණ තරුණියන් සමාජ දූෂණ ක්‍රියාදාමයන්ට හා දේශපාලන ත්‍රස්ත මෙහෙවරයන්ට ගොදුරු වී ඇති බවයි. එබැවින් ඔවුන් බේරා ගැන්මේ පියවරයන් වහා ඉදිරිපත් කරවීම ජී 20 නායකයන්ගේ පරම යුතුකමක් බැව් පිළිගත යුතුව ඇතැයි එතුමා විසින් පෙන්වා දී ඇත. තවද මැද පෙරදිග සිදුවන මනුෂ්‍ය ඝාතනයන් නවතා දමා ලෝක යුද්ධයක් ඇතිවීමේ අවකාශයන් ඉවතලෑම තමන්ගේ යුතුකම බැව් ද, ජී 20 නායකයන් විසින් තරයේ අදහාගත යුතු යයි ද සසුන් පියා විසින් අවධාරණය කරනු ලැබීය.

# පාස්කු මංගල්‍ය පැවැත්වීමේ පොදු කිතුනු දිනයක් ඉල්ලයි



නොවැම්බර් මස 09 වෙනිදා, සකළ කිතුනුවන්ගේ එකමුතු සංවිධානයේ 50 වැනි වාර්ෂික උලෙළ වියෙන්නා හිදී පවත්වනු ලැබීය. එදින ස්වාධීන කිතුනු ජනතාවගේ පාස්කු මංගල්‍ය දිනය, ලෝ පුරා වාර්ෂිකව එකම දිනෙක සිදුවිය යුතුය යන යෝජනාව එහිදී සුවිශේෂී යෝජනාවක් ලෙසට ඉදිරිපත් විය.

ඔතොඩොක්ස් සභා නායක II වැනි තවදෝස් හිමිපාණන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, කලින් කල ඉදිරිපත් කරන ලද එම යෝජනාව තව දුරටත් ප්‍රමාද නොකොට, ක්‍රියාත්මක කළ යුතු බවයි. මෙම දිනයන් හී වෙනස සිදුවී ඇත්තේ, උතුරු අප්‍රිකාව හා මැදපෙරදිග රටවල විසින් ජුලියානු කැලැන්ඩරය ද අන් කිතුනුවන් විසින් ග්‍රේගොරියන් කැලැන්ඩරය ද යොදා ගෙන ඇති නිසාය.

පවත්නා මෙම වෙනස සුවිසල් බාධාවක් නොවන සේ, විශේෂයෙන් මැදපෙරදිග රටවල් විසින් ඉල්ලා සිටිනු ලබන්නේ තවත් කල් යල් නොබලා එකම දිනයක පාස්කු මංගල්‍යය සිදු කරනා ලෙසටයි. මෙම ඉල්ලීම, ප්‍රැන්සිස් සසුන් පියා ප්‍රථම පදවි ප්‍රාප්ති දිනයේදී එතුමා වෙත ද ලිඛිතව ඉදිරිපත් කරනු ලැබ ඇත.

# ශුද්ධ වූ පවුල ඊජිප්තුවට පලා ගිය මගෙහි යාමට කිතුනුවන්ට ආරාධනා

ශුද්ධ වූ බයිබලයේ දැක්වෙන ශුද්ධවූ පවුල ඊජිප්තුවට පලා යාමේ සංසිද්ධිය කෙරෙහි සකළ කිතුනුවන් දක්වනු ලබන්නේ, භක්තියාදර සිහි කිරීමකි. එම සිද්ධිය හා බැඳුනු බැති පෙම් කතාන්තර පවා පවතී. එලෙස ශුද්ධ වූ පවුළ පලා ගිය මග වෙත ළඟාවීමට ලෝකවාසී කිතුනුවන්ට අවස්ථාව සළසා දීමට ඊජිප්තු රජය විසින් තීරණය කර ඇතැයි වාර්තා වේ.

මෙම වන්දනා ගමන් තීරයෙහි, ඊජිප්තු රජය හා ඊජිප්තුවේ කොප්ටික් ඔතොඩොක්ස් සභාව එක්කාසුවී කටයුතු කරනු ඇත. මෙම වන්දනා ගමනේදී, විශේෂයෙන් සීනයි හා ගානා සිට ඉපැරණි කයිරෝව දක්වා යන ගමනේ ඓතිහාසික ස්ථානයන් විශේෂාකාර හැඳින්වීම් වලට භාජනය කරනු ලබයි. අරාබි කරයේ පවත්නා කිතුනු පීඩාවන් හමුවේ වුවද, එම ශුද් ධවූ ගමන පුරා ආරක්ෂාව සලසා දෙනු ලබන බවට රජය විසින් සහතික විය යුතු යයි ද කොප්ටික් ඔතොඩොක්ස් සභා නායකයෝ ඉල්ලා සිටිති. මෙයාකාරයෙන් වර්ෂයක් පාසා ලොවේ ඒ ඒ රටවල් වලින් 500000 කට වැඩි කිතුනුවන් සංඛ්‍යාවක් ශුද්ධ වූ පවුල ඊජිප්තුවට පලා ගිය මාර්ගය ඔස්සේ පා තැබුමට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කැරේ.



# සසුන් පියා පීඩා විඳින කිතුනුවන් හා සමීප බැව් පවසයි



නොවැම්බර් මස 12 වෙනිදා පැවැති පොදු හමුවේදී, සසුන් පියා විසින් සෙනෙහසින් ප්‍රකාශ කරනු ලැබුවේ, කිසිදු අඩුවක් නොමැතිව දිගින් දිගට පීඩා විඳින සියලු කිතුනුවන් හා අධ්‍යාත්මික ලෙසින් සමීපව සිටිනා බවයි.

තවද සසුන් පියා මෙලෙස ද ප්‍රකාශ කළ සේක. "ලොව පුරා දේශ පාලන වගකීම් දරන්නාවූ සැමගෙන්ද, මිනිස් දයාවන් පිරි අනෙකුත් නායකයන්ගෙන් ද මා ඉල්ලා සිටින්නේ, නොතිත්ව පීඩා විඳින කිතුනුවන් එම පීඩාවන්ගෙන් මුදවා ගැන්මේ ක්‍රියාකාරිත්වයන් දියත් කරනා ලෙසටයි. ඔවුන් කිතුනු ඇදැහිල්ල පවත්වාගෙන යාමට පනවා ඇති බාධාවන් ඉවත් කරලීමේ ක්‍රියාකාරිත්වයන් මෙහෙය වන ලෙස ද මා ඉල්ලා සිටිනුයේ, ඔබ සැම කෙරෙහි ඇත්තා වූ විශ්වාසයෙනි."

තවද, මෙක්ෂිකෝවේ, මත් ද්‍රව්‍යයන් හේතු කොට ගෙන පාසල් දරුවන් 43 දෙනෙකු ඝාතනය කරනු ලැබීම දක්වමින්, සසුන් පියා විසින් ඉල්ලා සිටිනු ලැබුවේ, මත් ද්‍රව්‍යයන් විකිණීම හා ප්‍රවාහනය නවතාලීම සඳහා ජාත්‍යන්තර ක්‍රියා මාර්ගයන් ඉදිරිපත් කළ යුතු බවයි.

# මැදපෙරදිග කිතුනු ඝාතනයන් නතර කරන්නැයි චාර්ල්ස් කුමරු ඉල්ලයි



නොවැම්බර් මස 04 වෙනිදා, වීඩියෝ පටයක් මගින්, බ්‍රිතාන්‍යයේ කිරුළ හිමි චාර්ල්ස් කුමරා විසින් සියලු ඉස්ලාම් නායකයන් ඇතුළු අන් ලෝක නායකයන්ගෙන් ද ඉල්ලා සිටිනුයේ නිමක් නැති කිතුනු ඝාතනයන් නවතාලීමට වහා පියවර ගත යුතු බවයි.

එතුමාගේ මෙම ඉල්ලීමට සමගාමීව, ලෝකය පුරා වැඩියෙන්මැ පීඩා විඳිනා සුළුතර ආගමික කොට්ඨාශය. කිතුනුවන් බැව් පර්යේෂකයන් ද විසින් හෙළි දක්වා ඇත. එතුමාගේ මෙම වීඩියෝ පටය ස්වාමිවරුන්ගේ මණ්ඩලය තුළ විසුරුවා හරිනු ලැබීමෙන්, බ්‍රිතාන්‍ය පුරා, සියලු ආගමිකයන්ගේ සංතාපයට ඉලක්ක වූ බැව් ද වාර්තා වේ.

එම වීඩියෝ පටයේ, චාර්ල්ස් කුමරා විසින් මෙලෙසින් ද දක්වා තිබේ. "විශේෂයෙන් කිතු දහම මැද පෙර දිග සංස්කෘතිය හා වසර 2000 කට වැඩි කාලයක් සසග වන අතර, ඉස්ලාම් දහම් පැවැත්මට කලින් සිට පවත්නා බැව් සත්‍යයක්. ඒ අනුව ද කිතු දහම හා කිතුනුවන් සුරැකීම ඉස්ලාම් නායකයන්ගේද යුතුකම වනු ඇත. මෙවන් ඓතිහාසික යථාර්ථයන් හමුවේ විශේෂයෙන් මැද පෙර දිග කිතුනුවන් ආරක්ෂා කිරීමද සියලු දෙනාගේ යුතුකම වන බැව් ද තහවුරු කළ යුතුයි.

# පිටගැස්ම එන්නතේ මුවාවෙන් කෙන්යාවේ තරුණියන් වඳ කරයි

පිටගැස්මේ එන්නත් දීමේ එන්නත් ව්‍යාපාරයක් තුළින් කෙන්යාවේ තරුණියන් විශාල සංඛ්‍යාවක්, වඳ බවට පත් කරනු ලැබූ ඇතැයි කෙන්යා දේශයේ රදගුරු මණ්ඩලය හෙළි දක්වයි. ප්‍රකාශ කර ඇති පරිදි මෙම තරුණියන් වඳ කිරීමේ ක්‍රියාදාමයන් පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය පවා දැන සිටිය බව ද රදගුරු මණ්ඩලය විසින් හෙළි දක්වා ඇත.

පිටගැස්මට එරෙහි එන්නත් ක්‍රියාදාමයක් ලෙසින් මතු පිටින් දක්වා ඇති මෙම ව්‍යාපාරය තුළින් කෙන්යාවේ තරුණියන් දැනටමත් මිලියන 2 කට වැඩි සංඛ්‍යාවක් වඳ භාවයට පත් කර ඇතැයි වාර්තා වේ. මෙලෙස මෙම රහස් ව්‍යාපාරය මගින් කෙන්යාවේ ජනගහන වර්ධනය පාලනය කිරීමේ හේතුව මුල්වී ඇතැයි ද දක්වා ඇත.

තවද කතෝලික සෞඛ්‍ය නිළධාරින් විසින් කරන ලද පර්යේෂණ අනුව, පිට ගැස්ම සඳහා වන හැම එන්නතක්මැ වඳ බෙහෙත් අඩංගුව පැවැති බැව් ද ප්‍රකාශ කොට ඇත. එහෙත් මෙම අනාවරනය පිළිබඳව, රජයේ නිළධාරින් විසින් මෙතෙක් කිසිදු ප්‍රකාශයක් නිකුත් කර නොමැති යයි ද රදගුරු සම්මේලනය තව දුරටත් ප්‍රකාශ කරයි.

# ලෝකයේ විශාලතම බයිබල් මුද්‍රණාලය චීනයේ පිහිටුවා ඇත

ලෝ ප්‍රකට සඟරාවක් වන 'ෆයිනැන්ෂියල් ටයිම්ස්' විසින් ප්‍රකාශ කරනු ලබන පරිදි, ලොව පුරා පවත්නා බයිබල් මුද්‍රණාලයන් අතුරෙන්, විශාලතම මුද්‍රණාලය චීනයේ පවත්නා බැව් කතෝලික පුවත් විසින්, නොවැම්බර් මස 11 වැනිදා හෙළි දක්වා ඇත.

තවද එම ප්‍රවෘත්තිය ප්‍රකාර, වර්ෂ 1987 සිට මේ දක්වා චීනයේ එම මුද්‍රණාලය විසින් පූර්ණ බයිබල් මිලියන 125 ක් මුද්‍රණය කරනු ලැබ, බෙදා හරිනු ලැබ ඇත. එලෙස මුද්‍රණය කරති බයිබල් සියල්ල, චීනයේ ජනතාව අතට පත්වන්නට ඇතැයි ද වාර්තා වේ.

තවද, චීන රජය විසින් පිළිගනු ලබන ප්‍රොතෙස්තන්ත සංවිධානයක් විසින් බයිබල් මිලියන 66 ක් මුද්‍රණය කොට, චීනයේ කිතුනුවන් අතට පත් කොට ඇතැයි ද කතෝලික පුවත් වාර්තා කරයි. එමෙන්මැ, එම ආයතනය විසින් මුද්‍රණය කැරුණු බයිබල් මිලියන 59 ක්, විදේශ වෙළඳ පොළ වෙත ද ලබා දී ඇතැයි ද වාර්තා වේ.

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග

මරියගැති ගරු ලීනස් එප් ද සිල්වා පියතුමා ආරම්භ කළ

# පමුණුගම, බෝපිටිය නුගපේ සණස සංගමයේ 75 වන දියමන්ති ජුබිලිය



පමුණුගම බෝපිටිය නුගපේ සණස සංගමයේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය

දිළින්දන්ට සුබාරංචිය දේශනා කිරීමේ පණිවුඩය තේමාව කරගත් නිමල මරිය නිකායේ ජනතාවාදී ගරු පියතුමකු වූ, 1939 වසරේ පමුණුගම මීසම පාලකව සිටි මරියගැති ලීනස් එප් ද සිල්වා ගරු පියතුමා එවකට තම මීසමට අයත්ව තිබූ බෝපිටිය ප්‍රදේශයේ නැති බැරි මිනිසුන්ගේ ජීවන තත්ත්වය සොයා ගෙයින් ගෙට යමින් යථාර්ථය තුළ සංවේදීවූ එතුමා ජනතාවාදී පියතුමෙකු ලෙස කැපවීම වත්මන් පූජක පරපුරට ඇඩි අභියෝගයක් වන්නේය.

සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය ගැන නිසි අවබෝධයක් ලබාගත් එතුමා දිළිඳු ජනතාව ජීවන පීඩනයෙන් මුදවා ගැනීම පෙරදැරි කර ගෙන ඉතුරු කිරීම, සකසුරුවම්කම, ණය ආධාර ලබා දීම තුළින් ඔවුන් සවිබල ගැන්වීමට සණස ණය සමිතිය පිහිටුවීමේ ඓතිහාසික පෙරගමන්කරුවා වීමේ පුරෝගාමියා වූයේ ය.

1939 වසරේ පොසොන් මස 11 වන දින විවිධ අභියෝග හමුවේ ඇති හැකි අයගේ ඇඩි විරෝධතා මධ්‍යයේ නැති බැරි මිනිසුන්ගේ දුක නිවීමට දෙවිඳුන්ගෙන් තමා ලද කැඳවීමට පිළිතුරු දෙනු පිණිස මානව හිතවාදී දයාබර හදවතක් ඇති මරියගැති ගරු ලීනස් එප්ද සිල්වා නැමැති දහම් නියමුවා බෝපිටිය නුගපේ ප්‍රදේශයේ ගුණග රුක ධාර්මික පරිත්‍යාගි ශීලී ස්වල්ප දෙනෙකුගේ සහභාගිත්වයෙන් අපමණ බාධක මැද නුගපේ සණස රෝපණය කරන්නට යෙදුනි. අභියෝග හමුවේ සාමාජිකයන් 21 දෙනෙකුගෙන් ආරම්භ කළ නුගපේ සණස ආරම්භක ණය මුදල වූයේ එකල ආර්ථිකය අනුව රු. 8.00 ක් වූ බවට සඳහන්ය. දිගමනකට මුල පිරු නුගපේ සණස 1941 අප්‍රි. මස 03 වන දින සී 478 යටතේ රජයේ ලියා පදිංචිකර නිත්‍යානුකූලත්වයට පත් කරනු ලැබිණි.

ගරු ලීනස් එප් ද සිල්වා පියනම සවි බල ගන්වා ජනතාකරණය කළ නුගපේ සණස දිනෙන් දින ජන ප්‍රසාදයට පත්වෙමින් ජන හදට ලංකිරීමට පසු කාලීනව එයට උරදුන් මහා සෙබල බල ඇණියේ කැපී පෙනෙන නියමුවන් රාශියක් විය. පුංචි මිනිසුන්ගේ ගමනට සංවේදි වූ නායකයන් අතර ජේ.ඩී. ජෝශප් අන්නාවි මහතා 1939 සිට 1955 දක්වා වසර 15 ක් භාණ්ඩාගාරික තනතුර දරමින් සණස මහා කප්රුකක් බවට පත් කළේය. ඉන් පසුව පී. ජෝශප් පෙරේරා මහතා 1939 සිට 1949 දක්වා පී. අන්තෝනි පෙරේරා මහතා 1943 සිට 1949 දක්වා ද හෙන්රි ජයමහ මහතා 1949 සිට 1950 දක්වා ද, ඩී.ජේ හෙට්ටිආරච්චි මහතා 1950 සිට 1970 දක්වා ද කැමිලස් ජයකොඩි මහතා 1991 සිට 2009 දක්වා ද විවිධ තනතුරු දරමින් සණස නෞකාවේ කීර්තිමත් නියමුවන් ලෙස ඉතිහාසගතවී ඇත.

තවදුරටත් ආරම්භක සටහන් අතර ලේකම් තනතුරුවල වැජඹෙමින් ඒ.පී. පලිහවඩන, ජේ.ඩී. විල්ප්‍රඩ්, පී.ඩී. බෙන්ජමින් (සුදු ගුරුනාන්සේ) යන මහතුන් ද ජුස්තින් ජයමහ ගුරු මැණියන් ද, ලාවුස් හෙට්ටිආරච්චි ගුරු පියාණන් ද, නොමැකෙන අමිල සේවාවක් සණසට ඉටුකර ඇත්තේය.

ආරම්භයේ ස්ථිර නිවහනක් නොමැතිව ගමන් කළ සණස බෝපිටිය කුමරි පාසල් ගොඩනැගිල්ල, බෝපිටිය දෙව්මැදුරේ පියගැට පෙල අතර නිවහන වූ අතර මේවන විට සමාජිකයන් සියල්ලගේ අප්‍රතිහත ධෛර්යය තුළින් දර්ශණීය ස්ථිර තමන්ගේම ගොඩනැගිල්ලක කාර්යාලය හා රැස්වීම් ශාලාවක් ද සහිතව ඉහලම ප්‍රගතියක් ලබා ගත්තේය.

1964 ජූලි මාස 12 වන දින අදුරෙන් එළියට යන තේමාව යටතේ සාමාජිකයන් 132 දෙනෙකුගෙන් සමන්විත සණස 25 වන ජයන්තිය ඩී.ජේ. හෙට්ටිආරච්චි ගරු සභාපති තුමාගේ මූලිකත්වයෙන් පැවැත්වින. 1989 ජුනි මස 24 වන දින ස්වර්ණ ජයන්තිය (50) ඩී. හෙන්රි ජයමහ මහතාගේ සභාපතිත්වයෙන් බෝපිටිය නිකුලා මුණි දෙව්මැදුර භූමියේ දී පැවැත්වින.

විසිවන සියවසේ දෙවැනි දශකය වන විට සණස ආර්ථික තත්ත්වය නංවාලීමට, ස්වයංරැකියා, නිවාස ඉදිකිරීමට, කෘෂිකාර්මාන්තයට, අධ්‍යාපනය, ව්‍යාපාර සඳහා විවිධ ණය ක්‍රම ඇති කරමින් සංවර්ධන සැලසුම් පරිදි වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සමාජික ඇප මත රුපියල් ලක්ෂ දෙකක් ද දේපල ඇප මත රුපියල් ලක්ෂ දහයක් ද අපදා ණය වශයෙන් රු. 25000ක් ද ලබාගැනීමට හැකිවේ. 2011 වසරේ සිට මේ දක්වා සමාජිකත්වය වෙත ආහාර මල්ලක් ද ප්‍රදානය කරන්නට හැකිවී ඇත. සියළුම සුභ සාධක අංශයන් හි සාර්ථක වර්ධනයක් ඇති කරන්නට ද හැකි වී ඇත. 2014 වසරේ සණස යෝධ ශක්තිය මත පර්චස් 35 ක භූමිභාගයක් මිලදී ගත හැකිවීම, එම භූමි භාගයේ නව ගොඩනැගිලි සැලසුම් සාදා ඉදිරිපත් කිරීම තුළින් බොහෝ දේ කළ හැකි වූ නුගපේ සණස තම වත්කම මිලියන 120 ඉක්මවා ඇත. සමාජික සංඛ්‍යාවද 750 ඉක්මවා ඇත.

මෙම ආශ්චර්ය සිදුකළ නුගපේ සණසට ශ්‍රීලංකාවේ සමූපකාර මහා සංගමයේ 2003.08.24 දින සාමාජිකත්වය ලබාගැනීමට ද සී/ස ගම්පහ දිස්ත්‍රික් සණස සංගමයේ සමිති සඳහා ප්‍රදානය කළ 2007-2008 වසරේ දී දෙවැනි ශ්‍රේණියේ A කාණ්ඩය ලෙස පිදුම් ලබා ගත්තේය.

2010 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ජාතික කාර්ය සාධන තරගාවලියේ දී විශිෂ්ට ලෙස කාර්ය සාධනය ප්‍රදර්ශනය කළ සී/ස නුගපේ සණස සමිතිය 2011.07.28 දින පවත්වන ලද ඉසුරු සවිය ජාත්‍යන්තර සමුපකාර දින උත්සවයේ දී ලෝකඩ පදක්කමකින් පිදුම් ලැබීය. 2011 වසරේ සී/ස ගම්පහ දිස්ත්‍රික් සණස සමිති ශ්‍රේණි ප්‍රදානෝත්සවයේ දී සී/ස නුගපේ සණස පළමු කාණ්ඩයේ ශ්‍රේණියේ සමිතියක් ලෙස සම්මාන ලැබීය.

සණස 75 දියමන්ති ජුබිලි මහොත්සවය 2014 ඔක්. 19 දින බෝපිටිය හිරු විමන උත්සව ශාලාවේ දී පැවැත්වින . එහිදී බෝපිටිය මීසම පාලක ගරු එරින්ටන් සිල්වා, බෝපිටිය නිමල මරිය සෙවනේ අධ්‍යක්ෂ මරිය ගැති ගරු මර්ල් මෙන්ඩිස් පියනම ද ගම්පහ සණස ප්‍රධාන නිලධාරීන් ද සණස වත්මන් සභාපති ඩී.ඩී. ඇන්ටනි විනිෂියස් මහතා ද ගරු උප සභාපති ඩී.ඩී.එස්.සී. මයිකල් මහතා ද, ගරු ලේකම් රෙජිනස් ජයමහ මිය ද සණස නිලධාරීන් ද උත්සව සභාව ඇමතීය. විවිධ අංශ සඳහා පැවැති තරගවලින් ජය ගත් අයට ත්‍යාග ද, විශේෂ සම්මාන ත්‍යාග ද පිරිනමන ලදී.

ජෝ. සංගපාලආරච්චි
පමුණුගම

# ශ්‍රී ලංකාවේ කතෝලික හෙද සේවය



**රෝහල සඳහා සුදුසු හෙදියන් බඳවා ගැනීම රජයට දුෂ්කර සමයක හෙදි සොහොයුරියන් ඉල්ලා ආණ්ඩුකාරවරයා කතෝලික සභාවට ආයාචනා කළේය. ඒ 1886 වසරේ පෙබරවාරි 8 දාතමින් යුතුව එවකට කොළඹ වෛද්‍ය අධිකාරි වෛද්‍ය කිංසි මහතා ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාර ශ්‍රීමත් ආතර් ගෝඩන් මහතා කතෝලික පැවදි සොයුරියන් පුහුණු හෙද සේවය සඳහා ගෙන්වා ගැනීමේ නොනිමි උද්යෝගයකින් පසුවන බව නිළ වශයෙන් දැන්වීමත් සමඟයි.**

එම ලිපියේ සඳහන් පරිදි හෙද සේවය සඳහා පැමිණෙන පැවිදි සොයුරියන්ගේ ගමනා ගමන වියදම් ඉදුම් හිටුම් පහසුකම්, මාසික වේතනයන් සහ අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලැබෙන බවට සහතික වූ අතර, එම ඉල්ලීම සලකා බැලූ අති උතුම් ක්‍රිස්ටෝපර් බොන්ජීන් අගරදගුරු හිමිපාණන්, අති ගරු බුවාසෝ (නි.ම.නි.) පියතුමන් සහ ප්‍රැන්සිස්කානු නිකායේ ශ්‍රේෂ්ඨ මව් තුමිය ඒ පිළිබඳව සෑහීමකට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස හය දෙනෙකුගෙන් යුත් ප්‍රැන්සිස්කාන පැවිදි සොයුරියන් කණ්ඩායමක් ප්‍රංශයේ මාසෙල්ස් නුවරින් ශ්‍රී ලංකාව බලා 1886 මැයි 8 වෙනිදා ගමන් අරඹා ජුනි 15 වෙනිදා මෙරටට සැපත් විය. 1886 ජුනි 22දා එතුමියන් කොළඹ මහ රෝහල් භූමියේ පිහිටි කුඩා නිවහනක් තම වාසස්ථානය කරගන්නා ලද්දේ අතිගරු බුවාසෝ සහ ගරු කොලින් (නි.ම.නි.) පියතුමන් විසින් රෝහල් අධිකාරීන්ගේ සහභාගීත්වයෙන් එම නිවහන ආසිරි ගැන්වීමෙන් අනතුරුවය. එම නිවහන තම සෙවනැල්ලේ අනුහසින් පවා රෝගීන්ට සුවය දානය කරන්නට යෙදුනු ක්‍රිස්තුතුමන්ගේ අග්‍ර ශ්‍රාවක පේදුරු තුමන්ගේ නාමයෙන් නම් කරන ලදී.

ගරු කොලින් (නි.ම.නි.) පියතුමා එම සොයුරියන්ගේ ප්‍රථම උපාධ්‍ය පියතුමා ලෙස පත් කරන ලදි. තම කුඩා නිවහනේ කුඩා කාමරයක තම පූජා පීඨය ඉදිකරගත් සොයුරියන් සමඟ ගරු බෙයිල් (නි.ම.නි.) පියතුමා රෝහල් භූමියේ ප්‍රථම දිව්‍ය පූජාව ජුනි 24 දා පවත්වන ලදි. කාලයාගේ ඇවෑමෙන් පූර්ණ රාජ්‍ය අනුග්‍රහයෙන් රෝහල් භූමිය තුළ පැවිදි නිවාසය අසලින්ම ගොඩනැගුණු දෙව් මැඳුර 1887 අප්‍රේල් 01 දා ගරු කොකිල් (නි.ම.නි.) පියතුමන් විසින් ආසිරි ගන්වා ප්‍රථම දිව්‍ය පූජාව පවත්වන ලදි. 1888 වසරේ දි ගරු කොන්‍රඩ් (නි.ම.නි.) පියතුමන් පැවිදි සොයුරියන්ගේ මෙන්ම මහ රෝහලේ ද උපාධ්‍ය පියතුමන් ලෙස පත්වූ අතර එවක් පටන් පැවිදි හෙද සොයුරියන්ගේ මෙන්ම කතෝලික රෝගීන්ගේ අධ්‍යාත්මික අවශ්‍යතාවන් සඳහා එතුමා කැපවීමෙන් කටයුතු කර ඇත. මෙලෙස ඇරඹි කතෝලික හෙද සේවයට දැන් වසර 128 කි. තවද මෙවසරේ ශ්‍රී ලංකා ජාතික රෝහලට වසර 150 ක් සපිරේ. එම සැමරුම පාදක කොටගෙන පසුගිය සැප්තැම්බර් 27 දින පැවැත්වූ පා ගමනේ දී හෙද අතීතය ද මොනවට නිරූපනය කොට තිබුණි. එදා පැවිදි සොයුරියන්ගෙන් සිදුවූ සේවාව හා පැරණි රෝහල් සම්ප්‍රදාය නිරූපනය කරමින් පා ගමනේ මෙලෙස යාත්‍රා කළෝ කොළඹ හෙද විදුහල් ශිෂ්‍යාවන්ය.

මෙම පා ගමනේ විශේෂත්වය වූයේ අද දිනයේ සේවය කරන්නන්ට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා ජාතික රෝහලේ සේවයේ නියතුව සිටි බොහෝ වගකිවයුතු නිළයන් දරමින් රෝගී සත්කාරයට හවුල් වූ නිලධාරින් රැසක් මෙයට සහභාගී වීමය.

චමරි ශ්‍යාමා විතානගේ
සභාපති - ශ්‍රී ලංකා කතෝලික හෙද සංගමය

# එළඹෙන ජනපතිවරණය අරබයා කතෝලික දේශපාලන යෝජනාවලියකට අදහස් එවන්න

**එළැඹෙන ජනාධිපතිවරණයේ දී ඉදිරිපත් වන ජනාධිපති අපේක්ෂකයින් හට ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනාවලියක් හා ප්‍රතිපත්තිමාලාවක් කතෝලික ජනයා නියෝජනය කරමින් කතෝලික ජනයාගේ අදහස් හා යෝජනා එක් කර ගනිමින් සැකසීම සඳහා 'කිතු හඬ' කතෝලික දහම රැකගැනීමේ ජාතික ව්‍යාපාරය අදහස් කරගෙන සිටියි.**

මේ සඳහා සියළු කතෝලික සංවිධාන එකට එක් කර ගනිමින් කතෝලික පියවරුන්, විද්වතුන් හා කතෝලික බැතිමතුන් ඇතුළු ගිහි පැවිදි සියල්ලන්ගේ යෝජනා එක් කර ගනිමින් මෙම කතෝලික දේශපාලන යෝජනාවලිය සකස්කිරීමට අදහස් කර සිටින අතර මේ සඳහා ජාතික වශයෙන් හා ආගමික වශයෙන් දේශපාලනික, සමාජ, ආර්ථික, සංස්කෘතික, ජනමාධ්‍ය, අධ්‍යාපනික, ක්‍රීඩා, වැනි විවිධ අංශ ආවරණය වන ලෙස කතෝලික ඔබගේ අදහස් හා යෝජනාද එම යෝජනාවලිය සැකසීම සඳහා එවන මෙන් ඉල්ලා සිටිමු.

එම යෝජනාවලිය සැකසීමෙන් අනතුරුව කාදිනල්හිමිපාණන් ප්‍රමුඛ රදගුරුමඩුල්ලට එය පිළි ගැන්වීමටත්. ඉන්පසු උන් වහන්සේලාගේ අනුමැතිය මත ජනාධිපතිවරණ අපේක්ෂකයින් සියල්ලන්ටම එම යෝජනාවලිය පිළිගැන්වීමට ද, 'කිතු හඬ' සංවිධානය අදහස් කර සිටියි.

**'කිතුහඬ' දේශපාලන යෝජනාවලිය**
**ඥානාර්ථ ප්‍රදීපය' ප්‍රධාන කර්තෘ**
**පියතුමා බාරේ,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08**
e mail : kithuhanda@gmail.com

# ඇස්වසාගෙන සිටියෙමි....



අද සියල්ල වෙනස් වී ඇත
ජීවිත ගණනාවක් දියට බොඳ විය
පොළවට යට වී, සිර වී
සුළු මොහොතකින් පණ නල සුං විය
දිය රකුසාගේ බලය
නොහැකි විය ජය ගැන්මට

මව් පිය අහිමිව
සිටින දරු කැල හට
කුමක් අපි කියමුද?
කොතරම් කරුණු ගොනු කර
පවසම්ද මේ ඛේදවාචකය?

අද සියල්ල වෙනස් වී ඇත
ඇඳුම් පැළඳුම් පොත පතද
කෑම - බීම හා පැදුර මෙට්ට
ගලාගෙන එයි
මහ වැලිය ලෙසට

අප ඇස් වසාගෙන සිටියෙමු
ඔවුන් ජීවත් වු සැටි දැක
අනතුරු මැද සිටින අය
ගැන නොතැකුවෙමු බිඳක්

සැමට ගෙවල්
සැමට නිදහස
කෑ ගැසුවෙමු අතන මෙතන

එවිට නොතිබුණ දර්ශණය
ඇත දිග හැරී අද

අශ්වයා ඉස්තාලයේ නැත
එහෙත් දොර අගුලු දා ඇත
ඔවුන් මිය ගිය පසු
ආධාර! ආධාර! ආධාර!
සම්ඳුනි මම මගෙන්ම
ප්‍රශ්න කළෙමි
ඇයි මෙසේ වනතුරු
ඇස් පියාගෙන සිටියේ?

ආර්ථිකයට පණ පෙවූ
'සුකොමොල දෑත්'
අද නිහඬය
කඳුළු පිසදැමීමට
හදවත් ගිනි නිවීමට
ඔය ගලන ජල කඳ මදිය

මුළු ලොවම කැළඹී ඇත
දුගියාගේ බත් පතට
වැලි කැට මුසු කළේ
කවුදෝ, කවුදෝ?
ඔබයි, මමයි, අපි වෙමු.

**ගරු සුනිතා අ. කා.**
**පැවිදි සොහොයුරිය**

පහන් කැදැල්ල

# පවුල් දේව ස්වරූපයේ සාක්ෂියයි

දෑසක් දෑසට හමුවීම, දොඩමළුවීම, හදින් හද බැඳීම. සෙනෙහස දෝරේ යෑම, විවාහය හා 'පවුල, මිනිස් සමාජය පුරා දිවෙන ඉතාම සංවේදනීය පිළිවෙතකි; අධ්‍යාත්මය හා බැඳුණු දහමකි. විවාහයට දින නියම කරගත්, ආදරණීය යුවලක්, තම අනාගත සහකරු සහ සහකාරිය පිළිබඳව කතා කරනුයේ, විස්තර කරනුයේ මොනතරම් ප්‍රබෝධයකින්ද; ආඩම්බරයකින්ද; ආත්මයෙන් ආත්මය බැඳී පවතින ප්‍රේමණීය බැඳීමක් ගැන ඔවුන් කතා කරයි; කල්ප ගණනක් පෙරුම්පුරා, පතා ගෙන ආ, ඒ සොඳුරු හදවත ළඟ, තම හදවත ගොළු වූ සැටි, පළමු හමුවීමෙන්ම ඔවුනොවුන් පෙමින් වෙළුන සැටි එතැන් පටන් ආ ගිය තොරතුරු පිළිබඳව කතා කරති; මින් මත්තට. ඔහුගෙන් හෝ ඇයගෙන් තොර ජීවිතයක් නැති බව පවසයි.

තම අනාගත සහකරු හෝ සහකාරිය, නොදැක එක් දිනක් හෝ ගත කළ නොහැකි බව කියයි. ඔවුනොවුනගේ ආදරය නොදැනීම වැඩිවර්ධනය වූ බවත්, ඊළඟ පැතුම විගසින් විවාහ වී, දරුවන්ගෙන් පිරි සොඳුරු කැදැල්ලක් තනාගැනීම බව ඉහවහ ගිය සතුටිකින් පවසයි. මිහිපිට පවතින ඉතාම චමත්කාර දෙයනම්, දෙහදක් එක්වී, සෙනෙහසින් බැඳී, ආදරණීය පවුලක් ආරම්භ කිරීම විය හැකිය. ඔවුනොවුන් දෙවියන් හා බැඳී ගිවිසුමකින් ස්වාමිපුරුෂයා හා භාර්යාව බවට පත්වී, එතැන් පටන් මිනිස් සමාජය සංවර්ධනය කිරීමේ භාරදූර කාර්යයට ආරම්භයක් දෙයි. සත්‍යවශයෙන්ම 'විවාහය' යන්න, මිනිස් සමාජයට, දෙවියන් වහන්සේ විසින් දායාද කළ අමිල ත්‍යාගයකි. මිනිස් ලෝකය ආරම්භයේදී පළවූ ස්වාමිපුරුෂයා හා භාර්යාවගේ බැඳීමෙන් පාපය ලෝකයට පිවිසියා සේමා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිත පූජාවෙන්, එම පාපය මකාදමා නව සමාජ පැවැත්මකට 'විවාහය' යන සක්‍රමේන්තුව දායාද කර දුන්හ.

ලෝකාරම්භයේදීම ආදම් සහ ඒවගේ මැවීම හා සහසම්බන්ධතාවය මගින් 'විවාහය' සහ 'පවුල' නිර්මාණය කිරීම, දෙවියන් වහන්සේගේ ඒකීය සැලැස්මත් වී තිබුණා විය හැක. මිනිසා හා ගැහැනිය එකට එක්වී 'පවුල' නිර්මාණය කරනුයේ, මැවුම්කාරවූ දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයේ අනුග්‍රහයෙනි. තම ස්වරූපයට මිනිසා නිර්මාණය කළ උන්වහන්සේ, මිනිසා හා ගැහැනිය එක්කර, 'ඵල දරා වර්ගය බෝ කරන ලෙසට පළමු අණසක ක්‍රියාත්මක කළ සේක.

“තම ස්වරූපය අනුව දෙවියන් වහන්සේ මිනිසා මැවූ සේක. දෙවියන් වහන්සේගෙම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක. පුරුෂයාද, ස්ත්‍රියද වශයෙන් ඔවුන් මැවූ සේක. දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, 'නුඹලා දරු සම්පත් ලබා, වැඩි වර්ධනය වී, පොළව පුරා පැතිර, එය යටත් කරගන්න. (උත්. 13:27-28)

මිනිසා සහ ගැහැනියගේ මෙම බන්ධනය කොතරම් සුවිශේෂිද. කොතරම් බලවත්ද, එතැන් පටන් ඔවුහු 'එක මාංශයක' අඹු සැමියන් බවට පත්වන්නේය.

“මිනිසෙකු තම පියාද, මවද අත්හැර සිය භාර්යාවට බැඳෙන්නේ එබැවින්ය. මෙලෙස ඔවුහු එක් කෙනෙක් වන්නෝය.” (උත්. 2:24)

### විවාහයේ ආත්මීය බැඳීම

විවාහය පළමුකොට, සත්‍ය ලෙසම අධ්‍යාත්මික සම්බන්ධතාවයකි. “එසේම පුරුෂයන් විසින්, සිය භාර්යාවන්ට, තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතුය. සිය භාර්යාවට ප්‍රේම කරන්නා, තමාටම ප්‍රේම කරගන්නේය..... මෙලෙස ඒ දෙදෙන එක් අයෙක් වන්නෝය. මෙය මහා අභිරහසකි.” (එපිස 5:28-32).

මෙයාකාර බැඳීම තුළ, විවාහක යුවළ පෞද්ගලිකවම දෙවියන් වහන්සේ හා බැඳීමක සිටී. විවාහය නිර්මාණය කළ දෙවියන් වහන්සේම, මෙම දෙදෙනාගේ ගිවිසුම සුරැකීමට නිති උපකාර කරන සේක. යම් යම් හේතු මත ඔවුන්ගේ ආදරයේ අඩුලුහුඬුකම් පැවැතියද, දේව ආදරය වික්‍රමාන්විතව, යළි යළිත් ඔවුන් දෙදෙනාගේ බැඳීම වැඩි වර්ධනය කරනු ලබයි.

“මන්ද, අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ, දේව ප්‍රේමයෙන් අප සිත් පුරවන සේක......” (රෝම 5:5)

විවාහයේ ගමන් මඟ සැමවිටෙකම සුවපහසු නොවේ; විවාහය අඩදබර හඳුනයි; විවාහය අසමාදානය. අනාදරය මැනවින් හඳුනයි. දුෂ්කරතා මැනවින් දකී. එනමුදු එකිනෙකා තම පෞද්ගලික වින්දනය, සතුට වෙනුවට, දේව මහිමය හා දේව සැලැස්ම වෙත සිත යොමු කරන්නේ නම්, විවාහය ආශ්චර්යවත් අත්දැකීමක් බවට පත්වේ. විවාහ බන්ධනය, දේව ආදරය හා දේව සැලැස්ම සමග බැඳී. රැඳී පවතිනතාක් කල්, විවාහයේ සුන්දරත්වය කිසිසේත් විනාශ කළ නොහැකිමය.

“එබැවින් සභාව ක්‍රිස්තුස් වහන්සේට යටත් වන්නාක් මෙන්, භාර්යාවන්ද සියලු දේවලදී, පුරුෂයන්ට යටත් විය යුතුය. පුරුෂයෙනි, ක්‍රිස්තුස් වහන්සේ සභාවට ප්‍රේම කොට, සභාව උදෙසා සිය දිවි පුද කළාක් මෙන්, ඔබත් ඔබේ භාර්යාවන්ට ප්‍රේම කරන්න.....” (එපිස 5:24-25)

මෙයාකාරයට අඹුසැමි දෙදෙන, එකිනෙකා වෙනුවෙන් ඇප කැප වීම තුළ සභාව වෙනුවෙන් දිවි පුද දුන් ක්‍රිස්තුස් වහන්සේගේ ස්වරූපයට ප්‍රබල දායකයෙක් වන්නෝය.

### විවාහය ක්‍රිස්තුස් වහන්සේ තුළ රඳාපැවතීම

තම මනාලිය වන සභාව වෙනුවෙන්, ක්‍රිස්තු ප්‍රේමය කෙතරම් අභීත වූයේද, කිසිදු පැකිලීමකින් තොරව, උන්වහන්සේ ඇයට ප්‍රේම කොට සිය දිවි පිදු සේක. විවාහක දෙදෙනගේ ප්‍රේමයද මෙයාකාරව විය යුතුය. ප්‍රේමයේ මනා හැඩරුව පිළිබඳව, ශු. පාවුලු තුමා, කොරෙන්ති සභාවට ලියූ 'ප්‍රේම පාරමිතාවෙහි' සඳහන් මෙවන් ප්‍රේමනීය දිවි පෙවතක් විවාහ යුවළගේ බැඳීම හා ප්‍රාර්ථනය වන්නේ නම්, එවන් විවාහයක් නිරන්තරයෙන් ඵලදරන රුස්ස ගසකට සමානය. කලින් කල ඔවුන්ගේ ආදරය, බැඳීම වැඩිවර්ධනය වන්නේය. කිසිදු පාප'තර බලවේගයකට ඔවුන් යටත් කර, විනාශ කළ නොහැකිය. 'ප්‍රේම පාරමිතාව' අනුව, ආදරයේ පරිත්‍යාගය, ස්වරූප, විවාහ යුවළක් ආදරයේ දෝංකාර වන්නේ නම්! යහපත් විවාහකයෝ සැමවිට සවිමත්ය. සොම්නසින් යුක්තය. අසම්පූර්ණ මිනිසකුගෙන් හා ගැහැනියකගෙන් ආරම්භ වන විවාහය, ප්‍රේමය, පරිත්‍යාගය, කැපවීම ආදී ගුණාංග තුළින් සම්පූර්ණ අඹුසැමියන් බවට පත් කරමින්, ඉතා සම්පූර්ණ පවුල් දිවියකට යොමු කරන්නේය.

“යමෙක් මාගේ වචනය අසා, ඒවා පිළිපදීද, ඔහු පර්වතය මත තමාගේ නිවස සදා ගත් නැණවතකුට සමානය. වැසි වැස, ජලය ගලා, සුළඟ හමා ඒ ගෙට ගැසීය. එය පර්වතය මත පිහිටි බැවින් බිඳ නොවැටිණි....” (ශු. මතෙව් 8:24)

විවාහය රඳා පවතින තිරසාර අත්තිවාරම වනුයේ, දෙවියන් හා බැඳී පැවතීමේ තත්ත්වය අනුවය. දිනපතා වෙන්කරගන්නා ලද වේලාවකදී, දේව වාක්‍ය කියවීම, විවාහය පිළිබඳ සුවිශේෂිය වදන් මෙනෙහි කිරිම, සාකච්ඡා කිරීම, එක්ව යැදීම, දේව පිළිසරණය ඉල්ලා සිටීම, ආදී අධ්‍යාත්මික අභ්‍යාසයන්හි නිරතවීම ඉතා වැඩදායකය. දවසේ අනෙකුත් සියලුම කාර්යයන්ට වේලාව සොයාගන්නා සේම, එක්ව යැදුමට විශේෂ ස්ථානයක් ලබාදිය යුතුමය. 'එකට යදින පවුල, එකට සිටින පවුල යන්න ජීවිත අත්දැකීමෙන් ළඟාකර ගත හැකිය.

### සාර්ථක විවාහයට ඉස්තරම්ම මැලියම්

“පක්ෂවාදිකමින්වත්, පුහුමානයෙන් වත් කිසිවක් නොකරන්න. එකිනෙකා, තම තමාට වඩා අන් අය උතුම් යැයි යටහත් කමින් සිතන්න. සැමදෙනා තම තමාගේම යහපත පමණක් නොසොයා අනුන්ගේ යහපත ගැනද සලකන්න. ක්‍රිස්තුස් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්ප ඔබ තුළත් පවතීවා!” (පිලිප්පි 2:3-5)

තම සහකරු හෝ සහකාරියගේ යහපත උදෙසා ඇප - කැප වන්නේ නම්, එය එකිනෙකා කෙරෙහි 100/100 සැලැස්මක් මත ක්‍රියාත්මක විය යුතුවන්නේය. “කොන්දේසි රහිත ප්‍රේමයකින්, කිසිදු ප්‍රතිඋපකාරයන් නොපතා, මම ඔබ වෙනුවෙන් කැපවෙමි” යන්න එකිනෙකාගේ ඒකායන ප්‍රාර්ථනය විය යුතුමය. 'මම මෙයාකාර වගකීමකින් පවුල් යහපත උදෙසා වැයවන්නේ නම්, අනෙක් පාර්ශවයටද එලෙස වැයවිය නොහැක්කේ ඇයි?' යන පැනය, පවුල අතර දෝංකාරය නොදීමට එකිනෙකා වගබලා ගතයුතු වන්නේය. නිත්‍යානුකූල විවාහයේ සක්‍රමේන්තුව, කොන්දේසි රහිතව වැයවීමකට ආරාධනා කරයි. දෙදෙනාම මෙවැනි හැඟීමකින්, එකිනෙකා කෙරෙහි 100/100 ක් කැපවන්නේ නම් එවැනි පවුල සෙනෙහසේ, සොම්නසේ තෝතැන්නක් වනු නොඅනුමානය.

මතු සම්බන්ධයි...

ගරු මාරි අයේෂා (ය.ඒ.නි) පැවිදි සොයුරිය

# 'පවුල හා පැවිදි වසර' තුළ අපට කළ හැකි දූතික කාරිය කුමක්ද?

2014 නොවැම්බර් 30 වෙනිදා සිට 2016 පෙබරවාරි 2 දා දක්වා 'පවුල හා පැවිදි වර්ෂයක්' ප්‍රකාශයට පත් කිරීම ඉතාම කාලෝචිත පියවරක් බව කිව යුතුය. ඒ ලෙසම 'පවුල හා පැවිදි වසර' පිළිබඳව ඔක්තෝබර් 19 දින ප්‍රදීප කතු වැකියෙන් ගැඹුරු විග්‍රහයක් කර තිබීම ගැන ගරු කතු පියතුමන්ට අපගෙ නොවක් තුතිය පුද කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමු.

රදගුරු මණ්ඩලයෙන් 'පවුල් කොමිසමක්' පත් කර තිබුණත්, එම කොමිසම මගින් ජාතික හෝ පදවි මට්ටමින් ගත් ක්‍රියා මාර්ගයන් නම් පෙනෙන්නට නොමැත. එය හමස් පෙට්ටියේ දමා තිබීම කණගාටුවට කරුණකි. මේ 'පවුල හා පැවිදි වසරේදී' වත් අධ්‍යාත්මික ලෙස පවුල් පෝෂණය සඳහා සියලු පවුල් සේවා සංවිධාන එකමුතුව (TEAM SPIRIT) ප්‍රායෝගික කිසියම් ක්‍රියා මාර්ගයකට පිවිසීමට සභා නායකයින් උත්සුක වන්නේ නම් එය යුගයේ අවශ්‍යතාවයක් වනු ඇත. පවුල් අධ්‍යාත්මික ලෙස පෝෂණය කිරීමට දීර්ඝ කාලීන පුලුල් වැඩ සටහනක් සකස් කළ යුතු අතර පවුල් සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනැගීම 'පවුල් සේවා සංවිධානවල දූත කාර්යක් විය යුතුය. ප්‍රදීප කතු වැකියේ සඳහන් කර තිබූ පරිදි 'ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය' පමණක් නොව, 'විවාහ හමුව' හා අනිකුත් පවුල් සේවාවන්ද එකට අත්වැල් බැඳගෙන. පවුල් සේවාවන් බාරව කටයුතු කරන සියලු ගරු පියවරුන්ගේ මඟ පෙන්වීම මූලික කරගෙන ස්ථිරසාර වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. එය කථාවට හෝ කොමිටිවලට පමණක් සීමා නොකර ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් වීම වැදගත්ය. අප සැමගේ දූත කාර්යය විය යුත්තේ පවුල අධ්‍යාත්මිකව ශක්තිමත් කිරිමෙන්, කිතු සමිඳුන්ට සමීප කිරීමෙන්, කිතුනු පවුල් පරිසරයක් බිහිකිරීම අරමුණ විය යුතු බවය. පවුල දේව විශ්වාසය මත ශක්තිමත් වූ විට, ඒ පවුල් තුළින් බිහිවන තරුණ පරපුර විවාහවීමේදී 'මිශ්‍ර විවාහයට' පිවිසීම පිළිබඳව දෙවරක් සිතා බැලීමට යොමු වේ. අද බොහෝ කතෝලික පවුල් වල දෙවිඳුන් කෙරෙහි ගැඹුරු විශ්වාසයක් නොමැත.

මිශ්‍ර විවාහ පවුල්වල විශේෂයෙන් ප්‍රබල ලෙස මෙය බලපායි. එපමණක් නොව 'මූලධර්මවාදීන්ටත් මුළාවීමට හේතුවක් වී තිබේ. හැරත් 'මිශ්‍ර විවාහය' පිළිබඳව ලිහිල් පිළිවෙතක් සභාව අනුගමනය කිරිම කණගාටුදායකය. මේ පිළිබඳව ප්‍රදීපය මගින් කොතරම් පෙන්වා දුන්නද ඒවා බීරි අලින්ට වීනා ගැයීමක් වැනිය. එමනිසා මේ 'පවුල හා පැවිදි වසරේදීවත්' 'මිශ්‍ර විවාහය' අධෛර්යමත් කිරීමට කිසියම් පියවරක් ගනු ඇතැයි යන්න අපගේ බලාපොරොත්තුවයි. දියවැඩියා රෝගියෙක් යම්සේද 'මිශ්‍ර විවාහය' නිසා කිතුනු පවුල තුළ තිබිය යුතු ගැඹුරු දේව විශ්වාසය දියකර හරින අධ්‍යාත්මික දරුණු රෝගයක් වී තිබේ. කිතුනු ජීවය හා පරිසරය විනාශ කර දමයි. II කොරින්ති සඳහන් කරන පරිදි 'යක්ෂාධිපතියාට හා දෙවිඳුන්ට එක වහල යට විසීමට බැරිය', (II කොරින්ති 6:14-18) ශුද්ධ ලියවිලි එදාට මෙන් අදටත් 'මිශ්‍ර විවාහයට' ප්‍රබල ලෙස බලපාන බව ඉතා පැහැදිලිව පෙන්වා දෙයි.

නූතන සමාජය තුළ පූජක, පැවිදි කැඳවීම් ඉතා අල්පව පවතින්නේ බොහෝ පවුල් දරුවන් දෙදෙනෙකුට හෝ එක් කෙනෙකුට සීමා කිරීමයි. හැරත් ආගමික පරිසරය පවුලෙන් ගිලිහී යෑම තවත් හේතුවකි. මුස්ලිම් පවුල් අපට කදිම ආදර්ශය දෙනු ලබයි. මේ හේතුන් නිසා පූජක, පැවිදි, කැඳවීම්, වර්ධනය කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග යන් සොයා බැලීමට 'පවුල හා පැවිදි වසර' කදිම අවස්ථාවකි. යහපත් අධ්‍යාත්මික කිතුනු පවුල් තිබේ නම්, පූජක, පැවිදි, කැඳවීම්වලට එයම තෝතැන්නක් වන බව කිව යුතු නොවේ. එසේ නම් කිතුනු පවුල හැම අතින්ම අධ්‍යාත්මික පෝෂණය කර ශක්තිමත් කිරීම සභා නායකයින්ට පමණක් කිරීමට නොහැකි බැවින්, සියලුම පවුල් සේවාවන් තම තමන්ගේ පුද්ගල න්‍යාය පත්‍ර අනුව කටයුතු කිරීම පසෙකලා, පවුල සමිඳුන් කරා සමීප කිරිමට අප එකිනෙකාට කළ හැකි දූතික කාර්ය කුමක්දැයි සොයා බලා තීරණය කර, කැපවීම තුළින් පවුල් සේවාවට යොමු වීමට මේ 'පවුල හා පැවිදි වසර' තුළ ක්‍රියාකාරි වෙමු. අපි සැමට දෙවිඳුන් යම්කිසි තලෙන්තුවක් දී තිබේ, අප එයින් පල දැරීමට කටයුතු කළ යුතුයි.

ප්‍රදීප කතු වැකියෙන් තවදුරටත් පෙන්වා දුන් වැදගත් කරුණකි 'පවුල් උපදේශනය.' උපදේශන පුහුණුව ලැබූ බොහෝ පිරිසක් කොළඹ පදවිය තුළ සිටිති. නමුත් තම සේවාවට කැපවී සිටින්නේ සුළු කොටසකි. සමහරු 'උපදේශනය' මුදලක් අය කර කරනු ලබයි. පුද්ගලිකව මම නම් එය අනුමත නොකරමි. නමුත් කෙනෙකුගේ නිදහස් අයිතියට ඇඟිලි ගැසීමට අයිතියක්ද නැත. කෙසේ හෝ 'උපදේශනය' අද සමාජයට අත්‍යවශ්‍ය සේවාවක් වී තිබේ. අද ලොව වැඩිම ඒඩ්ස්, දියවැඩියාව ආදි රෝග නොව 'මානසිකව ඇති වන්නාවූ රෝග' බව ඇමෙරිකාවේ විද්‍යාඥයින් මෑතකදී කළ පර්යේෂණ වලින් සොයා ගෙන තිබේ.

මෙයින් පෙනී යන්නේ 'උපදේශන සේවාවේ' තිබෙන වැදගත් කමයි. මානසිකව ඇති වන්නාවූ ගැටලුවලට, පවුල් ප්‍රශ්නවලට විසඳුම් මාර්ගය 'උපදේශනයයි'. විශේෂයෙන්ම දික්කසාදයෙන් පවුල් රැක ගැනීම කළ හැකි වන්නේ පවුල් උපදේශනයෙන් බව කිව යුතුය. මීසම් හෝ කලාපීය මට්ටමින් 'පවුල් උපදේශන සේවාව' විධිමත් කළ යුතුය. පවුල්වල ඇති වන්නාවූ සුළු ප්‍රශ්න විසඳීමට උපදේශකවරයෙක්ම අවශ්‍ය නොවේ. එවැනි පවුල් සුළු ගැටලු විසඳීම සඳහා 'සමථ මණ්ඩල' වැනි පවුල් කොමිටි සෑම මීසමකම තිබිය යුතුය. යම්කිසි ප්‍රශ්නයක් 'පවුල් කොමිටියට' විසඳීමට නොහැකි බව තේරුම් ගිය කල, එය 'පවුල් උපදේශකවරයෙකුට' යොමු කිරීම කළ හැකිය. ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය, විවාහ හමුව, වැනි සංවිධාන පිහිටා ඇති මීසම් වලට අමතර 'පවුල් කොමිටි' අවශ්‍ය නොවේ. එම කාර්යත් පවුල් සේවා ක්‍රියාකාරින් මගින් කිරීමට හැකිය. පවුල් සේවාවේ දූතික කාරියක් විය යුත්තේ, මීසම බාර පියතුමාගේ මඟපෙන්වීම යටතේ කොට්ටාස මට්ටමින් පවුල් බැහැදැකීම කළ යුතු කාරියකි. ඒ මගින් පවුල්වල පැන නැඟී ඇති ගැටලු හඳුනා ගැනීමට හා පවුල් සමග සමීප ඇසුරක් ගොඩනඟා ගැනීමට මඟ පෑදෙයි.

තරුණ පරපුරටද 'උපදේශන සේවාව' මගින් ජීවිත අවබෝධය පිළිබඳව හා ඔවුන්ට ඇති වන මානසික, ලිංගික. අධ්‍යාත්මික ගැටලු විසඳා ගැනීමට මෙය මහඟු අවස්ථාවක්ද වේ.

අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් කී වදනක් මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතුය.

'යුවළ උපදේශනය' කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත්, අලුත විවාහ වන යුවළ සමග ඉතා සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගැනීම අවශ්‍ය බවත් උන්වහන්සේ ප්‍රකාශ කළහ. අතිඋතුම් කාදිනල් කාඩයින් තුමන් ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරිකයින්ට දුන් උපදේශය වන්නේ 'පවුලක් තවත් පවුලක ගැළවුම්කරුවෙක් විය යුතුය' යන්නයි. එසේ නම් 'පවුල් හා පැවිදි වසර' තුළදී අධ්‍යාත්මික පවුල් විප්ලවයක් ඇරඹීමට අපි සැම අදිටන් කර ගනිමු.

ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ
බෙනඩික් සිල්වා

දැල්වෙන පහන්

**පිටිපන ටියුඩර් වේවැල්දෙනිය මහතා හෙවත් පල්ලියේ කන්තාරු මාස්ටර්**

# අගැයුමක් හා නවකයන්ට ඔවදනක්

පිටිපන පල්ලියේ ප්‍රධාන කන්තාරු කණ්ඩායමේ නියමුවාණන් ඔහුය. වර්තමානයේ පිටිපන දෙව්මැඳුර, කන්තාරු කණ්ඩායම් කීපයකටම හිමිකම් දැරුවද, ඒ සියල්ල අතුරින්, ප්‍රධාන කණ්ඩායම මෙහෙයවමින්, මුලාරම්භයේ සිට අද දක්වා, වසර 45 කට ආසන්න කාලපරිච්ඡේදයක් පුරාවට, තම මහඟු සේවය දෙවිඳුන් වෙනුවෙන් පුදකරමින් ආදර්ශමත්, දැහැමි දිවියක් ගත කරන ඔහු වෙන කව්රුත් නොව අප ප්‍රදේශවාසීන් 'පල්ලියේ ඕගන් මාස්ටර්' යන නමින් ආදරයෙන් හඳුන්වනු ලබන 'ටියුඩර් වේවැල්දෙනිය' මහතාණන්ය ඒ.

70 දශකයේ මූලාරම්භයේ දිනෙක හා හා පුරා කියා ඔහු පිටිපන පල්ලියේ 'කන්තාරු මාස්ටර්' ලෙස එම කාර්යය භාරගෙන තම සේවය දියත් කළ මොහොතේ, මමද එම කණ්ඩායමේ ආරම්භක සාමාජිකයින් අතර කෙනෙකු වීමි.

එදා සිට අද දක්වාම තම යුතුකම හා වගකීම මනා ලෙස වටහාගෙන අනන්තවත් කැපවීම් තුළින් තම කාර්යභාරයෙහි පූජනීයත්වය රැකගනිමින් කරන්නාවූ මෙම මහඟු සේවය අති විශිෂ්ටය. සමහර අවස්ථාවල ගායනා කණ්ඩායමේ ප්‍රමාණවත් සාමාජිකයින් නොමැති හෝ ඔවුන්ගේ පැමිණීම ප්‍රමාදවූ අවස්ථාවන් වලදී පවා, තමන් තනිවම හෝ එම කාර්යය කරගෙන යාමට තරම් ඔහු නිහතමානී වන අයුරු අප පෙදෙස්වාසීන්ද හොඳින් දන්නාවූ කරුණකි.

ගායනය හා වාදනය පිළිබඳව එවකට මා ඇතුලු අපගේ මිතුරු සංසඳයට එහි මුල් පාඩම කියාදුන්නේ ඔහුය.

ඒ තුළින් අනාගත ගෝල පිරිසක් තනන්නට ඔහු තුළවූ ආශාව, උනන්දුව හා වුවමනාව අපි එදා මනා ලෙස දුටුවෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ මාර්ගෝපදේශකත්වය යටතේ බිහිවූ අපගේ සංගීත කණ්ඩායම විසින් 1978 මැයි මස 28 (විසි අටවන දින) වන දින පවත්වන්නට යෙදුන 'මහා සංගීත රාත්‍රිය' ඔහුගේ මෙන්ම අපගේ ජීවිතවලද එය නොමැකෙන මතක සටහනක් වූ බව නොරහසකි. එවකට අප මීසම් පාලකව සිටි ස්වර්ගස්ථ වූ ගරු අබා කොස්තා පියාණන්ගෙන් ඒ සඳහා ලැබුණු දායකත්වයද මා හට මේ මොහොතේදී අමතක කළ නොහැකිය.

එම යුගයේ සහ පසුකාලීනවද ඔහුගේ ගෝලයන් වූ අප මීසමේ කීප දෙනෙකුන්ම දෙව්මැඳුරේ නොයෙකුත් මෙහෙයන් සඳහා සෑහෙන කාලපරිච්ඡේදයක් පුරාවට ඕගනය වාදනයෙන් තම දායකත්වය ලබාදුන්නේද ටියුඩර් ගුරු පියාණන්ගෙන් ලද එම මහඟු ශිල්පයට පින්සිදු වන්නටය. සංගීත විෂයෙහිලා, තමන් සතු දැනුම් සම්භාරය තුළින් තම ගෝල පිරිස පෝෂණය කොට ක්ෂේත්‍රය තුළ දිගු ගමනක් ඔවුන් රැගෙන යාම එදා ඔහුගේ අරමුණ වුවද, එතෙක් ඔහු අප හට දායාද කළ මහඟු ශිල්පය තවදුරටත් ප්‍රගුන කර ගැනුමට තරම් අප එදා උනන්දු නොවුයෙන්, එය අප වෙතින් ගිලිහී ගියේ, අපේම අවාසනාවට විය යුතු යැයි මම අද දිනයේ සිතමි.

මීසමේ සේවය කළ සැම සියලු පියතුමකු සමගින්ම පාහේ ඉතා සුහද, මිත්‍රශීලි සබඳතාවක් පවත්වාගෙන යන්නට තරම් හැකියාවක් ඔහු තුළ වූ අතර, තම ගෝලබාලයින් හා සමග කටයුතු කළේද හුදෙක් ගුරුවරයකුට වඩා ලබැඳිවූ මිතුරකු විලසින්ය.

එදා මෙදා තුර අප ගායනා කණ්ඩායම සහභාගි වූ විවිධාකාර ගායනා තරගයන්ගෙන් ලද ජයග්‍රහණයන් අති විශාලය. පදවි මට්ටමින් සහ දිවයිනේ විවිධ ප්‍රදේශවල පැවති නත්තල් බැති ගී, පසම් ගායනා හා වෙසක් බැති ගී තරගද ඒ අතර විය. එමෙන්ම රූපවාහිනි මාධ්‍යය මෙරටෙහි බිහිවන්නට ප්‍රථම එදා ගුවන් විදුලියේ අප සම්බන්ධ වූ විවිධ ආගමික වැඩ සටහන්ද බොහෝ විය.

අප ආදර ටියුඩර් නොවන්නට, මා ඉහතින් සඳහන් කළ ජයග්‍රහණයන් පිළිබඳ කරුණු කාරණාවන්හි අංශු මාත්‍රයක්වත් මෙසේ සනිටුහන් කරන්නට මා හට ඉඩ ප්‍රස්ථා නොලැබෙනු ඇත. මන්දයත්, එම කටයුතු සොයා බලා ඒවා මනා ලෙස සංවිධානය කොට, කණ්ඩායමට අවැසි පුහුණුව උපරිම අයුරින් ලබාදී, එම විජයග්‍රහණයන් කරා, ඔවුන් මෙහෙයවූ නියමුවාණන් ඔහු වීම නිසාය ඒ.

ස්වතන්ත්‍ර නිර්මාණකරණය ඇතුලු සංගීත ක්ෂේත්‍රයේ විවිධාකාර වූ පැතිකඩ වෙතින් තමන් ලද ශිල්පීය දැනුම දැඩි විනයකින් හා මනා සංයමයකින් යුතුව තම කණ්ඩායමට ලබාදීමෙන් ලද මහඟු ප්‍රතිඵලය නිසාවෙනි මේ සියලුම ජයග්‍රහණයන් අපට එදා උරුම වූයේ.

අද මෙන් සියලු ආකාරයේ පහසුකම් වලින් පරිපූර්න පසුබිමක් නොතිබූ යුගයක එදා 80 දශකයේ මූලාරම්භයේ පමණ අප ගායනා කණ්ඩායම විසින් එළිදක්වනු ලැබූ 'පසන් ගායනා' කැසට් පටය මගේ මතකයට නැගෙයි. එය අප මීසම තුළින් එතෙක් බිහිවූ 'පලමු පසන් ගායනා' කැසට්පටය විය.

ඔහුගේ අධීක්ෂණය යටතේ සිදුවූ එම කර්තව්‍යය එදා



**ටියුඩර් වේවැල්දෙනිය මහතා**

සාර්ථක කර ගැනුමට දිවා, රෑ නොබලා ඔහුගත් අපමණ වූ වෙහෙස පිළිබඳව මේ මොහොතේ මගේ මතකයට නැගෙයි. (ඔහු දිරිගන්වමින් ඔහු සමීපයේම සිටි ඔහුගේ කලන මිතුරකු වූ. අප අතරින් සමුගත් වෝල්ටර් ප්‍රනාන්දු සොහොයුරාණන්වද මේ මොහොතේ මා සිහිපත් කර සිටිනුයේ ඉතා ගෞරවාදරයෙනි.)

දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය, නත්තල පාස්කුව මෙන්ම වෙනත් විශේෂිතවූ මෙහෙයන් සඳහාද ඔහු තම කණ්ඩායමට ඉතා පලදායි අයුරින් අවැසි පුහුණුව ලබා දුනි. අඩු තරමින් මංගල්‍යයකට මාස දෙකකටවත් කලින් ඒ සඳහා පුහුණුවීම් කටයුතු ආරම්භ කිරිම ඔහුගේ සිරිතය. එසමයෙහි ඔහු අගනුවර රැකියාව කළත්, තම රැකියාවට බාධාවක් නොවන අයුරින් ද. දෙව්මැඳුරේ කාර්යභාරය නිසි අයුරින් ඉෂ්ට සිද්ධ කිරිම වෙනුවෙන්ද මනා ලෙස කාල කලමනාකරණය කරගත් අයුරු අපහට තවමත් මතකය.

එදා සිට අද දක්වා වසර 45 කට ආසන්න කාලපරිච්ඡේදයක් පුරාවට, තමන් ලද කිත් - පැසසුම්, මෙන්ම රැවුම් ගෙරවුම් හා වැරදි වටහා ගැනීම් වලදී පවා 'නිහතමානීකම' නමැති වටිනාභරණයෙන් සැරසී, ඒ සියල්ල දෙවිඳුන් නමින්ම ඉවසා දරාගත් අප කන්තාරු කණ්ඩායම් නියමුවාණන් වන 'ටියුඩර් වේවැල්දෙනිය' මහතාණන් අපේ කාලයේ යුග පුරුෂයකු මෙන්ම අප ගම් පියසටද ආඩම්බරයකි. දිගු කාලයක් පුරාවට ඉතාමත් අල්පවූ පහසුකම් මාධ්‍යයේ වුවද, තම කාර්යභාරය වෙනුවෙන් ඔහු තුළ වන් උතුම්වූ කැපවීම පිළිබඳව අප සමකාලීනයන් මෙන්ම අප ග්‍රාමවාසීහුද හොඳින් දනිති.

උපහාර පිදිය යුත්තේ එවැනි උතුම් මිනිසුන්හටය. උපහාර ලැබිය යුත්තේ එවැනි අයවලුන්ය. මා එසේ පවසන්නේ ඔහු ගායනා කණ්ඩායම් නියමුවාණන් ලෙස තම කණ්ඩායමටත්, සමස්තයක් ලෙස අප මීසමටත් මෙතෙක් කළ, එමෙන්ම අදටත් කරන්නාවූ මහඟු සේවය නිසාද, තම දරු මුණුපුරන් සියලු දෙන දහමින් හා කලාවෙන් පෝෂණය කරමින්, තම දයාබර බිරිඳ හා සමග ගත කරන්නාවූ දැහැමි හා ආදර්ශමත් පවුල් දිවිය පිළිබඳවද සාක්ෂි දරමිනි. මා මෙන්ම අප පෙදෙස්වාසීන්ද එය සනාථ කරනු ඇත.

ඔහු සතු ගුණාංග යන්ගෙන් වඩාත් කැපී පෙනෙන්නේ ඔහු තුළ වන් උතුම් නිතමානීකම හා තම වගකීම් හා යුතුකම් කොටස ඉටුකිරීම වෙනුවෙන් වූ උදාර කැපවීමයි. ලෞකික දිවියේ දහසකුත් වැඩටකයුතු මධ්‍යයේ වුවද, දෙවිඳුන්ගේ කාර්යභාරය මොහොතකට හෝ අතපසු නොකොට මහත්වූ ලෙන්ගතුකමකින්,, උනන්දුවකින් හා වුවමනාවකින් එය ඉෂ්ට සිද්ධ කිරීමට කැපවෙන්නාවූ, වැය වෙන්නාවූ 'ටියුඩර් වේවැල්දෙනිය' මහතා වැන්නවුන් අද සමාජයේ විරලය.

යමකු මියගිය පසු පුදනු ලබන උපහාරයට වඩා, එම තැනැත්තා ජීවත්ව සිටියදීම කළ සේවය ඇගැයුමට ලක්කොට පුදන උපහාරය වඩාත් ප්‍රශංසනීය වනු ඇතැයි මා සිතමි. මේ පිළිබඳව අප මීසම් ජනතාව ඇතුල මීසමේ වගකිවයුත්තන්ගේ අවධානය යොමුවන්නේ නම් මැනවි!

තම ජීවිත කාලයෙන් සැලකිය යුතු කාලපරාසයක් පුරාවට, පිටිපන දෙව්මැඳුරේ ගායනා කණ්ඩායම් නියමුවාණන් ලෙස ඔහු කළ සේවය අති විශිෂ්ටය. ඔහුට සමකළ හැකි අයෙකුගේ සේවය අද අප ඉදිරියේ ඇති අනාගත අවශ්‍යතාවයකි.

වර්තමානයේ, එවැනි අයෙක් අපට පෙනෙන තෙක් මානයේවත් සිටීද?

හිතවත් ටියුඩර් වේවැල්දෙනිය මහතාණෙනි ආදරණීය ටියුඩර් අයියේ තව දිගු කලක් දෙවිඳුන් හට ප්‍රශස්ති ගී ගයන්නට ඔබ හට දෙවිඳු සරණින්ම වරම් ලැබේවා!

**මර්වින් පෙරේරා**
පිටිපන

# මතක සුවඳ

**ස්වර්ගස්ථ ගරු බෙනඩික් ජෝශප් සිල්වා පියතුමන්ගේ මෑණියන් පිළිබඳව ලියැවූ කවියකි.**

මහමෙරක් තරම් වූ උස් වූ
පමණටත් වඩා වේදනාවන් ඉහුලූ
මා දන්නා තරමින්
එකම අම්මා ඔබයි
තම සැමියා අහිමි වූ කල
එතැන් පටන් තම වීර්යය දරමින් දුක් උහුලමින්
තම දරු පැටවු ලොවට හැදූ අම්මා ඔබයි
තමාට මුහුණ දීමට සිදුවන
නොයෙකුත් බාධක හමුවේ
ඒවා ඉවසමින් තම දරුවන් වෙනුවෙන්
මුළු ජිවිතයම කැප කළ අම්මා ඔබයි
තම වැඩිමහල් පුතුව දේව සේවයට කැපකරමින්
උතුම් පරිත්‍යාගයක් කළ
එකම අම්මා ඔබයි
තවද ඔබ නොසිතූ මොහොතක
තම පුතු ඔබව හැරගියද
ඒ සියල්ලක්ම ඉවසමින්
තම ඉදිරි ජීවිතයට පය තැබුවේ
ධෛර්යමත් කාන්තාවක් ලෙසිනි
එමෙන්ම එයටත් පෙර
ඔබ නොසිතූ මොහොතක
තමාට වැඩිමනත් ආදරය කරන
ආදරණීය දියණිය හැරගියදා
වෙන මවක් නොවිඳි දුකක්
ඔබ මුළු හදපත්ලෙන්ම විඳින්නට ඇත
මවක් ලෙස ඇය වැඩිමනත්
ආදර පතන්නේ තම දියණියගෙන්ය
නමුත් ඇයද මෙලොව අප හැරදා ගොස් හමාරය
එතෙක් ඉසුලු වේදනාවන්ටත් වඩා දුකක් ඉසුලූ
එකම අම්මා ඔබය ඔබගේ මහලු විය පැමිණියත්
ඔබ කිසිදිනක
ගතින්වත් සිතින්වත් දුබල වූයේ නැත
හැම දිනකම දෙවිඳුන්ගෙන් පිහිට පතන ඔබට
වසර 90 ක්ම අප සමග දිවි ගෙවීමට
වරප්‍රසාද ලබා දුන්නේ දෙවිඳුන්ම පමණයි
වසර 86 ක් පමණ වනතුරුම
ඔබගේ ගතින් මෙන්ම සිතින්ද ශක්තිමත් වෙමින්
තනිවම දිවි ගත කිරිමට
ඔබට ශක්තියක් වූයේ දෙවිඳුන්ම පමණයි
මෙතෙක් කලක් ඔබ අප සමග සිටිමින්
වැඩි ආයු කලක් ගත කිරිමට
වරප්‍රසාද හිමිවූයේ දේව රැකවරණය ගැන ඔබ
විශ්වාස කළ නිසයි
නමුත් අද වන විට ඔබ අපෙන් සමුගෙන
මාස 6 ක් පමණ වන වටත්
අපට කිසිදිනක ඔබව අමතක නොවිණි
ඔබගේ යහපත් ගති පැවතුම්ද
ඔබගේ ඒ ආදරයේ සෙනෙහසද
අපට කිසිදාක අමතක නොවිණි
තවමත් ඔබව අපට සිහිවන විට
ඔබ අතීතයේ කළ කී දෑ පිළිබඳව
නැවත ආවර්ජනයක නිරත වේ
එවිට අපට දැනෙනුයේ මහත් දුකකි
අද ඔබ අප අතරින් වෙන් වී ගොස්ය
නමුත් අප විශ්වාස කරනවා ඔබ දෙවිඳුන්
වෙතටම ගොස් ඇති බව
මා ගන්නා හුස්මක් පාසා
මා වැටෙනා මොහොතක් පාසා
ආච්චි අම්මේ
ඔබ නිරන්තරයෙන්ම මා තුළයි!

**මල්ෂා සිල්වා (මිණිබිරිය)**
බෝලවලාන

# ස්වර්ගස්ථ වූ සෙනෙහබර ගරු ර්විස් මාරි කඩඩෝස් පැවිදි සොහොයුරිය

කැපුන්ගොඩ මීසමේ ශු. පවුලේ කන්‍යාරාමයෙ සේවය කළ ගරු ර්විස් මාරි කඩඩෝස් පැවිදි සොහොයුරිය නොබෝදා හදිසියේ රෝගාතුරව ස්වර්ගස්ථ වූවාය. අවු. 60 ක දේව සේවා කාලය තුළ එතුමිය වෙන්නප්පුව, කුරුණෑගල, කළුතර ද අවසන් වරට කැපුන්ගොඩ කන්‍යාරාමයේද සේවය කර ඇති අතර ගුරු මාතාවක් හා විදුහල්පතිනියක වශයෙන්ද සේවයේ යෙදී ඇත. වයස අවුරුදු 81 ක් පමණ වූවත් වයෝවෘද්ධ බව සැඟවුණ ක්‍රියාශීලි බව, අහිංසක සිනහව දයාන්විත වාග්මාලාව හා ආගමික බැතිය කාගේත් සිත්ගත්හ.

කුඩාදරුවෙකුටවත් සැරවැරවීම හෝ බැණ වැදීම ඇය තුළින් දැකිය නොහැකි විය. 'ඒකට කමක් නැහැ' යනුවෙන් අන්‍යයන්ගේ සුළු වරදකට හෝ සමාවදී කථාකිරීම ඇයට ආවේනික වූ යහගුණයක් විය. දහම් පාසල් ගුරුමඬුල්ල



සමග පුදුම ලෙන්ගතු කමකින් සහයෝග යකින් ළමුන්ගේ දහම් දැනුම වර්ධනය කිරීමේ කර්තව්‍යයේ නියැලුනේ ආදර අම්මා කෙනකු ලෙසිනි.

එතුමිය සේවය කරන අවස්ථාවලදී එම ස්ථානවල සෙනෙහස දෝරේ ගලා ගියේය. දරුවන්ට පළමුවරට දිව්‍ය සත්ප්‍රසාදයදීම, අභිවෘද්ධි ආලේපය දීම ආදි විශේෂිත හා අති බැරෑරුම් අවස්ථාවලදි මීසම් පාලක පියතුමා, දහම් ගුරු මඬුල්ල, දූ දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන් යා කළ දම්වැල් පුරුක එතුමිය විය. පූජා උදව් ළමුන්ට දයාබර මවක විය.

මිශ්‍ර විවාහක පවුල්වල අන්‍යාග මික තරුණ තරුණියන්ට ආගමික උපදේශකවරියක විය. කන්‍යාරාමය අවට අම්මාවරුන්ගේ එකමුතුවේ ප්‍රධානියා විය. ගමේ අසරණ පවුල් හා ලෙඩුන් බැහැදැකීමට යෑමට ඇය අමතක නොකළාය.

වෙන්නප්පුව කන්‍යාරාම දේවස්ථානයේ මිහිදන් කිරීමට සූදානම්කර තිබූ දේහයේ එතුමියගේ මුහුණේ තිබූ සුදෝසුදුවන් පියකරු බව හා භක්තිවන්ත භාවය දුටු ළමා තරුණ වැඩිහිටි සැමගේ හා පැවිදි පූජක තුමන්ලාගේ හා පැවිදි සොහොයුරියන්ගේ හදවත් අධික කම්පනයට ශෝකයට පත්වූ අයුරු දිස්විය.

කැපුන්ගොඩ හා දුන්ගාල්පිටිය මීසම් සංඝය එතුමියට ස්වර්ග සම්පත්තිය ප්‍රාර්ථනා කරති.

**ස්ටැන්ලි ජයමාන්න**
කැපුන්ගොඩ

දික්ඕවිට.. 12 පිටුවෙන්

දේවස්ථානය අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් පියතුමාගේ සුරතින් විවෘත කර ප්‍රථම දිව්‍ය යාගය සිදුකරමින් ආසිරි ගන්වා ජනතා අයිතියට පත් කරන ලදි.

අප සැමගේම සිහිනයක් වූ දික්ඕවිට සුන්දර ග්‍රාමයේ දෙවිඳුන්ට මහිමය ගෙන දෙන තෝතැන්නක් වූ ශු. අන්තෝනි මුනිඳුන්ට කැප කළ නව දේවස්ථානය ඉදිකර 2014 වසරේ 06 මස 09 දිනට වසරක් සපිරුණි. වසරක් සපිරීම නිමිත්තෙන් පළමු ජුබිලි මංගල උත්සවය අති උත්කර්ෂවත්ව 2014 ජුනි ස 10 දින ගරු ෆීලික්ස් පියතුමන් හා නිහාල් පියතුමන් හා වියාන් පියතුමන්ගේ ද එකමුතුවෙන් දිව්‍ය පූජා යාගය සිදු කරමින් සැබෑ කිතුනු ජනතාවක් ලෙස එකට එක් වී දෙවිඳුන්ට හද පිරි තුති බැති පුද කරන ලදි.

## කොළඹ අගරදගුරු පදවි පැවිදි වසර හා පවුල් වසර (2014 - 2016 ) තුළ ඔබගේ දායකත්වය

කොළඹ අගරදගුරු පදවි පවුල් සේවාව තුළ දැනට ක්‍රියාත්මක වන හා ඉහත වසර මුල් කරගෙන විශේෂයෙන් සංවිධානය කරන්නට බලාපොරොත්තු වන වැඩසටහන් වලට යුවල් ලෙස හෝ තනි පුද්ගලයන් ලෙස පවුල් සේවාව මඟින් සිදුකරන සම්මුඛ පරීක්ෂණයකින් හා පුහුණුවකින් පසුව සම්පත් දායකයකු ලෙස පහත සඳහන් සේවාවන් වල නියැලීමට අවස්ථාව ඇත.

1. යුවල් වශයෙන් විවාහ අපේක්ෂක සමුළු සඳහා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)
2. යුවල් වශයෙන් විවාහ පෝෂණ වැඩසටහන් සඳහා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)
3. තනි පුද්ගලයන් වශයෙන් උපදේශනය සඳහා (මේ සඳහා (කතෝලික) පිළිගත් ආයතනයකින් උපදේශනය සම්බන්ධව සහතිකයක් ලබා සිටීම අවශ්‍ය වේ.)

පහත සඳහන් විස්තර සමඟ මීසම් සේවක පියතුමාගේ ලිපියක් සමඟින් දින 14 ඇතුළත ඔබේ ඉල්ලුම් පත පහත සඳහන් ලිපිනයට එවිය හැකිය. (නම / ලිපිනය / පවුලේ විස්තර / රැකියාව / අධ්‍යාපන හා වෘත්තිමය සුදුසුකම් / සේවාවේ යෙදීමට ඇති අවශ්‍යතාවය)

කොළඹ අගරදගුරු පවුල් සේවාව, (රාජපක්ෂ වලව්ව), තුඩැල්ල, ජා-ඇල. දු. අංක 0775 061699, 0779315339, 0727441442, 0112236457

# 2014 නත්තල් නව මුද්දර නිකුතුව

2014 නත්තල වෙනුවෙන් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය විසින්, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව නිකුත් කරනු ලබන නත්තල් තැපැල් මුද්දර යුගලය, මුල්දින කවරය සහ සිහිවටන පළකය ප්‍රථම දින නිකුත් කිරීමේ උත්සවය කොළඹ අගරදගුරු පදවිය මුල් කර ගනිමින් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්, අග්‍රාමාත්‍ය, තැපැල් අමාත්‍ය ඇතුළු මැති ඇමැතිවරුන්ගේ සහභාගිත්වයෙන් 2014 නොවැම්බර් මස 30 වන දින පෙ.ව. 10.30 ට මීගමුව, මහවීදිය සා. මරියා දෙව්මැඳුරේදී පැවැත්වීමට මේ වන විට සියලු විධි විධාන යොදා ඇත.

දිවයිනේ දහම් පාසල් දූ දරුවන්ගේ නිර්මාණාත්මක චිත්‍ර වලින් තෝරා ගනු ලැබූ නත්තල් තැපැල් මුද්දර යුගලය, නත්තල් පත වෙනුවෙන් ඒ ඒ වයස් කාණ්ඩ අනුව තෝරා ගනු ලැබූ ජයග්‍රාහකයින් වෙනුවෙන් ත්‍යාග පිරිනැමීමද මෙදින සිදු කරනු ලැබේ.

# ශු. බයිබලය පරපුරෙන් පරපුරට රැකගත යුතු ශුද්ධ ලියවිල්ලක්

## වාර්ෂික බයිබල් රැළියේදී කුරුණෑගල රදගුරු හිමිපාණෝ පවසති

"ශු. බයිබලය වටිනා පුස්තකාලයක්. එහි බොහෝ පොත් අඩංගු වී තිබෙනවා. නමුත් එය කියවීම පුහුණු කරන පුස්තකාලයක් නොවෙයි. මිනිසා විසින් සාදන ලද්දක් ද නොවෙයි. එය මිනිසාගේ සහය ඇතිව දේව අනුභාවයෙන් කරන ලද මුළු ජීවිතයටම රඳා පවතින පුස්තකාලයක්. අවසාන ඉලක්කයක් කරා යාමට මාර්ගය කියා දෙන ශු. ලියවිල්ලක්. පරම්පරාවෙන් පරම්පරාවට ආරක්ෂා කරන්නට තියෙන ආරක්ෂා කරගත යුතු ශු. ලියවිල්ලක්."

කුලියාපිටිය "සත්පහන" ශාලාවේදී පැවති වාර්ෂික බයිබල් රැළියේදී කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ එසේ පැවසූහ.

තවදුරටත් අදහස් දැක් වූ එතුමෝ වත්මන් සමාජය තුළ වැරදි ක්‍රියාවන් සඳහා යොමුවන දරුවන්ගේ සංඛ්‍යාව වැඩි බවත් දරුවන් දහමින් පෝෂණය කර ඔවුන් රැකගන්නට පදවිය තුළ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරෙන බවත් පැවසූහ. බයිබල් අපෝස්තලික සේවාව හා අනෙකුත් අපෝස්තලික සේවාවන් හා ගිහි - පූජක පැවදි සැවොම පදවියක් ලෙස එයට එක්වන්න යයිද ඇරියුම් කළහ.

බයිබල් තරගවලින් ජයග්‍රහණය ලැබූ දහම් පාසල් දරු දැරියන්ට තිළිණ හා සහතික පත් ප්‍රදානය ද මෙදින සිදුකෙරිණ. පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් ප්‍රනාන්දු පියතුමා ඇතුළු මීසම් සේවක පියවරු දහම් පාසල් දරුවන් සහ ගුරු භවතුන් මෙම අවස්ථාවට එක්ව සිටියහ. පදවි බයිබල් අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු උපුල් සිල්වා පියතුමා සමඟ පදවි කමිටුව විසින් මෙය සංවිධානය කරන ලදි.

**(කුලියාපිටියේ රීටා සේනානායක)**

## ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ වාර්ෂික පොත් අලෙවිය

2014 නොවැ. 27 සිට දෙසැ. 19 දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 3.30 දක්වා (සෙනසුරාදා, ඉරිදා සහ පෝය දින හැර) පැවැත්වේ. ඔබට අවශ්‍ය කතෝලික ආගමික පොත්, සඟරා ආදිය සිංහල / දෙමළ/ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලබා ගත හැකිය.

ඔබගේ දේවස්ථානයට, පාසලට මෙන්ම දහම් පාසල් වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අවශ්‍ය පොත් පත් අති විශේෂ වට්ටමක් සහිතව ලබා ගැනීමට මෙය කදිම අවස්ථාවකි.

කොළඹ, බොරැල්ල හන්දියේ සිට කොටා පාරේ (රාජගිරිය පෙදෙසට පැමිණෙන්න) 19, බැල්කම් පෙදෙස, "ලංකාරාම" කතෝලික රදගුරු සම්මේලන ගොඩනැගිල්ලේ පළමු මහලේ ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය පිහිටා ඇත. දු. අංක 011 2685459 අමතා වැඩි විස්තර දැන ගන්නා ලෙස ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා පවසා සිටී.

# මංගල ආසිරි !

ජා-ඇල දැලතුර මීසමේ සදීපා අනුරාධනී මෙනෙවිය ප්‍රදේශයේ බැතිමත් කතෝලික පවුලකින් පැවත එන මීසමේ ක්‍රියාකාරී සාමාජිකාවකි.

දේවස්ථානයේ ගායනා කණ්ඩායමේ වසර 13 ක් ද වසර 7 ක් දහම් ගුරුවරියක් ලෙසද කටයුතු කළ ඇය පසුගියදා දැලතුර ශා. රෝකුස් දේවස්ථානයේ දී යුග දිවියට පිවිසියාය. ඇයගේ අතගත් ඔහු පමුණුගම ජනක සම්පත් මහතා ය.

මීසමට අචල සේවාවක් ලබා දුන් ඇයගේ යුගදිවිය සාර්ථක වේවායි සමිඳු ආසිරි පතමු.

**එම්. ඒ. එම්. දම්මිකා පෙරේරා - දැලතුර**



## කොළඹ දකුණු කලාපීය දහම් ගුරු දිනය

2014 නොවැ. 29 සෙනසුරාදා සවස 1.30 සිට සවස 7.00 දක්වා අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සහ සියලුම කලාපීය පියවරුන්ගේ සහභාගිත්වයෙන් කොළඹ සා. පීතර දේවස්ථානයේ දී පැවැත්වේ.

මෙම ගුරු උපහාර දිනයට කොළඹ දකුණු කලාපයේ සියලුම දහම් ගුරුවරුන්ගේ සහභාගිත්වය අපේක්ෂා කරමු.

**(කලාප අධ්‍යක්ෂ පියතුමා සහ සංවිධායක කමිටුව)**

# අගරදගුරු පදවි කතෝලික තරුණ සංගමයේ ආදි සාමාජික හමුව - 2014

කොළඹ පදවියේ පවුල් හා පැවිදි වසර සනිටුහන් කරමින් හා කතෝලික තරුණ සංගමයට වසර 40 ක් සපිරීම නිමිත්තෙන් සංවිධානය කරන "ආදි සාමාජික හමුව" සඳහා 1973 සිට 2013 දක්වා සාමාජිකත්වය දැරූ (අවම වශයෙන් මාස 06 ක කාලයක්) සියළුම සාමාජික සාමාජිකයන්ට හා ඔවුන්ගේ දරුවන් හා සහකරුවා / සහකාරියට සෙනෙහසින් ආරාධනා කර සිටිමු.

- ★ දිනය - දෙසැ. 07 ඉරුදින
- ★ වේලාව - ප.ව. 3.00 සිට 6.00 දක්වා
- ★ ස්ථානය - නොයෙල් පෙරේරා අනුස්මරණ ශ්‍රවණාගාරය ප්‍රාථමික අංශය - සා. ජෝශප් විදුහල, මරදාන
- ★ ප්‍රධාන ආරාධිත - අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමි
- ★ මුඛ්‍ය දේශනය - කොළඹ පදවි පවුල් සේවා අධ්‍යක්ෂ ගරු ක්ලෝඩ් නෝනිස් පියතුමා
- ★ විශේෂ ආරාධිතයන් - වසර 40 ක් පුරාවට පදවි උපාධ්‍යවරුන් ලෙස සේවය කළ ගරු පියතුමන් හා තරුණ සංගමයෙන් බිහිවූ ගරු පූජක පැවිදි සැම.

විශේෂාංග -

- ★ වසර 40 ක ඉතිහාසය ශ්‍රව්‍ය-දෘශ්‍ය ඉදිරිපත් කිරීමකි
- ★ නත්තල් කැරොල් ගායනය
- ★ අත්දැකීම් බෙදාගැනීම (පූජක/පැවිදි/ගිහි සාමාජිකයන්)
- ★ හිටපු උපාධ්‍ය පියවරුන් ඇගයීම
- ★ පවුල් වසරේ දූත මෙහෙවරට සූදානම් වීම

**(ගරු ගිහාන් ගුණතිලක පියතුමා, ජාතික හා අගරදගුරු පදවි උපාධ්‍ය කතෝලික තරුණ අපෝස්තලික සේවාව)**

# සා. බෙනඩික් විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය දා



කොටහේන සා. බෙනඩික් විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය දා ආරාධිත අමුත්තන් පෙරටුකොට ගෙන විදුහල්පති ගරු ජානක ෆොන්සේකා සහෝදරතුමා ඇතුළු ඇදුරු මඩුල්ල පෙරහරින් පිළිගෙන කැඳවාගෙන ආ අයුරු... හිටපු විදුහල්පති ගරු ග්‍රැන්විල් සහෝදරතුමා ද පසෙක සිටී. **(ලෙනාඩ් හපුආරච්චි)**

කටුලන්ද මධු මාතා දෙව්මැඳුරේ පූජා උදව් සමිතියේ සහ ළමා ධර්මදූත සමාජයේ ක්‍රියාකාරී සාමාජිකයකු වූ පහල මඩම්පැල්ල විදුහලේ 11 වසර ඉගෙනුම ලැබූ 16 හැවිරිදි පාසල් සිසු "අචින්ත රුක්ෂාන්" පසුගියදා හදිසි අනතුරකින් ස්වර්ගස්ථ විය.

දෙව්මැඳුරේ මෙන්ම පාසලේ ද හොඳ හිත රැකගත් උද්යෝගිමත් සිසුවකු විය. ඔහුගේ අවසන් ආගමික කටයුතු මධු මාතා දෙව්මැඳුරේදී ගරු ලක්නාත් කුරේ පියතුමන් විසින් ප්‍රදේශයේ බැතිමතුන්ගේ සහ පාසල් සිසු දරු දැරියන්ගේ සහ ගුරුවර ගුරුවරියන්ගේ සෝ සුසුම් මැද මඩම්පැල්ල සුසාන භූමියේදී සිදුකරන ලදි. **(සේයා - එච්. ඒ කල්දේරා, සටහන - සුභාෂිණී මදුරාවල)**




# අපේ කතෝලිකකම කිසිදාක අමතක නොකළ යුතුයි

අප කුමන ආකාරයේ උසස් පදවියකට පත්වුවද අපේ කතෝලිකකම අප කිසිවිටෙක අමතක නොකළ යුතු යැයි ගරු ඇලෙක්සිස් බෙනඩික් පියතුමා පැවසීය.

පියතුමා ඒ බව සඳහන් කළේ කොළඹ 07 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ පිහිටි විපක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය විවෘත කිරීමේ උත්සවයේදීය.

එහිදී වැඩිදුරටත් කතා කළ පියතුමා මෙසේ ද පැවසීය.

"වෙනත් ආගමිකයින් හා සසඳා බලන කල මේ රටේ කතෝලික බැතිමතුන් සිටින්නේ සීමිත පිරිසක්. ඒ නිසා අප හැම විටම පොදු අවස්ථාවන්හිදී අපේ කතෝලිකකම ප්‍රදර්ශනය වන ආකාරයට කටයුතු කළ යුතුයි. ඒත් අපේ ඇතැම් කතෝලික මැතිඇමැතිවරුන් පොදු උත්සව වලදී තමන්ගේ කතෝලිකකම අමතක කරමින් කටයුතු කරන ආකාරය විද්‍යුත් මාධ්‍ය තුළින් අප දැක තිබෙනවා. එවැනි අවස්ථාවල කතෝලිකයන් හැටියට අපට ඇති වන්නේ මහත් කණගාටුවක්. ඒ අතින් බලන කල කතෝලික දේශපාලනඥයකු වන ජෝන් අමරතුංග මැතිතුමා තමන් සහභාගිවන සැම පොදු උත්සවයකදීම කතෝලිකකම රැකෙන අයුරින් ඉතාමත් ආදර්ශවත්ව කටයුතු කරන ආකාරය ප්‍රශංසනීයයි. එය අපේ අනිකුත් කතෝලික මැති ඇමැතිවරුන් ද ආදර්ශයට ගත යුතුයි.

මේ අවස්ථාවට බස්නාහිර පළාත් සභා හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල, හිටපු පළාත් සභා මන්ත්‍රී සිරිකමල් ද සිල්වා, වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වන මැල්කම් පෙරේරා, අනුර පතිනායක, රොයිස් ප්‍රනාන්දු සහ නිමල් පෙරේරා යන මහත්වරුද සහභාගි වූහ.



## B+ හෝ O+ වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි

මොරටුව කටුබැද්ද ප්‍රදේශයේ පදිංචි මයිකල් ප්‍රනාන්දු මහතා දරුණු වකුග ඩු රෝගයකින් පීඩා විඳින අතර ඔහු සුවපත් කිරීම සඳහා හැකි ඉක්මනින් වකුගඩුවක් බද්ධ කළ යුතු බවට කොළඹ මාලිගාවත්ත වකුගඩු ඒකකයේ විශේෂඥ වෛද්‍ය අනුර හේවාගීගන මහතා නිර්දේශ කර ඇත.



B+ හෝ O+ රුධිර වර්ගවල වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමති අයකු වේ නම් 072-2435859 අංකය වෙත අමතන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.



## ප්‍රදීපය
## මංගල යෝජනා
### මනාලයෝ

සිංහල, කතෝලික, "B.Com" උපාධිය හදාරා ඕස්ට්‍රේලියාවේ "පුරවැසි" එහි සාමාන්‍ය රැකියාවක නියුතු, 1976 ජූලි මස උපන් උස 6' 1", ලාබාල පෙනුම ඇති, කඩවසම, චරිතවත් පුතුට එහි යාමට කැමති, උගත්, යහපත්, රුවැති දියණියක දෙමව්පියෝ සොයති. e-mail: donmicheal45@yahoo.com අංක N4583, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

## මංගල යෝජනාත් වෙබ් අඩවියේ...

**"ඥානාර්ථ ප්‍රදීපය" හා "Messenger" පුවත්පත් වල පළවන මංගල යෝජනා ඔබගේ කැමැත්ත පරිදි www.colombocatholicpress.com වෙබ් අඩවියේ ද පල කළ හැකිය.**

**වැඩි විස්තර සඳහා දැන්වීම් අංශය විමසන්න.**



## ඔබගේ දුවට හෝ පුතාට සුදුසු
## කතෝලික සහකරුවකු හෝ සහකාරියක සඳහා

**මංගල යෝජනා දැන්වීමක් පළ කර ගැනීමට අවශ්‍ය නම් පහත උපදෙස් පිළිපදින්න.**

**ඔබගේ පුතුගේ හෝ දියණියගේ විස්තර මුද්‍රිත අකුරින් හෝ පැහැදිලි අත් අකුරින් ලියා හැකි ඉක්මනින් අප වෙත යොමු කරන්න.**

- ♥ මංගල යෝජනා දැන්වීම් සඳහා පළමු වචන 15 ට රු. 500/- ක මුදලක් වන අතර ඉන් පසුව වැඩිවන වචනයකට රු. 8.00 ක මුදලක් එකතු වේ.
- ♥ තැපැල් මගින් මංගල යෝජනා දැන්වීම එවන්නේ නම් දැන්වීම සමග ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් එවන්න.
- ♥ ඔබගේ දුරකථන අංකය පළකළ යුතු නම් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර අත්සන් කරන්න.
- ♥ දැන්වීම ෆැක්ස් මගින් අප වෙත එවන්නේ නම් දැන්වීම සඳහා වැය වන මුදල මරදාන **HNB** ශාඛාවේ ගිණුම් අංක 108010005037 ට ඔබගේ මුදල් බැර කරන්න. ඉන්පසු මුදල් බැර පත හා දැන්වීම අප ආයතනයට ෆැක්ස් කරන්න.
- ♥ දැන්වීම ෆැක්ස් කළ පසු එය අප ආයතනයට ලැබී ඇත්දැයි පරීක්ෂා කර දැන ගන්න.
- ♥ මංගල යෝජනා සඳහා පිළිතුරු එවීමේදී මංගල යෝජනා අංකය පැහැදිලිව සඳහන් කර කුඩා කවරයක (3 1/2' 6") එවන්න.

**ගරු අධ්‍යක්ෂ පියතුමා,**
**කොළඹ කතෝලික මුද්‍රණාලය, අංක 2,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**
**දු.ක. 2695984 / 2678106 / 011-4899611 ෆැක්ස් : 2692586**